

# ව්‍යාඛ්‍යා සහිත
# සීමාලක්ඛණ දීපනී.

# සංඥාපනය.

## ව්‍යාඛ්‍යා සහිත සීමාලක්ඛණ දීපනී.

සීමාලක්ඛණ දීපනී තොමෝ වනාහි වැලිතොට අඹගහපිටි මහා විහාරාධිපතිව වැඩවිසූ කවිකණ්ඨමුක්තාහාරොපමවූ අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලඞ්කාර මහා පණ්ඩිත භදන්ත විමලසාර තිස්සාභිධාන මහානායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් ලෝක ශාසනානුග්‍රහය සඳහා රචනාකරන ලද්දීය. මෙම මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්ම ශාසනවංසදීප නමැති පාළිභාෂාමය ගීබන්ධ මාහැඟි මහාකාව්‍යයද නිපදවන ලදසේක. ගරු සම්භාවනීය ප්‍රභාස්වර මහා ග්‍රන්ථ කර්තෘවරයෙක්වූ මේ මහා නායක ස්ථවිර පාදයන් වහන්සේ වනාහි ලෝක ශාසනානුග්‍රහයෙන් සුගතසාසනෝදය නමැති ශාස්ත්‍රශාලාව පිහිටුවාගැන්මෙන් බොහෝ ගෘහස්ථ ප්‍රව්‍රජිත කුලපුත්‍රයන්ට නිරවද්‍ය ශාස්ත්‍ර සහිත ආගම ධර්මය පුහුණුකරවමින් වැඩසිට ශ්‍රී බුද්ධ වර්ෂ (2434) දෙදහස් සාරසිය සූතිස්වර්ෂයෙහි ඇසළමස ශැටවක නම් තිථියලත් සඳුදිනැ ස්වර්ගස්ථවූසේක. යථෝක්ත විමලසාර තිස්සාභිධාන මහානායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් ප්‍රණීත බහුතර ග්‍රන්ථයන් අතුරෙන් සීමාලක්ඛණ දීපනී තොමෝ ශාසනාවචර ශ්‍රමණ කුලපුත්‍රයන්ගේ ප්‍රව්‍රජ්‍යෝපසම්පදාදි විනයකර්ම කිරීමෙහි ක්ෂෙත්‍රයවූ කර්ම භූ සීමාවන්ගේ සම්භෙදාසම්භෙද ලක්‍ෂණ ප්‍රකාශකරන්නී වේ.

සීමාලක්ඛණං දීපෙති, එතායාති සීමාලක්ඛණදීපනී යන නිර්වචනයෙන්ද ඒ මොනවට පැහැදිලි වේ. භික්ෂු සඞ්ඝයාගේ අධිශීල සඞ්ඛ්‍යාත උපසම්පත්තියද, සීමා සම්පත්තියෙන් තොරව නොපිහිටයි.

> න හොති භික්ඛුභාවො සො-උපසම්පත්තියා විනා-
> න හොති උපසම්පත්ති-සීමා සම්පත්තියා විනා-යි''

සීමාලඞ්කාර සඞ්ග්‍රහයෙහි එහෙයින් කියන ලදී.

අතිඛුද්දකාදි එකොළොස් විපත්ති දෝෂයන් විනිර්මුක්තව නිමිත්තසම්පත්‍යාදි ත්‍රිවිධ සම්පත්තියෙන් සමන්වාගමයයි කියන ලද සීමාවගේ ගුණොත්කෘෂ්ටභාවයට පැමිණීම, සීමාසම්පත්ති

නම් වෙයි. ගුණුක්කංසෙ විභවෙ-සම්පත්තියංචෙව සම්පදා - යනු, සම්පත්ති ශබ්දයේ නානාර්ථයි. පරිසපුග්ගලාදි ඉතිරි සම්පත් සතරින් එකක් නැතිකල්හිද, උපසම්පත්තිය නොවෙයි. එසේ කල උපසම්පත්තිය සීමාසම්පත්තියෙන් වෙන්ව නොවේයයි කුමක් හෙයින් සීමාසම්පත්තියම වෙන්කොට කිවූදයත්, එහි සීමා විභාගය දක්වන හෙයින් තැනට අනුරූපකොට ප්‍රශ්නාව වශයෙන් කියනලදැයි දතයුතු. තවද භික්ෂු සඞ්ඝයා උපසම්පදාදි විනයකර්ම කිරීමේදී අතිකුද්‍ර විසභාග සීමාවන් හා මිශ්‍රවීමෙන් කර්ම විපත්ති කර සීමාවන්ගේ ලක්‍ෂණ ප්‍රභෙද දැනගෙනම ඒ කර්ම විපත්ති කර සීමාවන් හැරපියා කර්මානුරූපවූ ඒ ඒ බද්ධාබද්ධ සීමාවල විනයකර්ම කටයුතුමය. මෙසේ හෙයින් සීමාවන්ගේ පරිඥනය සඳහා සීමාතය පරිදීපක සීමාලක්ඛණදීපනී නමැති විනය ග්‍රන්ථය රචනාකරන ලදී. මේ ප්‍රකරණය වනාහි කාණ්ඩත්‍රයකින් ලක්‍ෂණ කරන ලද්දේමය. ප්‍රථම කාණ්ඩයෙහි ප්‍රකීර්ණාරම්භයට අනතුරුව, උදකුක්ඛෙප සීමාවර්ණනාදි ලක්‍ෂණද, තදනන්තරව කර්මාභි විවිධවූ බද්ධාබද්ධ සීමාවන් දෙදෙනාගේ ප්‍රභෙද ලක්‍ෂණද, ඊලඟට අබද්ධ සීමාවන්ගේ පාළි මූලානුක සමෙභදාසමෙභද ලක්‍ෂණද, තදනන්තරව ඇතැම් තෙරවරුන්ගේ උදකුක්ඛෙප සීමාව නිසා හටගත් දුර්මතකීද, දෙශනානයින් ඔවුන් බැහැරලීමේ කථාද, උදකුක්ඛෙප සීමාව සඳහා අන්‍ය තෙරවරුන්ගේ වාදද, එසේම ඔවුන් බැහැරලීමේ කථාද ගම සම්බන්ධ හෙයගේ ගම බවද, උදකුක්ඛෙප සීමාවගේ ගම්කෙතට ප්‍රවිෂ්ට නොවීමද, ඈගේ අවකාශ ලද ලද පරිද්දෙන් හටගැන්මද, විසභාග සීමාවන් ඇතුල්කොට හටනොගැන්මදැයි යන මේ ආදිහුද, යලි, දෙවන කාණ්ඩයෙහි ප්‍රකෘති ග්‍රාමාදි පරිච්ඡෙදයෝද, පාළිමූලානුක විසුංගාම සීමාවෙහි පරිච්ඡෙද ලක්‍ෂණොපචාරයද, ඊට අනතුරුව ඇතැම් තෙරුන්ගේ වාදද, අන්‍ය කථාදි නයින් ඔවුන්ගේ විනිශ්චයදැයි යන මේ ආදිහුද, තදනන්තරව තෘතීය කාණ්ඩයෙහි, පෙළ අටුවාදියෙහි ආ ක්‍රමයෙන් සීමා සම්මත ක්‍රමයද, අතිසංක්‍ෂෙපයෙන් ශීල සමාධි ප්‍රඥාවන්ගේ දැක්වීම්ද, අනතුරුව, ගාථා බන්ධන වශයෙන් ග්‍රන්ථපරිසමාප්තියද, ප්‍රකාශ වන්නාහ,

මෙසේ දක්වන ලද කරුණු ගණීකොට කාණ්ඩත්‍රයකින් සමුපලක්‍ෂිතවූ සීමාලක්ඛණදීපනී නමැති විනය ග්‍රන්ථය පාළි භාෂාවෙන් රචනාකරන ලද්දක් බැවින් මාගධ භාෂාව නොදත් යතීන්ගේ සීමාලක්‍ෂණ විජානනය හා ජනවර්ශානනාභිවෘද්ධිය

පිණිසද, යනාදි කරුණු සඳහා මෙම සීමාලක්ඛණ දීපනී නම් ප්‍රකරණයට සන්නයක් කළහොත් එය ඉතා මැනවැයි කියා අස්මද්හිතෛෂි තාහෂව් සමරසිංහ මන්ත්‍රින්ද්‍රරාමාධිපති ගෞරවනීය කහවේ ඤාණතිස්ස මහාස්ථවිරයන් වහන්සේ විසින් සමාරාධිතවූ මා විසින්, මේ ප්‍රකරණයට යථා ශක්තීන් පදගතාර්ථ සන්නයක් කරන ලදී. මේ ලියනලද සම්පූර්ණ ව්‍යාඛ්‍යානය මුදල් ආදියෙන් දුෂ්කරකම් ඇතිවූ කාලයක් නිසාද, තවත් නොයෙක් සම්බාධ ඇතිවූ බැවින්ද, සම්පූර්ණයෙන් මුද්‍රණය කරවීමට නොහැකි විය. එබැවින් දැනට මුද්‍රණයකර තිබෙන ප්‍රථම කාණ්ඩය මේවර ප්‍රචාරයට පමුණුවන්ට අදහස් කළ බවද, අතිරික්ත කාණ්ඩය යථා කාලයෙහි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන බවද, සැලකිය යුතුයි

තවද මේ ව්‍යාඛ්‍යානයෙහි ඇතැම් තැන සව්‍යාසභාවාර්ථයද යොදා ඇත. වැලිදු, මේ ව්‍යාඛ්‍යානයෙහි ඒ ඒ තැන සංසීන අශුද්ධ පාඨ හා ඌනාධිකාර්ථයන්ද ශුද්ධිපත්‍රයේ යොදා ඇත. මේ ඇර, මදීය ශිෂ්‍යවූ සීනිගම කවිධජ තිස්ස තැන මෙහි ප්‍රාප්ත ස්ථානයෙහි න්‍යූනාතිරික්ත පදාර්ථයන් සමීක්ෂායෙන් උද්‍යොගීව ක්‍රියා කළ බැව්ද දන්වමු තවද කහවේ ඒ. බී. ඩී. සිල්වා වෙළෙඳ මහතා විසින් තවත් සැදැහැවතුන්ගේ ආධාරත් ඇතිව නොමිලයේ ධර්මදාන වශයෙන් පරිත්‍යාග කිරීම පිණිස කොළඹ විද්‍යාසාගර යන්ත්‍රාලයේ මුද්‍රණය කරවන ලදී. තැවතද මේ සද්ග්‍රන්ථයෙහි අපගේ ප්‍රමාදභ්‍රමාදියෙන්ද අක්ෂර යොජකයන්ගෙන්ද සිද්ධවීයයි හැඟෙන්නාවූ යම් අර්ථ විපරීත අක්ෂර විපරීතාදි දෝෂ ඇතද, ඔවුන් අපේ මේ පරිශ්‍රමය සලකාද ලෝකශාසනානුග්‍රහය පිණිසද පණ්ඩිතයෝ ශුද්ධකරත්වා.

මීට–

ජී. විමලබුද්ධි තිස්ස අනුනායක ස්ථවිර.

# ආධාර දායක මණ්ඩලය.

| | රු. | ශ. |
|---|---|---|
| ඇම්. ටී. ද ඇස්. අමරසේකර අභිනීතිඥ මයා | 25 | 00 |
| ඩබ්ලිව්. ජී. ද සිල්වා නීතිඥ මයා | 5 | 00 |
| සී. ආර්. ද සිල්වා නීතිඥ මයා | 2 | 50 |
| ආර්. පියදාස නීතිඥ මයා | 5 | 00 |
| ඇන්. ජී. ද ඇස්. වික්‍රමනායක දෙස්තර මයා | 5 | 00 |
| ඒ. ද සිල්වා දෙස්තර මයා | 2 | 50 |
| ඇන්. පී. ද සිල්වා පාඨශාලාචාර්ය මයා | 5 | 00 |
| ඇල්බට් මිරැන්ඩා මයා | 5 | 00 |
| ඇස්. ඩී. ඇස්. වීරසිංහ මයා | 10 | 00 |
| ජේ. ඩී ඇස්. රූපසිංහ මයා | 4 | 50 |
| ජී. උමාරිස්ද සිල්වා මුදලාලි මයා | 15 | 00 |
| ඇන්. එමානියෙල් ද සිල්වා මුදලාලි මයා | 10 | 00 |
| පී, ඇස්. ඩී. සිල්වා මුදලාලි මයා | 9 | 00 |
| ඔන්ද්‍රිස් ද සිල්වා මුදලාලි මයා | 2 | 00 |
| මෝසිසියෙස් ද සිල්වා අමරතුඞ්ග පොලිස් මයා | 10 | 00 |
| පොඩිසිඤ්ඤෝ රුද්‍රිගෝ වෙද මයා | 3 | 00 |
| ටී. හර්මානිස් ද සොයිසා මුදලාලි මයා | 2 | 50 |
| ජී. බී. ඩී සිල්වා වෙළඳ මයා | 12 | 00 |
| ඇම්. දයනේරිස් ද සිල්වා මුදලාලි මයා | 10 | 00 |
| ගරුමුනි ජේම්ස් ද සිල්වා මුදලාලි මයා | 1) | 00 |
| ඇල්. සර්දියෙල් ද සිල්වා මුදලාලි මයා | 10 | 00 |
| ජී. ආර්ලිස් ද සිල්වා මයා | 5 | 00 |
| ඇම්. පව්ලිස් ද සොයිසා මයා | 5 | 00 |
| ඇල්, පැලිස් ද සිල්වා පාඨශාලාචාර්ය මයා | 5 | 00 |
| වයි. සාමොන් ද සිල්වා මයා | 10 | 00 |
| අගෝරිස් ද සිල්වා මයා | 5 | 00 |

| | රු. | ශ. |
|---|---|---|
| ජෝසොප් ද සිල්වා මයා | 10 | 00 |
| සමාරිස් ද සිල්වා මයා | 4 | 00 |
| ඇම්. ආරොම් මිරන්ද මයා | 5 | 00 |
| එච්. බස්තියන් ද සිල්වා මුදලාලි මයා | 5 | 00 |
| ඒ. හර්මානිස් ද සිල්වා මයා | 5 | 00 |
| ගුණේරිස් ද සිල්වා මයා | 3 | 00 |
| එච්. ඇම්. ඩී. සිල්වා මයා | 5 | 00 |
| ඒ ඇල්බරෙක් ද සිල්වා මයා | 2 | 50 |
| එච්. ගිරෝනිස් ද සිල්වා මයා | 5 | 00 |
| කේ. ඒදරෙක් ද සිල්වා මයා | 5 | 00 |
| ඇල්. පීරිස් ද සිල්වා මයා | 3 | 00 |
| පී. සැල්ඩින් සිල්වා මයා | 2 | 00 |
| ඇල්. ජස්ටින් සිල්වා මයා | 5 | 00 |
| කුගින් සිඤ්ඤෝ ද සිල්වා මයා | 2 | 00 |
| ඇමැන්ඩන් ඔපිසර් (ආරච්චි) හාමිනේ | 3 | 00 |
| පී. ඩී. ඩී. සිල්වා හාමිනේ | 10 | 00 |
| පී. ලෙයිනෝරිස් ද සිල්වා ආරච්චි හාමිනේ | 4 | 00 |
| තෙල්ලිගොඩ සමිතියක් සම්බන්ධයෙන් | 3 | 70 |
| ඔන්දෝරිස් සිල්වා මුදලාලි [illegible] | 2 | 00 |

# ශුද්ධි පත්‍රය.

## "ව්‍යාඛ්‍යාවේ".

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 24 | | |
| 10 | 12 | ප්‍රකටයි | ප්‍රකටමැයි |
| 10 | 14 | වුත්තො කියන ලද, අත්ථො එව අර්ථයම යනුද, වුත්තමත්ථො යන මෙහි, වුත්තො -අත්ථොයි, විසන්ධි වේ යනුද අශුද්ධ ලිපියකි. වුත්තමත්ථොව, කියනලද ප්‍රමාණයම. | |
| 10 | 23 | ප්‍රකෘති රළ | ප්‍රකෘති තරඟයෝ |
| 10 | 23 | රශ්මි | පසුබැස |
| 12 | 10 | හාත්පසින්ය | හාත්පසින් |
| 14 | 3 | පෞෂ්ඨයද | පෞෂ්ඨයෝද |
| 23 | 3 | මසුන් බඳින්නන්ට | මිසුන් බඳින්නන් විසින් |
| 23 | 4 | යානොහැකි මාගීවූ | යානොහැකි මාගීවලහෝ |
| 23 | 29 | | ලද්දීද ඇගේ |
| 26 | 2 | බඳින්නන්ට | බඳින්නන් විසින් |
| 26 | 3 | මාගීයවූ | මාගීද |
| 26 | 4 | අමනුෂ්‍යාවාසවූ | අමනුෂ්‍යාවාසද |
| 28 | 22 | සම්භාවවීමයි | සම්බවීමයි |
| 30 | 11 | උදකසාටිකං, දියසළුව; නිවාසෙත්වාපි, හැඳ ගෙන; අඤ්ඤා නදියං යෙව, ඇතුල් නදියෙහිම; කම්මං කාතබ්බං, කම්නුවටයුතුයි; සචෙ පන, ඉදින් වනාහි; නසක්කොන්ති නොහැකි වෙද්ද; නාවාය අපි, නැවෙහිද; ඨත්වා, සිට; කම්මං කාතබ්බං, කම් කටයුතුයි; උභතොඨීයි. | |
| 30 | 21 | | හොති උභතයි |
| 32 | 8 | වාචවාදිනා | වාචවාදිනාව |
| 33 | 5 | රහොව | රහභාවොව |
| 35 | 21 | බැවින් | බැවින්ද |
| 36 | 25 | | තෙන එව අඩුයි |
| 36 | 25 | එහෙයින් | එහෙයින්ම |
| 37 | 23 | පඨමො | පඨම |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 38 | 19 | උපදින්නී නම් | උපදින්නෝ නම් |
| 38 | 21 | | නසමා අධිකයි |
| 39 | 2 | ගාම | ගාමෙක |
| 40 | 5 | පතිට්ඨිතා | පතිට්ඨිත |
| 42 | 8 | පිහිටාගැන්මයි | කල්පනාකිරීමයි |
| 43 | 16 | නවට්ටති-ඉති එව | නවට්ටතීති-ඉච්චෙව |
| 43 | 16 | නොවටීමය යනු, | නවට්ටතීති නොවටීනයි කියා ඉච්චෙවං, මෙසේ, |
| 46 | 15 | ඉවුරම | පිටඉවුරම |
| 46 | 23 | රුකශේය | රුකසම්බන්ධව සිටීම වටියි |
| 47 | 1 | සොධෙත්වාති | සොධෙත්වා වාති |
| | | තෙතෙව, එහෙයින්ම; ඌනතාවයි. | |
| 47 | 22 | කටයුතුයි | කටයුතුද |
| 48 | 5 | අත්තොහරි | අත්තොහැරේ |
| 51 | 1 | විය | වියපි |
| 51 | 2 | දිස්සන්ති | දිස්සන්ති |
| 52 | 1 | විසභාග සීමාය | විසභාගාය සීමාය |
| 52 | 4 | ප්‍රවිෂ්ටවූවන් | ප්‍රවිෂ්ටවූ වස්තූන් |
| 53 | 2 | තවමම | තවම |
| 61 | 3 | පපඤ්චෙති | පපඤ්චෙන්ති |
| 63 | 5 | වටීය | වටීද |
| 64 | 11 | බැවින්ද | බැවින්ම |
| 74 | 1 | කතළුවි, කිසිතැනෙක්හි, ඌනයි. | |
| 76 | 1 | නදියෙහි | නදිය හා |
| 76 | 19 | යු ප්‍රත්‍ය | යු ප්‍රත්‍යය |
| 77 | 21 | කාතබ්බා | කාතබ්බා |
| 78 | 9 | වැනි | වෙනි |
| 78 | 24 | වනාහි | නම් |
| 78 | 26 | සීමාවෝද | සීමාවත් |
| 79 | 1 | කරනලදහ | කළාහ. |

## "පාළියෙහි".

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 7 | 5 | සීපපනතියා | සීමූපපන්තියා |
| 8 | 5 | බජ්ඣියතීති | බජ්ඣීයන්තීති |
| 10 | 9 | වුත්තම්මතෙවාව | වුත්තාම්මෙතාව |
| 38 | 2 | කාතු | කාතුං |
| 46 | 4 | සභාගතතාතා | සභාගතාතා |
| 52 | 10 | ව්‍යවච්ඡච්ඡෙද | ව්‍යවච්ඡෙද |
| 72 | 4 | ධාරෙන්තති | ධාරෙන්තති. |

ව්‍යාඛ්‍යා සහිත

# සීමාලක්ඛණදීපනී.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

පත්වා විජිතපල්ලඞ්ක-පුබ්බසෙලං සුනිම්මලං,
යො ධම්මභාය සම්බුජ්ඣි-විනෙය්‍යනලිනෙ භුසං.

වන්දිත්වා තමහං බුද්ධ-භානුමච්චන්තභාසුරං,
හතමොහතමං වට්ට-පඞ්කරුසිං විසොසිතං.

අරියවංසාලඞ්කාර-නාමෙන ගුණසාලිනා,
විමලසාරතිස්සාති-පාකටෙන ගණෙසිනා.

යා කතා ථෙරපාදෙන-සීමාලක්ඛණදීපනී,
තස්සාපි වණ්ණයිස්සාමි-ව්‍යාක්ඛ්‍යං සීහළභාසතො.

සබ්බකම්මාරහාසීමා-විසුද්ධත්ථං ඉධ තාදිනො,
භික්ඛූනඤ්ච පයුත්තානං-පාළිභාසාවජානතං.

තස්මා බද්ධඅබද්ධානං-සීමානන්තු යථාක්කමං,
ඤත්වාව පටිපජ්ජන්තු-තාසු සීමාසු සබ්බථා.

ග්‍රන්ථාරම්භයෙහි ඉෂ්ටදෙවතානුස්මරණය තමන් ප්‍රාරබ්ධග්‍රන්ථයාගේ අවිඝ්නපරිසමාප්තිය පිණිස යම් හෙයකින් පවතී ද, එසේ පැවැත්මෙන් ශ්‍රොතෘජනයාගේ ඓහලෞකිකපාරලෞකිකාර්ථ සිද්ධිය සුවසේ කරවනු පිණිස ද ප්‍රකරණාරම්භයෙහි පළමු කොට බුදුන් සිත්හි කොට භාග්‍යවතුන්වහන්සේගේ අනන්තාපරියන්ත ගුණ ඇතත් ග්‍රන්ථොචිතගුණයෙන් ස්තොත්‍ර කොට ඉෂ්ටදෙවතානුස්මරණය දක්වනු කැමැති වූ භදන්තාචාර්‍ය්‍යවිමලසාරතිස්සාභිධාන මහානායකස්ථවිරස්වාමිපාදයෝ "සම්බොධොදයසම්භූතං" යනාදි ගය කීහු.

**1. සම්බෝධොදයසම්භූතං-සම්බුද්ධභානුමනුස්සරං,**
**සද්ධම්මරංසිසම්ඵුල්ලා-රියසඞ්ඝම්බුජාකරං.**

**2. උදකුක්ඛෙපසීමාය-ආහච්චපදනිස්සයං,**
**ලක්ඛණඤ්ච විසුංගාම-සීමාය රසනිස්සයං.**

---

1. සම්බෝධි, සම්‍යක් සම්බෝධි නමැති; උදය, උදයපර්වතයෙහි; සම්භූතං, පහළවූ; සද්ධම්මරංසි, සද්ධර්ම නමැති රශ්මියෙන්; සම්ඵුල්ල, විකසිතවූ; අරියසඞ්ඝ, අෂ්ටාර්‍ය පුද්ගල සඞ්ඝනමැති; අම්බුජාකරං, පද්මාකර ඇති; සම්බුද්ධභානුං, සර්වඥ නමැති සූර්‍යයා; අනුස්සරං, සිහිකරමින්; (මෙහි "භානු" ශබ්ද සූර්‍ය පර්‍යාය වෙයි. "බුද්ධභානුන්ති, සබ්බඤ්ඤුසඞ්ඛාතං සුරියං" යි නිර්දිෂ්ටයි.) මෙහි "සම්බෝධොදය" යන තන්හි "සම්බෝධ-උදය" යි ද විසන්ධි වෙයි"

"බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණං-අථවා සම්බුජ්ඣතීති සම්බොධි, උදෙන්ති එත්ථ චන්දිමසූරියාදයො පාතුභවන්තීති උදයො, සම්බොධි එව උදයො සම්බොධොදයො, තස්මිං සම්භූතො සම්බොධොදයසම්භූතො, තං සම්බොධොදයසම්භූතං" යනු ද "සම්බුද්ධො එව භානු-සම්බුද්ධභානු අථවා භානු විය භානු,-සම්බුද්ධො ච සො භානු චාති සම්බුද්ධභානු, තං සම්බුද්ධභානුං" යනු ද "සතං සප්පුරිසානං අරියපුග්ගලානං ධම්මොති-සද්ධම්මො, රස්සතීති- රංසි සද්ධම්මො එව රංසි-සද්ධම්මරංසි,-අථවා රංසි ඉව රංසි, සද්ධම්මො ච සො රංසි චාති-සද්ධම්මරංසි, තෙහි සම්ඵුල්ලො සද්ධම්මරංසිසම්ඵුල්ලො., කිලෙසෙහි ආරකාති අරියො, සමග්ගං කම්මං උපගච්ඡතීති-සඞ්ඝො, අරියො ච සො සඞ්ඝො චාති අරියසඞ්ඝො, අම්බුජානං ආකරො අම්බුජාකරො, අරියසඞ්ඝො එව අම්බුජාකරො අරියසඞ්ඝම්බුජාකරො, සද්ධම්මරංසිසම්ඵුල්ලො අරියසඞ්ඝම්බුජාකරො එතස්සාති සද්ධම්මරංසිසම්ඵුල්ලාරියසඞ්ඝම්බුජාකරො, තං සද්ධම්මරංසිසම්ඵුල්ලාරියසඞ්ඝම්බුජාකරං." යනු ද වාක්‍යයි.

දැන් තමන්ගේ ප්‍රකරණයට නිශ්‍රය හා කරණප්‍රකාර ප්‍රයොජනයන් දක්වනු සඳහා "උදකුක්ඛෙපසීමාය" යනාදීන් දක්වත්.

2. ආහච්චපදනිස්සයං, ආහච්චපද සඞ්ඛ්‍යාත සූත්‍රය ඇසුරු කොට; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමායෙහි; ලක්ඛණඤ්ච, (අතිකුඩු සීමාවන් හා සම්භෙදාසම්භෙද) ලක්ෂණය ද; රසනිස්සයං, සූත්‍රානුලොමය ඇසුරු කොට; විසුංගාමසීමාය, විසුංගාමසීමායෙහි; ලක්ඛණඤ්ච, ලක්ෂණය ද; (මෙහි ආහච්චපදනම්:-)

"එත්ථ හි ආහච්චපදන්ති සුත්තං අධිප්පෙතං. සුත්තං නාම සකලවිනයපිටකෙ පාළි" යනු ද "භගවතා භාණිතාදිවණ්ණුප්පත්ති

**3\. සීමාසම්මන්නනාකාරං-පකාසෙන්තො යථාගතං,**
**සාසනත්ථාය වක්ඛාමි-සීමාලක්ඛණදීපනිං.**

**4\. සීමානයපරිදීපා-විවිධා ගන්ථා චිරන්තනෙහි කතා,**
**අරියා නො තෙ ධීරා-සබ්බඤ්ඤූ තෙ න චෙවාහුං.**

**5\. තෙනෙව හි අවිනිච්ඡය-ගීතිවිසමතා කථා බහුවිධාපි,**
**දිස්සන්ති තෙසු තෙසං-තස්මා සුත්තං පමාණමිහ මුනිනො.**

---

ඨාතං ආහච්ච විසෙසෙත්වා භාසිතං පදං ආහච්චපදං, භගවතො යෙව වචනං. තෙනාහ:-ආහච්චපදන්ති සුත්තං අධිප්පෙතන්ති" යනු ද, "රසොති, සුත්තානුලොමං" යනු ද විවෘතියි. "ගම්‍යමානත්ථස්ස සද්දස්ස පයොගං පති කාමාචාරා" යනු න්‍යාය හෙයින් "දසසිස්ස මනාකුලං" යනාදි තන්හි මෙන් මේ අධිකාරයෙහි දු "කත්වා" යනු ගම්‍යමානාර්ථ හෙයින් අප්‍රයොගයි.

3\. සීමාසම්මන්නනාකාරං, සීමාසම්මතක්‍රමය ද; පකාසෙන්තො, ප්‍රකාශ කරන්නාවූ මම; යථාගතං, (සීමානයපරිදීපකග්‍රන්ථවල) ආවාවූ පරිද්දෙන්; සාසනත්ථාය, ශාසනයාගේ අභිවෘද්ධිය සඳහා; සීමාලක්ඛණදීපනිං, සීමාලක්ඛණදීපනී නම් ප්‍රකරණය; වක්ඛාමි, කියන්නෙමි; (සීමාලක්ෂණයන් ප්‍රකාශ කොට කරණ ලද ප්‍රකරණය සීමාලක්ඛණදීපනී නම.) "සීමාලක්ඛණං දීපෙති එතායාති සීමාලක්ඛණදීපනී" යනු වාක්‍යයි.

මෙහි "උදකුක්ඛෙපසීමාය" යනාදියෙන් නිශ්‍රය ද "යථාගතං" යන්නෙන් කරණප්‍රකාරය ද "සාසනත්ථාය" යන්නෙන් ප්‍රයොජනය ද සන්දර්ශිතයි

4 චිරන්තනෙහි, පුරාතනාචාර්‍ය්‍ය කෙනෙකුන් විසින්; සීමානයපරිදීපා, සීමාවන්ගේ ක්‍රම ප්‍රකාශකරන්නා වූ; විවිධා, (එකිනෙකට වෙනස් වූ හෝ) ප්‍රකාර ඇති; ("විභින්නා විරුද්ධා වා විධාපකාරා යෙසං තෙ විවිධා") ගන්ථා, ග්‍රන්ථ කෙනෙක්; කතා, කරණ ලද්දාහු වෙත් ද; තෙ ධීරා, ඒ ප්‍රාඥයෝ; අරියා නො, ආර්‍ය්‍යයෝ නො වූ හ; තෙ, ඔව්හු; සබ්බඤ්ඤූ ච නෙව ආහුං, සියල්ල දන්නෝ ද නො ම වූහ; (යනු එක් අර්ථපක්ෂයෙකි. අනික් අර්ථපක්ෂය මෙහි වෘත්තය ප්‍රකාශ කෙරෙයි.)

5\. තෙසං, ඒ චිරන්තනාචාර්‍ය්‍යවරයන්ගේ; තෙසු, ඒ සීමානය ප්‍රකාශක ග්‍රන්ථයන්හි; තෙනෙව හි, ඒ අසර්වඥත්වාදි හෙතුවින් ම, අවිනිච්ඡය, විනිශ්චයක් නැත්තාවූ; ගීතිවිසමතා, ගීතියෙන් විසම බැව් ඇත්තාවූ; බහුවිධා කථා අපි, බොහෝ ප්‍රකාර වූ කථාවෝ ද; දිස්සන්ති, දක්නා ලැබෙත්; තස්මා එහෙයින්; මුනිනො, බුදු

**6. මුනිනා දෙසිතමෙතං– උපගීතිරසො ච සද්ධෙය්‍යා,**
**සරණගතා ච මයම්පන–සුගතං ධම්මං අරියසඞ්ඝං.**

**7. තෙනෙත්ථ පාවචනමෙව කරිත්ව සීසං**
**ගන්ථෙහි චාපි විවිධෙහි චිරන්තනානං,**
**තං තං නයං මධුරසාරරසානුයාතං**
**සඞ්ගය්හ ධම්මගරුකෙහි විභාවනීයං.**

**8. කෙසඤ්චි වාදමපි එත්ථ සනන්තනානං**
**වාදං තථා විවිධමාධුනිකානමඤ්ඤං,**
**තත්ථාපි සාරමිතරං පරිවජ්ජනීයං**
**අඤ්ඤොඤ්ඤබාධං පරිමිතත්ථවසා කරිස්සං.**

---

රජතන් වහන්සේගේ; සුතතං, සූත්‍රය; ඉහ, මෙහි; පමාණං, ප්‍රමාණවේ; (එකිනෙකවිරුද්ධකථා පොත්හි පෙනෙන හෙයින් මේ කථාවෙහි බුද්ධවචනය ප්‍රමාණය යනුයි.)

6. එතං, මේ සූත්‍රය; මුනිනා, බුදුන් විසින්; දෙසිතං, දෙසන ලදී, උපගීතිරසො ච, උපගීතිරසසඞ්ඛ්‍යාත සූත්‍රානුලොමය ද; ("උපගායතං–උපගීති–උපගීති යෙව රසො–උපගීතිරසො") සද්ධෙය්‍යා, ඇදහියයුතුය; ("සද්ධාතබ්බො–සද්ධෙය්‍යො") (කුමක් හෙයින්ද? යත්) පන, යම්හෙයකින්; "පන" ශබ්ද "හි" ශබ්දාර්ථයි. ("පනසද්දො හිසද්දත්ථො") මයං, අපි; සුගතං ධම්මං අරියසඞ්ඝං, බුදුන් දහම් ආර්‍ය්‍යසඞ්ඝයා; සරණගතා එව, ශරණ ගියෝ ම වෙමු ද? (එහෙයිනි.) (බුද්ධවචනයට අවිරුද්ධ යයි කියන ලද සූත්‍රානුලොමය ද ගතයුතුය යනු භාවයි. "උපගීතිරසො ච" යන්නෙහි අනුක්තසමුච්චයාර්ථ වූ "ච" ශබ්දයෙන් සූත්‍රාවිරුද්ධ ආචාර්‍ය්‍යවාද දදිය ගන්නට අවකාශ තබා තදනන්තර ව "තෙනෙත්ථ පාවචනමෙව කරිත්වා සීසං" යනාදිය කීහු )

7. තෙන, එහෙයින්; එත්ථ; මෙහි; පාවචනං එව, බුද්ධවචනය ම; ("පධානං වචනං–පාවචනං") සීසං කරිත්වා, මුල් කොට; (ප්‍රධාන කොට යන අර්ථයි.) චිරන්තනානං, පුරාණාචාර්‍ය්‍යයන්ගේ; විවිධෙහි, නොයෙක් ප්‍රකාරවූ, ගන්ථෙහි ච අපි, ග්‍රන්ථවලින් ද; මධුරසාරරසානුයාතං, මධුරවූ සාරවත් සූත්‍රානුලොමය අනු ව ගියාවූ; ධම්මගරුකෙහි, ධර්මය ගරු කොට සලකන්නවුන් විසින්; විභාවනීයං, සම්භාවනය කටයුතු වූ; තං තං නයං, ඒ ඒ සීමාක්‍රම; සඞ්ගය්හ, කැටි කොට ගෙණ.

8. සනන්තනානං, පුරාණාචාර්‍ය්‍යවූ; කෙසඤ්චි, කිසිකෙනෙකුන්ගේ; වාදං අපි, වාද ද; තථා, එසේම; ආධුනිකානං, ආධුනිකාචාර්‍ය්‍යයන්ගේ; අඤ්ඤං, අන්‍ය වූ; විවිධං වාදං අපි, එකිනෙකට

9. යො චෙත්ථ ලොකියමනුබ්භවවිබ්භමාදි
දොසො භවෙය්‍ය යදි සො පරිවජ්ජනීයො,
කො වා කදාචි කවයොපි පුථුජ්ජනා සෙ
සම්මොහතං නපි භජන්ති චිරානුවත්තිං.

10. තස්මා හි සාධුචරිතං අනු සික්ඛමානා
සන්තො සදත්ථපසුතාව පරත්ථචාරී,
යෙ එත්ථ පණ්ඩිතජනා පුථු බාලභාවා
තෙ මෙ පහොන්ති බලු නිග්ගහපග්ගහත්ථං.

---

චෙතස් වූ වාද ද; තත්ථ, ඒවාදයන්හි; පරිවජ්ජනීයං, බැහැර කට යුතු අර්ත්ථය (හැර); ඉතරං, අනිකු දූ; සාරං, සාරාර්ත්ථය ද; පරිමිතත්ථ වසා, මීට ප්‍රමාණාර්ත්ථවශයෙන්; එත්ථ, මෙහි; අන්තොගධං කරිස්සං, ඇතුළත් කරන්නෙමි; (“අධුනා භවා ආධුනිකා” ප්‍රත්‍යයන් තමන් නානාර්ත්ථ බැවින් සම්භවාර්ත්ථයෙහි “ණික” ප්‍රත්‍යය වූ තැනි. “පරිවජ්ජෙතබ්බං පරිවජ්ජනීයං”- “පරිවජ්ජනීයං” යන ද්විතීයාන්තයා සමග හරණාර්ත්ථවාචක “හිත්වා” යනු අධ්‍යයොග කටයුතු.)

9. **එත්ථ**, මේ ප්‍රකරණයෙහි; ලොකියමනුබ්භවවිබ්භමාදි, පෘථග්ජනභාවයෙන් හටගත් විභ්‍රමාදි වූ; යො දොසො, යම් දෙෂයෙක් තෙම; “(දූසෙති පරං විනාසෙතීති - දොසො”) භවෙය්‍ය, වන්නේ ද? යදි, ඉදින්; සො, ඒ දෙෂයතෙම; පරිවජ්ජනීයො, දුරුකටයුතුය; පුථුජ්ජනා සෙ, පුහුදුන්වූ; කො වා කවයො අපි, කිනම් පණ්ඩිත කෙනෙකු ත්; කදාචි, කිසිකලෙක ත්; චිරානුවත්තිං, චිරානුවර්ත්ති වූ; සම්මෝහතං, මූඪත්වය; නපි භජන්ති, භජනය නො කෙරෙත් ද?; (කෙරෙත්මැයි සේයි.) (“පුථුජ්ජනා සෙ” යන මෙහි “සෙ” කාරය වනාහි නිපාතයකැයි අර්ත්ථකථාචාරීහු වර්ණනා කෙරෙත්. ප්‍රථමාබහුවචනය සම්බන්ධ ව ම “ස”කාරාගමය ශබ්දලක්ෂණයෙහි දක්ෂ වූවෝ කැමති වෙත්. “අට්ඨකථාචරියා පන සෙති නිපාතොති වණ්ණයන්ති, පච්චත්තබහුවචනස්ස හි සකාරාගමං ඉච්ඡන්ති සද්දලක්ඛණකොවිදා.” යනු අටුවායි.)

10. තස්මා හි, එහෙයින් ම; සාධුචරිතං, සත්පුරුෂචරිත යට; අනුසික්ඛමානා, අනු ව හික්මෙන්නාවූ; සන්තො, සත්පුරුෂවූ; සදත්ථපසුතා, ස්වාර්ත්ථයෙහි යෙදුනා වූ; පරත්ථචාරී එව, පරාර්ත්ථයෙහි හැසිරෙන්නා වූ ම; බාලභාවා පුථු, බාලභාවයෙන් වෙන් වූ, (“පුථු” යනු වර්ජනාර්ත්ථයෙහි අව්‍යයෙකි.) යෙ පණ්ඩිතජනා, යම් පණ්ඩිතජනකෙනෙක් ඇද් ද?; තෙ ඉමෙ, ඒ මේ පණ්ඩිතයෝ; එත්ථ, මෙහි; නිග්ගහපග්ගහත්ථං, නිග්‍රහප්‍රග්‍රහයට; (නින්දා ප්‍රශංසාවට) බලු, එකාන්තයෙන්; පහොන්ති, සමර්ත්ථ වෙත්.

**11. ධම්මාමිසාභිගරුකෙසු ජනෙසු ලොකෙ
අප්පාව ධම්මගරුකා හි තතොපි ධීරා,
බාලෙහි තඟස විරලා ගුණිනො භවන්ති
කිං තෙහි ආමිසගරූහි අවිද්දසූහි.**

වුත්තං හෙතං භගවතා මහාකාරුණිකෙන සමධිගතසබ්බධම්මසීමෙන අභිඤ්ඤාතධම්මමරියාදෙන සුලද්ධියෙ පග්ගණ්හන්තෙන දුලද්ධියෙ නිග්ගණ්හන්තෙන සයම්භුනා අනාචරියකෙන — සබ්බා භික්ඛවෙ නදී අසීමා, සබ්බො සමුද්දො අසීමො, සබ්බො ජාතස්සරො අසීමො, නදියා වා භික්ඛවෙ සමුද්දෙ වා ජාතස්සරෙ වා යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපො, අයං තත්‍ර

---

11. ලොකෙ, ලෙව්හි; ධම්මාමිසාභිගරුකෙසු, ධර්මාමිශ ඉතා ගරු කොට ඇති; ජනෙසු, ජනයන් අතුරෙහි; ධම්මගරුකා හි, ධර්මගරුකයෝ වනාහි; අප්පා එව, ස්වල්ප වෙත් ම ය; තතොපි, එයිනු දු; බාලෙහි, බාලයන් කෙරෙන්; තඟස, ඒකාන්තයෙන් වෙන් වූ; ගුණිනො, ගුණ ඇත්තා වූ; ධීරා, ප්‍රාඥයෝ; විරළා භවන්ති, තුනී වූවාහු වෙත්; තෙහි ආමිසගරූහි, ඒ ආමිසගරු කොට ඇත්තන් ගෙන් ද; අවිද්දසූහි, බාලයන් ගෙන් ද; කිං, ප්‍රයොජනකිම?.

දැන් භදන්තාචාර්‍යවිමලසාරතිස්සාභිධානමහානායකස්ථවිර ස්වාමිපාදයෝ තමන් ප්‍රස්තුතප්‍රකරණයට -“වුත්තං හෙතං භගවතා” යනාදිය ප්‍රාරබ්ධ කළෝ.

මහාකාරුණිකෙන, මහත්කාරුණාවෙන් යුක්තවූ; සමධිගත සබ්බධම්මසීමෙන, අවබොධ කරණ ලද සියළුධර්මසීමාවන් ඇති; අභිඤ්ඤාතධම්මමරියාදෙන, නොබිඳිනලද ධර්මමර්‍යාදාඇති; සුලද්ධියෙ, යහපත් ලබ්ධිඇත්තවුන්ට; පග්ගණ්හන්තෙන, ප්‍රග්‍රහකරන්නාවූ; (“සුන්දරා ලද්ධි සුලද්ධි, සුලද්ධිඅස්ස අත්ථීති සුලද්ධියො, තෙ සුලද්ධියෙ, (කපපියො” යනු මෙනි)-දුලද්ධියෙ, දුර්ලබ්ධි ඇත්තවුන්ට; නිග්ගණ්හන්තෙන, නිග්‍රහ කරන්නාවූ; සයම්භුනා, චතුරාර්‍යසත්‍යධර්මයන් පරොපදෙශ රහිත ව ස්වයම්භූඥානයෙන් අවබොධ කළා වූ; අනාචරියකෙන, (බුද්ධත්වය සඳහා) ආචාර්‍යයෙක් නැත්තා වූ; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; එතං, මේ සීමාක්‍රමය; වුත්තං හි, වදාරණලද්දේ මය; භික්ඛවෙ, මහණෙනි; සබ්බා නදී, සියලු ගංගා තොමෝ; අසීමා, සීමා ඇත්තී නොවන්නීය; සබ්බො සමුද්දො, සියලු සමුද්‍රයතෙම; අසීමො, සීමාඇත්තෝ නොවෙයි; සබ්බො ජාතස්සරො, සියලු ජාතස්සරය තෙම; අසීමො, සීමා ඇත්තෝ නොවෙයි; භික්ඛවෙ, මහණෙනි; නදියා වා, නදියෙහි හෝ; සමුද්දෙ වා, සමුද්‍රයෙහිහෝ;

සමානසංවාසා එකූපොසථාති … අයමෙත්ථ පදවණ්ණනාය සද්ධිං අධිප්පායත්ථො … සබ්බාති අනවසෙසත්ථ පරිදීපනං, නදියා විසෙසණමෙතං. තෙන පභවතො පට්ඨාය යාවමුඛද්වාරා ච තිරියං උභින්නං තීරානඤ්ච අන්තරා යාව හෙට්ඨාපථවිතලං සමවුට්ඨිකාලෙ උදකප්පවත්තනොකාසා උදකුක්ඛෙපසීමුප්පත්තියා කප්පියභූතා අනවසෙසා නදීති අත්ථො. භික්ඛවෙති අත්තනො වචනපටිග්ගාහකභික්ඛු සඞ්ඛාතපුග්ගලාලපනමෙතං.

නදීති-නදති අබ්‍යත්තං සද්දං කරොතීති පදවිග්ගහො. යම්පන නදීති ලොකෙ වොහරන්ති යත්ථ සමවස්සකාලෙ සොතං න

---

ජාතස්සරෙ වා, ජාතස්සරයෙහි හෝ; මජ්ඣිමස්ස පුරිසස්ස, බල මැදුම් පිරිමිහුගේ; සමන්තා, හාත්පස්හි; උදකුක්ඛෙපා, උදකුක්ඛෙප ප්‍රමාණයෙන්; (කාරණාර්ථයෙහි නිස්සක්කය යි) යං, යම් ස්ථානයක් පිරිසිඳින ලද්දේ ද; තත්ථ, එහි; සමානසංවාසා, සමාන සංවාස ඇති වූ; අයං, මේ; එකූපොසථාති, එකූපොසථයක් ඇති සීමාව වේ; (මෙයින් කුමක් කියත්ද) සියළු නදී සමුද්‍රජාතස්සර යන්ගේ බල මැදුම් පිරිමිහුගේ උදකුක්ඛෙපයෙන් පිරිසිඳින ලද ප්‍රදෙශය සීමා වන බවත් එයින් බාහ්‍ය ප්‍රදෙශය සර්වප්‍රකාරයෙන් අසීමා ම බවත් ප්‍රකාශ කරත්. නදී ආදීන්ගේ ඇතුල්හි කාරක සඞ්ඝයා බට කල්හි ඒ උදකුක්ඛෙපසීමා තොමෝ ලැබේ. නො බට හොත් නො ලැබේ. (එහෙයින් නදී සමුද්‍රජාතස්සරයෝ අසීමා ම ය යන අර්ථයි.) එත්ථ, මෙහි; පදවණ්ණනාය සද්ධිං, පද වැණුම සමග; ("පජ්ජතෙ තෙන අත්ථොති පදං, වණ්ණියති අත්ථො කථියති එතායාති වණ්ණනා, පදඤ්ච වණ්ණනා ච පදවණ්ණනා, තාය පදවණ්ණනාය") අයං, මේ; අධිප්පායත්ථො, අභිප්‍රායාර්ථයි … සබ්බාති, "සබ්බා" යන; එතං, මෙය; නදියා, නදියගේ; අනවසෙසත්ථපරිදීපනං, සර්වාර්ථය දක්වන්නා වූ; විසෙසණං, විශෙෂණ පදයකි; තෙන, එහෙයින්; පභවතො පට්ඨාය, හටගැන්මේ පටන්; මුඛද්වාරා ච යාව, මුවදොර දක්වා ද; තිරියං, සරස; උභින්නං තීරානං, දෙතීරයන්ගේ; අන්තරා ච යාව, ඇතුළත දක්වා ද; හෙට්ඨා පථවිතලං, යට පෘථිවීතලය; සමවුට්ඨිකාලෙ, සමවෘෂ්ටිකාලයෙහි; උදකප්පවත්තනොකාසා, ජලයාගේ පැවැත්මට අවකාශ ඇතිවූ; උදකුක්ඛෙපසීමුප්පත්තියා, උදකුක්ඛෙපසීමාවගේ හටගැන්ම පිණිස; කප්පියභූතා, කැපවූ; අනවසෙසා නදීති, සියළු නදිය යන; අත්ථො, අර්ථයි; භික්ඛවෙති, "භික්ඛවෙ" යන; එතං, මෙය; අත්තනො, තමන්වහන්සේගේ; වචනපටිග්ගාහක, වචන පිළිගන්නා වූ; භික්ඛුසඞ්ඛාත පුග්ගලාලපනං භික්ෂුසංඛ්‍යාත පුද්ගලයන් අභිමුඛ කිරීමෙහි ආලපනයයි.

නදීති, "නදී" යනු; නදති අබ්‍යත්තං සද්දං කරොතීති, "නදති=පෙ=කරොති" යනු; පදවිග්ගහො, පදවිග්‍රහයි; යම්පන, යම් ස්ථාන

**පවිජ්ජති** සා එව ගහෙතබ්බා. තෙන වුත්තං **අට්ඨකථායං.**
යස්සා පන ඊදිසෙ සුවුට්ඨිකාලෙ **වස්සානස්ස** චාතුමාසෙ සොතං
න **පවිජ්ජති.** තිමණ්ඩලං තිවාසෙත්වා යත්ථ කත්ථචි උත්තර
න්තියා භික්ඛුනියා අන්තරවාසකො තෙමීයති අයං නදීති ....
සිනීයති බන්ධීයතීති සීමාති සීමාසද්දස්ස සි=බන්ධනෙති අස්ස
ධාතුනො වසෙන සද්දත්ථවිදූහි අභිමතො අත්ථො **එත්ථ** අයුත්තො
විය **දිස්සති.** අට්ඨකථාදිසුපි.

---

යක් වනාහි; නදීති, නදී යයි; ලොකෙ, ලෙව්හි; වොහරන්ති, ව්‍යවහාර
කෙරෙත් ද?; **යත්ථ,** යම් තැනෙක්හි; සමවස්සකාලෙ, සමවෂ්‍රීකාල
යෙහි; සොතං, ප්‍රවාහය; න **පවිජ්ජති,** නො සිඳී පවතීද?; සා **එව,**
ඕතොමෝ ම; ගහෙතබ්බා, ගතයුත්තීය; යස්සා පන, යම් ගංගා
වෙක්හි වනාහි; ඊදිසෙ සුවුට්ඨිකාලෙ, මෙබඳු වැසිකල; **වස්සානස්ස**
චාතුමාසෙ, වසන් සාරමස්හි; ("චතුන්නං මාසානං සමාහාරො
චතුමාසං=චතුමාසමෙව චාතුමාසං-තස්මිං චාතුමාසෙ") සොතං,
ප්‍රවාහය; න පවිජ්ජති, නොසිඳ පවතී ද?; තිමණ්ඩලං තිවාසෙත්වා,
තෙමඬුළු වසා හැඳ; යත්ථ කත්ථචි, යම්කිසි ගංගාවෙක්හි; (තොටින්
හෝ බැස) උත්තරන්තියා, එතරවන්නා වූ; භික්ඛුනියා, මෙහෙණි
යගේ; අන්තරවාසකො, අඳනා සිවුර; තෙමීයති, තෙමීයේ ද?;
(තෙමේ ම හෝ තෙමෙනලද ද) අයං, මෝතොමෝ; නදීති, නදී
යයි; අට්ඨකථායං, අටුවායෙහි; තෙන, එහෙයින්; වුත්තං, කියන
ලදී; (මෙහි අදහස:-යම් ස්ථානයක් නදී යයි ලොකයේ ව්‍යවහාරයට
පැමිණියා ද ඒ ස්ථානයෙහි සමවැසිකල වසන් සාරමස්හි සැඬපහර
නොසිඳී පවතී ද?; සමුද්‍රය කරා හෝ පැමිණේ ද? හැමට යටත්
පිරිසෙයින් එබඳු ලක්‍ෂණ ඇති ගඟක තොටින් හෝ නො තොටින්
හෝ තෙමඬුලු වසා හැඳ අඳනය නො නගා එතරවන්නා වූ මෙහෙ
ණියගේ අඳනා සිවුර අඟලක් හෝ දෙඅඟලක් හෝ තෙමීයේ ද?
එබඳු ලක්‍ෂණ ඇත්තී උත්පත්තියෙන් පටන් නදී වූවා නදී නම්.
මෙයින් නදී ලක්‍ෂණ විඥාතකළෝ.)

(යම්කිසි සූකරාදි සතෙකු විසිනු දූ නො කරන ලද හෙයින්
ස්වයංජාත වූ ආවාටයෙක් යථොක්ත සමවෂ්‍රී කාලයෙහි දියෙන්
පිරීසිටී ද ඒ ජාතස්සරය ලක්‍ෂණප්‍රාප්ත නම්.) සිනීයති බන්ධීයතීති
සීමාති, "සිනීයතිබන්ධියතීති සීමා" යන මෙයින්; සීමාසද්දස්ස,
"සීමා" ශබ්දයාගේ; සිබන්ධනෙති, "සිබන්ධනෙ" යන අස්සධාතුනො
වසෙන, මේ ධාතුහුගේ වශයෙන්; සද්දත්ථවිදූහි, ශබ්දාර්ථ දත්
නන් විසින්; අභිමතො, කැමැතිවන ලද; අත්ථො, අර්ථය තෙම;
**එත්ථ,** මෙහි; අයුත්තො විය, නුසුදුසු මෙන්; **දිස්සති,** දක්නා ලැබේ.

අයමත්ථො න වණ්ණිතො විනයාලඞ්කාරටීකායම්පන, "සිනීයතෙ සමග්ගෙන සඞ්ඝෙන කම්මවාචාය බජ්ඣීයතෙ"ති වුත්තො. බද්ධසද්දෙන ච අබද්ධසද්දෙන ච පච්චෙකං තත්ථ තත්ථ සීමාසද්දස්ස විසෙසිතත්තා, යදෙත්ථ සීමාසද්දොපි බජ්ඣනත්ථො සියා බද්ධසද්දසීමාසද්දානං එකපරියායත්තා පුනරුත්තතා හොති. අථ අබද්ධසද්දෙන විසෙසිතො බජ්ඣනත්ථො සීමාසද්දො සයඤ්ජාතානං සත්තබ්භන්තර-සීමාදීනං කස්සචි බජ්ඣනාභාවා අත්ථවිරොධොපි දිස්සති. තස්මා එත්ථ බජ්ඣනත්ථමනපෙක්ඛිත්වා රූළ්හිවසෙන කෙවලං මරියාද මත්තං ඉමිනා සීමාසද්දෙන වුත්තං විය පඤ්ඤායති. අයං අම්හාකං ඛන්ති ~ නත්ථි සීමා යස්සා සා අසීමා, ඉමිනා පන නදියා බද්ධසීමා

---

අට්ඨකථාදිසුපි, අර්ථකථාදියෙහි ද; අයං අත්ථො, මේ අර්ථය තෙම; න වණ්ණිතො, නො වණ්නා ලදී; විනයාලඞ්කාරටීකායම්පන, විනයාලඞ්කාරටීකායෙහි වනාහි; සිනීයතෙ සමග්ගෙන සඞ්ඝෙන කම්මවාචාය බජ්ඣියතෙති, "සිනීයතෙ=පෙ=බජ්ඣීයතෙ" යනු; වුත්තො, කියන ලදී; බද්ධසද්දෙන ච, බද්ධශබ්දයෙන් ද; අබද්ධසද්දෙන ච, අබද්ධ ශබ්දයෙන් ද; පච්චෙකං, වෙනවෙන ම; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; සීමාසද්දස්ස, සීමාශබ්දයා තමා; විසෙසිතත්තා, වෙසෙසන ලද බැවිනි; යං, යම්හෙයකින්; එත්ථ, මෙහි; සීමාසද්දොපි, සීමා ශබ්දයතෙමේ ද; බජ්ඣනත්ථො සියා, බජ්ඣනාර්ථ ඇති වේ නම්; බද්ධසද්දසීමාසද්දානං, බද්ධශබ්ද සීමාශබ්ද දෙදෙනා තමා; එක පරියායත්තා, හුදෙක් සමානාර්ථ බැවින්; පුනරුත්තතා හොති, පෞනරුක්තාර්ථ ඇත්තේ වේ; අථ, එසේ ඇති කල්හි; අබද්ධ සද්දෙන, අබද්ධශබ්දයෙන්; විසෙසිතො, වෙසෙසන ලද; බජ්ඣනත්ථො, බජ්ඣනාර්ථ ඇති; සීමාසද්දො, සීමාශබ්දයතෙම; සයඤ්ජාතානං, තෙමේ ම හටගත්තා වූ; සත්තබ්භන්තරසීමාදීනං, සත්තබ්භන්තර සීමාදීන්ගේ; කස්සචි, කිසිවෙකු විසිනු ත් (කිසිවෙකුගේ;) බජ්ඣනාභාවා, (කම්වදනින් සම්මුතිකරණ විසින්) බැඳීමක් නැති හෙයින්; අත්ථවිරොධොපි, අර්ථවිරොධය ද; දිස්සති, දක්නා ලැබේ; තස්මා, එහෙයින්; එත්ථ, මෙහි; බජ්ඣනත්ථං, බජ්ඣනාර්ථය; අනපෙක්ඛිත්වා, අපෙක්ෂා නො කොට; රූළ්හිවසෙන, රූඪිවශයෙන්; කෙවලං, හුදෙක්; මරියාදමත්තං, මර්යාදප්‍රමාණය; ඉමිනා සීමාසද්දෙන, මේ සීමාශබ්දයෙන්; වුත්තං විය, කියනලද මෙන්; පඤ්ඤායති, හැඟේ; අයං, මේ; අම්හාකං, අපගේ; ඛන්ති, රුචි යයි ~ "නත්ථි සීමා යස්සා සා අසීමා" ඉමිනා, මෙයින්; නදියා පන, නදියෙහි වනාහි; බද්ධසීමාසම්මන්නනං, බද්ධසීමාසම්මුතිය; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙප කරණලදී; තෙනෙව, එහෙයින් ම; යා කාචි, යම්කිසි; ලක්ඛණප්පත්තා, ලක්ෂණප්‍රාප්ත වූ; නදී, නදියක් තොමෝ; නිමිත්තානි

සම්මන්නං පටික්ඛිත්තං. තෙනෙව, යා කාචි ලක්ඛණප්පත්තා නදී නිමිත්තානි කිත්තෙත්වා එතං බද්ධසීමං කරොමාති කතාපි අසීමාව හොති.

සා පන අත්තනො සභාවෙනෙව බද්ධසීමා සදිසා සබ්බමෙවෙත්ථ සඞ්ඝකම්මං කාතුං වට්ටතීති අට්ඨකථායං දස්සිතං ...... සබ්බො සමුද්දො අසීමොති එත්ථ "සමීචිනා උද්ද ජලචරවිසෙසා යස්මිං සන්ති වා සහ උද්දය මරියාදය වත්තන්තෙති වා සමුද්දො" සො හි සලිලරාසි පාකටතරොව සබ්බොති සමුද්දසද්දං අපෙක්ඛිත්වා පුල්ලිඞ්ගෙන වුත්තමත්ථොව විසෙසො. තත්ථ සීමා යස්ස සො අසීමො. "එත්ථාපි ඌමිවෙගෙන උදකස්ස වඩ්ඪිපරිහානිවසෙන අගහෙත්වා පකතිට්ඨාන

---

කිත්තෙත්වා, නිමිති කීර්තනය කොට; එතං, මෙය; බද්ධසීමං කරොම ඉති, බදසිම් කරමු යයි; කතාපි, කරණලද්දී ද; අසීමාව හොති, අසීමා ම වේ; (බද්ධසීමා නො වේ යනාර්ථයි.)

සා පන, ඕතොමෝ වනාහි; අත්තනො, තමාගේ; සභාවෙනෙව, ස්වභාවයෙන් ම; බද්ධසීමා සදිසා, බදසිම්සමානය; එත්ථ, මෙහි; සබ්බමෙව සඞ්ඝකම්මං, සියළු ම සඞ්ඝකර්ම; කාතුං, කරන්ට; වට්ටතීති, වටනේය යනු; අට්ඨකථායං, අටුවායෙහි; දස්සිතං, දක්වනලදී ...... සබ්බො සමුද්දො අසීමො'ති, "සබ්බො සමුද්දො අසීමො" යන; එත්ථ, මෙහි; ("සමීචිනා උද්ද ජලචරවිසෙසා යස්මිං සන්ති වා සහ උද්දය මරියාදය වත්තන්තෙති වා සමුද්දො" යනු සමුද්‍රලක්ෂණ කීහු.) සො හි, ඒ සමුද්‍රය වනාහි; සලිලරාසි, ජලරැසින්; පාකටතරො ව, අතිශය ප්‍රකටයි; සබ්බො'ති, "සබ්බො" යනු; සමුද්දසද්දං, සමුද්‍ර ශබ්දය; අපෙක්ඛිත්වා, අපෙක්ෂා කොට; පුල්ලිඞ්ගෙන, පුල්ලිඞ්ගයෙන්; වුත්තො, කියන ලද; අත්ථො එව, අර්ථය ම; විසෙසො, වෙනස වේ; ("වුත්තමත්ථො" යන මෙහි "වුත්තො අත්ථො"යි විසන්ධි වේ.)

"තත්ථ සීමා යස්ස සො අසීමො" එත්ථ අපි, මෙහි දු; ඌමිවෙගෙන, රළවේගයෙන්; උදකස්ස, ජලයාගේ; වඩ්ඪිපරිහාණි වසෙන, වැඩීම් පිරිහීම් වශයෙන්; ("වඩ්ඪනං වඩ්ඪි, පරිහීණං පරිහාණි, වඩ්ඪි ච පරිහාණි ච=වඩ්ඪිපරිහානි, තාසං වසෙන") අගහෙත්වා, නො ගෙණ; පකතිට්ඨානං එව, ස්වභාවයෙන් ජලය අවුත් (රැස්වී) සිටින තැන ම; ගහෙතබ්බං, ගතයුතුයි.

යස්මිං පන පදෙසෙ, යම් පෙදෙසෙක්හි වනාහි; පකතිවීචියො, ප්‍රකෘතිරළ; ඔසරිත්වා, රැස්වී; සණ්ඨහන්ති, සිටිත් ද? සො, ඒ ප්‍රදෙශය තෙම; උදකන්තතො පට්ඨාය, ජලකෙළවර පටන්; අන්තො, ඇතුළත; සමුද්දො නාම, සමුද්‍ර නම්; තත්ථ ඨිතෙහි, එහි සිටියවුන් විසින්; කම්මං කාතබ්බං, කම් කටයුතුය; සචෙ, ඉදින්; ඌමිවෙගො,

මෙව ගහෙතබ්බං — තෙනාහ අට්ඨකථායං, යස්මිං පන පදෙසෙ පතිතා වීචියො ඔසරිත්වා සණ්ඨහන්ති සො උදකාන්තතො පට්ඨාය අඤ්ඤො සමුද්දො නාම. තත්ථ සීඝෙහි කම්මං කාතබ්බං සචෙ ඌමිවෙගො බාධති නාවාය අට්ටකෙ වා ඨත්වා කාතබ්බන්ති — ජාතස්සරොති “ජලාති සරන්ති එත්ථාති සරො ජාතො ච සො සරො චාති ජාතස්සරො” එතෙන “ජන” ධාතුස්ස අකම්මකත්තා සයඤ්ජාතො යො කොචි සරො වුච්චති අට්ඨකථායම්පි, එත්ථ ච ජාතස්සරො නාම.

යෙන කෙනචි ඛණිත්වා අකතො සයඤ්ජාතසොබ්භොති වුත්තො. එත්ථාපි, අසීමොති අඤ්ඤත්ථසමාසොව — නදියාති එත්ථ උදකුක්ඛෙපසීමාය විසයත්තා විසයාධාරො. උදකුක්ඛෙපසීමා ච විසයීභූතා. සමුද්දජාතස්සරෙසුපි එසෙව නයො. වාසද්දො හි උපමාන සමුච්චයසංසයවස්සග්ගපදපූරණවිකප්පාදිසු වත්තමානොපි චෙත්ථ යෙ හි කෙහිචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වාති ආදිසු විය

---

රළුවෙගය තෙම; බාධති, පෙළා නම්; නාවාය වා, නැවෙහි හෝ; අට්ටකෙ වා, අටල්ලෙහි හෝ; ඨත්වා, සිට; කාතබ්බන්ති, කටයුතුය යනු; අට්ඨකථායං, අටුවායෙහි; තෙන, එහෙයින්; ආහ, කීය; ජාතස්සරො'ති, “ජාතස්සරො” යනු; (“ජලාති සරන්ති එත්ථාති සරො, ජාතො ච සො සරො චාති ජාතස්සරො”) එතෙන, මෙයින්; ජනධාතුස්ස, ජනධාතු තමා; අකම්මකත්තා, අකර්මක බැවින්; සයඤ්ජාතො, ස්වයඤ්ජාත වූ; යො කොචි සරො, යම් කිසි තඩාගයක්; වුච්චති, කියනු ලැබේ; අට්ඨකථායම්පි, අටුවායෙහි ද; එත්ථ ච, මෙහි දු; ජාතස්සරො නාම, ජාතස්සරය නම්:–

යෙන කෙනචි, යම් කිසිවෙකු විසින්; ඛණිත්වා, කැණ; අකතො, නො කරණලද්දා වූ; සයඤ්ජාතසොබ්භො'ති, තෙමේ හට ගත් හෙබයයි; වුත්තො, කියනලදී; එත්ථාපි, මෙහි ද; අසීමොති. “අසීමො” යනු; අඤ්ඤත්ථසමාසොව, අන්‍යාර්ථසමාසය ම ය; — නදියා'ති, “නදියා” යනු; එත්ථ, මෙහි; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමාවට; විසයත්තා, විෂය වූ බැවින්; විසයාධාරො, විෂයාධාරයයි; උදකුක්ඛෙපසීමා ච, උදකුක්ඛෙපසීමාතොමෝ ද; විසයීභූතා, ආධෙය්‍යවූ වායි; සමුද්දජාතස්සරෙසුපි, සමුද්‍රජාතස්සරයන්හි ද; එසෙවනයො, මෙම ක්‍රමය ම යි; වාසද්දො හි, වාශබ්දයතෙම වනාහි; උපමාන, උපමානය; සමුච්චය, සම්පිණ්ඩනය; සංසය, සංසයය; වස්සග්ගපදපූරණවිකප්පාදිසු, වස්සග්ගපදපූරණවිකල්පාදි අර්ථයන්හි; වත්තමානො'පි ච, පවත්නේ නමුදු; එත්ථ, මෙහි; යෙ හි කෙහිචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා'ති, “යෙ හි කෙහිචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා” යන; ආදිසු විය, මේ ආදීතන්හි

විකප්පත්ථො, තෙන නදීසමුද්දජාතස්සරානං පච්චෙකත්තං දීපෙති. යන්ති ඨානං සන්ධාය උද්දෙසිතවචනමෙතං. යං ඨානන්ති අත්ථො. මජ්ඣිමස්ස පුරිසස්සාති ථාමතො මජ්ඣෙ භවො මජ්ඣිමො, පූරෙතීති පුරිසො, න පමාණමජ්ඣිමස්ස ථාමමජ්ඣිමස්ස පුරිසස්සාති අත්ථො. සමන්තාති පරිතො. උදකුක්ඛෙපාති කාරණත්ථෙ නිස්සක්කං. තෙනාහ, අට්ඨකථායං උදකුක්ඛෙපෙනාති. උන්දති කිලෙදති පසවතීති වා උදකං, තං උද්ධං කත්වා ඛිපීයති එත්ථාති උදකුක්ඛෙපො. අථවා, උක්ඛිපනං උක්ඛෙපො, උදකස්ස උක්ඛෙපො උදකුක්ඛෙපො,

“අයන්ති” අච්චාසන්නපරිදීපනමෙතං, තෙන සමානසංවාසාය එකූපොසථාය උදකුක්ඛෙපසීමාය ආසන්නතරො විභාවිතො. තත්ථාති තස්මිං ඨානෙ, සමානසංවාසාති සමමා නීයතෙති සමානො. සංවසනං සංවසන්ති එත්ථාති වා සංවාසො, සමානො සංවාසො යස්සං සා සමානසංවාසා. සමානානං එකලද්ධිකානං සබ්‍රහ්මචාරීනං සමානකම්මවසෙන සහවාසො එත්ථ වත්තතීති අත්ථො...... ඉමිනා

---

මෙන්; විකප්පත්ථො, විකල්පාර්ථයි; තෙන, එහෙයින්; නදීසමුද්දජාතස්සරානං, නදීසමුද්‍රජාතස්සරයන්ගේ; පච්චෙකත්තං, වෙන් වෙන් බව; දීපෙති, ප්‍රකාශ කෙරෙයි; යන්ති, “යං” යනු; ඨානං සන්ධාය, තැනක් සඳහා; එතං, මෙය; උද්දෙසිතවචනං, උදෙසනලදවචන යයි; යං ඨානන්ති, යම්තැනක් යන; අත්ථො, අදහසයි; මජ්ඣිමස්ස පුරිසස්සා‘ති, “මජ්ඣිමස්සපුරිසස්ස” යනු; ථාමතො, ශක්තිහෙයින්; (මජ්ඣෙ භවො මජ්ඣිමො, පූරෙතීති පුරිසො,) පමාණමජ්ඣිමස්ස, ප්‍රමාණමධ්‍යමපුරුෂයාගේ (අතින්;) න, නො වේය; ථාමමජ්ඣිමස්ස පුරිසස්සාති, බලමැදුම්පිරිමිහුගේ (හස්තයෙන්) යන; අත්ථො, අර්ථයි; සමන්තාති, “සමන්තා” යනු; පරිතො, හාත්පසින්ය යනාර්ථයි; උදකුක්ඛෙපා‘ති, “උදකුක්ඛෙපා” යනු; කාරණත්ථෙ, කාරණාර්ථයෙහි; නිස්සක්කං, අවධිවිභක්ති යි; උදකුක්ඛෙපෙනාති “උදකුක්ඛෙපෙන” යනු; අට්ඨකථායං, අටුවායෙහි; තෙන, එහෙයින්; ආහ, කීය; (“උන්දති කිලෙදති පසවතීති වා උදකං, තං උද්ධං කත්වා ඛිපීයති එත්ථාති=උදකුක්ඛෙපො, අථවා උක්ඛිපනං උක්ඛෙපො, උදකස්ස උක්ඛෙපො උදකුක්ඛෙපො.) .

අයන්ති, “අයං” යන; එතං, මෙය; අච්චාසන්නපරිදීපනං, අන්තර්උපචාරයාගේ දැක්වීමයි;(මෙතන්හි ආසන්නශබ්ද උපචාරාර්ථ වාචක යි. “උපචාරො උපට්ඨානෙ ආසන්නෙ” යනු නිඝණ්ඩුයි. “ආසන්න” යනු හා සම්බන්ධ වූ “අති” ශබ්ද අන්තර් අර්ථද්‍යොතක යි. “අතෙතාභාවභුසත්ථාති” යනු අභිධානයි.) තෙන, එහෙයින්; සමානසංවාසාය, සමානසංවාසඇති; (එකසීමාවෙහි සිටියෝ ම සමානසංවාසක වෙති.) එකූපොසථාය, එකූපොසථයක් ඇති; උදකුක්ඛෙප

එතේව විසුං උපොසථස්ස වුච්චමානත්තා විනා උපොසථං අවසෙස කම්මානං වසෙන වෙදිතබ්බං. ටීකායම්පි, විසුං එකූපොසථාති වචනතො උපොසථං ඨපෙත්වා සෙසකම්මානි සමානසංවාසා නාමාති ලිඛිතන්ති ආගතං. එකූපොසථාති, එති ගච්ඡතීති එකො, උපවසන්ති එත්ථාති උපොසථො, උපවසන්තීති සීලෙන වා අනසනෙන වා උපෙතා හුත්වා වසන්තීති අත්ථො.

එකො උපොසථො යස්සං සා එකූපොසථා. අයම්පන උපොසථසද්දො අනෙකත්ථොපි සමානො, එත්ථ පන ආයාමාවුසො කප්පින උපොසථං ගමිස්සාමාති ආදිසු විය පාතිමොක්ඛුද්දෙසෙ එව දිස්සති

---

සීමාය, උදකුක්ඛෙප සීමාවගේ; ආසන්නතරො, අතිශයොපචාරය; විභාවිතො, ප්‍රකාශ කරණලදී; තත්ථාති, "තත්ථ" යනු, තස්මිං ඨානෙ, ඒ සථානයෙහිය; සමානසංවාසාති, "සමානසංවාසා" යනු; (සමමානීයන්තෙති සමානො, සංවසනං සංවසන්ති එත්ථාති වා සංවාසො, සමානො සංවාසො යස්සං සා සමානසංවාසා.) සමානානං, සමාන වූ; එකලද්ධිකානං, එකලබ්ධි ඇති; සබ්‍රහමචාරීනං, සබ්‍රම්සරුන්ගේ; සමානකම්මවසෙන, එකුද්දෙසඑකකම් විසින්; සහවාසො, සමග වාසය; එත්ථ, මෙහි; වත්තන්තීති, පවතියි යන, අත්ථො, අර්ථයි; ඉමිනා, මෙයින්; එතේව, මෙහි ම; විසුංඋපොසථස්ස, විසුංඋපොසථය නමා; වුච්චමානත්තා, කියනු ලබන බැවින්; උපොසථං විනා, උපොසථය හැර; අවසෙසකම්මානං වසෙන, සෙසුකාම්යන්ගේ වශයෙන්; වෙදිතබ්බං, දතයුතුයි; ටීකායම්පි, ටීකායෙහි ද; විසුංඑකූපොසථාති, "විසුංඑකූපොසථ"යයි; වචනතො, කීමෙන්; උපොසථං ඨපෙත්වා, උපොසථය තබා; සෙසකම්මානි, සෙසුකාමියන්; සමානසංවාසා නාමාති, සමානසංවාස නමැයි; ලිඛිතන්ති, ලියන ලදය යනු; ආගතං, (ස්වරූපයෙන්) ආයේයි; එකූපොසථාති, "එකූපොසථා" යනු; (එති ගච්ඡතීති එකො, උපවසන්ති එත්ථාති උපොසථො.) උපවසන්තීති, "උපවසන්ති" යනු; සීලෙන වා, සීලයෙන් හෝ; අනසනෙන වා, (අභොජනාදි) අනසනයෙන් හෝ; උපෙතා හුත්වා, යුක්ත ව; වසන්තීති, වෙසෙත්ය යන; අත්ථො, අර්ථයි; ("සීලෙන වා සබ්බසො ආහාරස්ස අභුඤ්ජනසඞ්ඛාතෙන අනසනෙන වා ඛීරපාන මධුපානාදිමත්තෙන වා උපෙතා හුත්වා වසන්තීති අත්ථො" යනු ටීකායි.)

"එකො උපොසථො යස්සං සා එකූපොසථා" අයං පන උපොසථසද්දො, මේ උපොසථ ශබ්දයතෙම වනාහි; අනෙකත්ථො සමානො අපි, අනෙකාර්ථ ඇතිවූයේ නමු දු; එත්ථ පන, මෙහි වනාහි; ආයාමාවුසො කප්පින උපොසථං ගමිස්සාමාති, "අයාමාවුසො=පෙ=ගමිස්සාම" යන; ආදිසුවිය, මේ ආදි තන්හි මෙන්; පාතිමොක්ඛු

පාරිසුද්ධිආදයො අවසෙසා අට්ඨුපොසථාපි එතෙනෙව සඞ්ගහං ගච්ඡන්ති. සො හි නො භගවා සාවකානං හිතෙසී උදකුක්ඛෙපසීමං අනුජානන්තො සබ්බා භික්ඛවෙ නදී අසීමාති ආදිනා පඨමං මග්ගදෙසකො වාමං හිත්වා දක්ඛිණං ගණ්හාහීති වදන්තො විය අකප්පියං පටිබාහන්තො පුන නදියා වා භික්ඛවේ'ති ආදිනා නදී ආදිසෙවව උදකුක්ඛෙපසීමත්තං පකාසෙසි. අට්ඨකථායමපි, එවං නදීසමුද්දජාතස්සරානං බද්ධසීමභාවං පටික්ඛිපිත්වා පුන තත්ථ අබද්ධසීමපරිච්ඡෙදං දස්සෙන්තො නදියා වා භික්ඛවෙති ආදිමාහ. තත්ථ යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපාති යං ඨානං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තතො උදකුක්ඛෙපෙන පරිච්ඡින්නං.

කථම්පන උදකං උක්ඛිපිතබ්බන්ති, යථා අක්ඛධුත්තා දරුගුළං ඛිපන්ති එවං උදකං වා වාලිකං වා හත්ථෙන ගහෙත්වා ථාම

---

දෙසෙ එව; ප්‍රාතිමොක්ෂොද්දෙශයෙහි ම; දිස්සති, දක්නා ලැබේ; පාරිසුද්ධි ආදයො, පාරිශුද්ධි ආදීවූ; අවසෙසා, සෙසු; අට්ඨුපොසථාපි, අෂ්ටොපොෂථය ද; එතෙ එව, මෙහි ම; සඞ්ගහං, සඞ්ග්‍රහයට; ගච්ඡන්ති, යෙත්; නො, අපගේ; සො භගවා හි, ඒ භාග්‍යවතුන් වහන්සේ ම; සාවකානං, ශ්‍රාවකයන්ට; හිතෙසී, වැඩකැමැතිසේක්; උදකුක්ඛෙපසීමං, උදකුක්ඛෙපසීමාව; අනුජානන්තො, අනු දන්නාසේක්; සබ්බා භික්ඛවෙ නදී අසීමාති, "සබ්බා භික්ඛවෙ නදී අසීමා" යන, ආදිනා, මේ ආදියෙන්; පඨමං, පළමු කොට; මග්ගදෙසකො, මාර්ගදෙශකයෙක්; වාමං හිත්වා, වම හැර; දක්ඛිණං, දකුණ; ගණ්හාහීති, ගණුවයි; වදන්තො විය, කියන්නාක් මෙන්, අකප්පියං, අකැපසීමාව; පටිබාහන්තො, ප්‍රතිබාහණය කරණසේක්; පුන, නැවත; නදියා වා භික්ඛවෙති, "නදියා වා භික්ඛවෙ" යන; ආදිනා, මේ ආදි වශයෙන්; නදීආදිසු එව, නදීආදීන්හි ම; උදකුක්ඛෙපසීමත්තං, උදකුක්ඛෙපසීමාභාවය; පකාසෙසි, ප්‍රකාශ කළසේක. අට්ඨකථායමපි, අටුවායෙහි ද; එවං, මෙපරිද්දෙන්; නදීසමුද්දජාතස්සරානං, නදීසමුද්‍රජාතස්සරයන්ගේ; බද්ධසීමභාවං, බද්ධසීමබව; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; පුන, වැලිදු; තත්ථ, එහි; අබද්ධසීමපරිච්ඡෙදං, අබද්ධසීමාපරිච්ඡෙදය; දස්සෙන්තො, දක්වමින්; නදියා වා භික්ඛවෙති ආදිං, "නදියා වා භික්ඛවෙ" යනාදිය; ආහ, වදාළ සේක; තත්ථ යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපාති, "තත්ථයං=පෙ=උදකුක්ඛෙපා" යනු; යං ඨානං, යම් ස්ථානයක්; මජ්ඣිමස්ස පුරිසස්ස, බලමැදුම් පිරිමිහුගේ (හස්තයෙන්) සමන්තතො, හාත්පසින්; උදකුක්ඛෙපෙන, උදකුක්ඛෙපයෙන්; පරිච්ඡින්නං, පිරිසුන් කිරීම යි.

කථම්පන, කෙසේ වනාහි; උදකං, ජලය; උක්ඛිපිතබ්බන්ති, ඉසියයුතු දැයි; අක්ඛධුත්තා, අක්ෂධූර්තයෝ; දරුගුළං, පසඇට; යථා,

මජ්ඣිමෙන පුරිසෙන සබ්බථාමෙන ඛිපිතබ්බං. යත්ථ එවං ඛිත්තං උදකං වා වාලිකං වා පතති අයමෙකො උදකුක්ඛෙපො. තස්ස අන්තො හත්ථපාසං විජහිත්වා ඨිතො කම්මං කොපෙති. යාව පරිසා වඩ්ඪති තාව සීමාපි වඩ්ඪති. පරිසපරියන්තතො උදකුක්ඛෙපො යෙව පමාණං, ජාතස්සරසමුද්දෙසුපි එසෙව නයො. එත්ථ ච සචෙ නදී නාතිදීඝා හොති පභවතො පට්ඨාය යාව මුඛද්වාරා සබ්බත්ථ සඞ්ඝො නිසීදති උදකුක්ඛෙපසීමාකම්මං නත්ථි සකලාපි නදී එතෙසං යෙව භික්ඛූනං පහොති. යම්පන මහාසුමත්ථෙරෙන වුත්තං යොජනං පවත්තමානා යෙව නදී තත්‍රාපි උපරි අඩ්ඪයොජනං පහාය හෙට්ඨා අඩ්ඪයොජනෙ කම්මං කාතුං වට්ටතීති.

---

යම්සේ; ඛිපනති, දමද්ද? (වීසි කෙරේද්ද?;) එවං, එපරිද්දෙන්; උදකං වා, ජලය හෝ; වාලිකං වා, වැලි හෝ; හත්ථෙන, අතින්; ගහෙත්වා, ගෙණ; ථාමමජ්ඣිමෙන පුරිසෙන, බලමැදුම් පුරුෂයකු විසින්; සබ්බථාමෙන, සියලු ශක්තියෙන්; ඛිපිතබ්බං, දමා ගැසිය යුතුය; එවං, මෙසේ; ඛිත්තං, ඉසිනලද; උදකං වා, ජලය හෝ; වාලිකං වා, වැලි හෝ; යත්ථ, (නදියෙහි) යම් පෙදෙසෙක්හි; පතති, හේද?; (වැටේද?) අයං, මේ; එකො උදකුක්ඛෙපො, එකඋදකුක්ඛෙපයක; තස්ස, ඒ උදකුක්ඛෙපයාගේ; අන්තො, ඇතුළත; හත්ථපාසං, අත්පස; විජහිත්වා, හැර; ("අඩ්ඪතෙය්‍ය හත්ථසඞ්ඛාතා හත්ථපාසා" යනුයෙන් කම්හී හස්තපාශ ප්‍රමාණය ව්‍යඪ හස්තය සිකීහු. මේ කියනලද අත්පසින් වෙන්ව) ඨිතො, සිටියේ; කම්මං කොපෙති, කම්කොප්‍ය කරයි; යාව, යම් පමණ තැන්; පරිසා, පිරිස් තොමෝ; වඩ්ඪති, වැඩේද?; තාව, එපමණ තාක්; සීමාපි, සීමාව ත්; වඩ්ඪති, වැඩෙයි; පරිසපරියන්තතො, පිරිස් කෙළවරින්; උදකුක්ඛෙපො එව, උදකුක්ඛෙපය ම; පමාණං, ප්‍රමාණ වේ; ජාතස්සරසමුද්දෙසුපි, ජාතස්සර සමුද්‍රයන්හි ද; එසෙව නයො, මේ ක්‍රමය මයි; එත්ථ ච, මෙහි ද; සචෙ, ඉදින්; නදී, නදීතොමෝ; නාතිදීඝා හොති, ඉතා දික්නු වූවා වේ ද; පභවතො පට්ඨාය, හටගැන්මේ පටන්; මුඛද්වාරා යාව, මුවදොර දක්වා; සබ්බත්ථ, සියලු තන්හි; සඞ්ඝො, සඞ්ඝතෙමේ; නිසීදති, හිඳී ද; උදකුක්ඛෙපසීමාකම්මං, උදකුක්ඛෙපයෙන් සීමාකිරීමක්; නත්ථි, නැත්තේය; සකලාපි නදී, සියලු නදී තොමෝ ම; එතෙසං භික්ඛූනං එව, ඒ භික්ෂූන්ට ම; පහොති, යම්හෙයකින් පොහෝනේ වේද?; (එහෙයිනි) මහාසුමත්ථෙරෙන, මහාසුම්මස්ථවිරයන් විසින්; යොජනං, යොදුනක් තැන්; පවත්තමානා එව, පවත්නා වූ ම; නදී, යම් නදියක් වේ ද?; තත්‍රාපි උපරි, ඒ නදිය මත්තෙහි ද; අඩ්ඪයොජනං පහාය, අඩ යොත්නක්

තං මහාපදුමත්ථෙරෙනෙව පටික්ඛිත්තං. භගවතා හි තිමණ්ඩලං පටිච්ඡාදෙත්වා යත්ථ කත්ථචි උත්තරන්තියා භික්ඛුනියා අන්තරවාසකො තෙමියතීති ඉදං නදියා පමාණං වුත්තං න යොජනං වා අඩ්ඪයොජනං වා, තස්මා යා ඉමස්ස සුත්තස්ස වසෙන පුබ්බෙ වුත්තලක්ඛණා නදී. තස්සා පභවතො පට්ඨාය සඞ්ඝකම්මං කාතුං වට්ටති. සචෙ පනෙත්ථ බහුභික්ඛූ විසුං විසුං කම්මං කරොන්ති සබ්බෙහි අත්තනො ච අඤ්ඤෙසඤ්ච උදකුක්ඛෙපපරිච්ඡෙදස්ස අන්තරා අඤ්ඤො උදකුක්ඛෙපො සීමන්තරිකත්ථාය ඨපෙතබ්බො. තතො අධිකං වට්ටති යෙව. ඌනකම්පන න වට්ටති. ජාතස්සර සමුද්දෙසුපි එසෙව නයොති වුත්තං.

සමන්තා චායං ආහච්චපදවණ්ණනාදිදීපනී.

---

හැර; හෙට්ඨා අඩ්ඪයොජනෙ, යටිඅඩ යොත්නෙහි; කම්මං කාතුං, කම් කරන්ට; වට්ටතීති, වටනේ යයි; යමපන, යමක් වනාහි; වුත්තං, කියන ලද ද.

තං, ඒ කීම; මහාපදුමත්ථෙරෙනෙව, මහාපදුමස්ථවිරයන් විසින් ම; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙප කරණ ලදී; භගවතා හි, භාග්‍යවතුන් වහන්සේ විසින් ම; තිමණ්ඩලං පටිච්ඡාදෙත්වා, තෙමඬුළු වසා; යත්ථ කත්ථචි, යම් කිසි ගඞ්ගාවෙක්හි (බැස;) උත්තරන්තියා, (අඳනාසිවුර නො තෙමා) එතරවන්නා වූ; භික්ඛුනියා, මෙහෙණගේ; අන්තරවාසකො, අඳනාසිවුර; තෙමියති, තෙමීයේද?, ඉති, එහෙයින්; ("තෙමියතීති" යන්නෙහි "ඉති" ශබ්දය "ඉතිරර්ථවිපර්‍ය්‍යාසෙ දූණෙට හෙත්වදමර්ථයොඃ") යනු කීබැවින් මෙහි හෙත්වර්ථයෙහි වැටේ. නදියා, නදියගේ; ඉදං පමාණං, මේ ප්‍රමාණය; වුත්තං, කියන ලදි; යොජනං වා, යොදුන හෝ; අඩ්ඪයොජනං වා, අඩයොජනය හෝ; න, නදියගේ ප්‍රමාණ යයි නො කියනලදී; තස්මා, එහෙයින්; ඉමස්ස සුත්තස්ස වසෙන, මේ සූත්‍රයාගේ වශයෙන්; පුබ්බෙ, පෙර; වුත්තලක්ඛණා, කියනලද ලක්ෂණඇති; යා නදී, යම්නදියක් වේ ද?; තස්සා, ඈගේ; පභවතො පට්ඨාය, හටගැන්මේ පටන්; සඞ්ඝකම්මං කාතුං, සඞ්ඝකම් කරන්ට; වට්ටති, වටී; සචෙ පන, ඉදින් වනාහි; එත්ථ, මෙහි; බහුභික්ඛූ, බොහෝ භික්ෂූහු; විසුං විසුං, වෙනවෙන ම; කම්මං කරොන්ති, කම් කෙරෙත් ද; සබ්බෙහි, සියල්ලන් විසින්; අත්තනො ච, තමන්ගේ ද; අඤ්ඤෙසඤ්ච, අන්‍යයන්ගේ ද; උදකුක්ඛෙපපරිච්ඡෙදස්ස, උදකුක්ඛෙපපරිච්ඡෙදයාගේ; අන්තරා, අතර; අඤ්ඤො උදකුක්ඛෙපො, අන්‍යඋදකොත්ක්ෂෙපයක්; සීමන්තරිකත්ථාය; සීමන්තරිකාපිණිස; ඨපෙතබ්බො, තැබියයුතුයි; තතො අධිකං, ඉන් වැඩියක්; වට්ටති යෙව, වටී මය; ඌනකම්පන, ඊට උනුව; න වට්ටති, නො වටී; ජාතස්සරසමුද්දෙසුපි, ජාතස්සරසමුද්‍රයන්හි ද; එසොවනයොති, මෙ ම ක්‍රමය මැ යි; වුත්තං, කියන ලදී.

**අයං ආහච්චපදවණ්ණනාදිදීපනී.**

මේ ආහච්චපදවණ්ණනාදි දීපනීතොමෝ; සමන්තා ච, සමාප්ත කරණ ලදූ.

කම්මාරහාසීමා ච නාමායං බද්ධාබද්ධවසෙන දුවිධා. තාසු බද්ධසීමා නාම ඛණ්ඩසීමා සමානසංවාසසීමා අවිප්පවාසසීමාති තිවිධා. අබද්ධසීමා නාම ගාමසීමා සත්තබ්භන්තරසීමා උදකුක්ඛෙපසීමාති තිවිධා. තාසු ඛණ්ඩසීමා නාම මතෙන විසෙසෙත්වා අට්ඨකථායං වුත්තාපි පාළියං එව අන්තොගධා. එවං ඡසීමායො හොන්ති. යථා නදීපාරසීමා බද්ධසීමාය එවං විසුංගාමසීමා ගාමසීමාය පරියාපන්නා හොති. සීමාලඞ්කාරසඞ්ගහෙපි ~ "සඞ්ඝකම්මාරහා සීමා–බද්ධාබද්ධවසා ද්විධා, තිධා බද්ධා තථාබද්ධා–ඉති ඡධාව දීපිතාති" ~ අරඤ්ඤසීමා නදීසීමාති අඤ්ඤාපි පාළිමුත්තකා ද්වෙසීමායො පොත්ථකෙසු දිස්සන්ති ~ කස්මා පන බුද්ධෙන භගවතා සීමා අනුඤ්ඤාතා. කිත්තාවතා නු ඛො එකාවාසො හොතීති භික්ඛූනං පරිවිතක්කං ආරොචනමාරබ්භ එකාවාසස්සෙව සාමග්ගියා භවිතබ්බතො වග්ගකම්ම පරිහරණෙන සඞ්ඝකම්මකරණසුඛත්ථං අනුඤ්ඤාතා ~ තෙනාහ උපොසථක්ඛන්ධකෙ.

---

කම්මාරහා, උපසම්පදාදි සඞ්ඝකර්මයට යොග්‍ය වූ; අයංසීමා ච නාම, මේ සීමාතොමෝ නම්; බද්ධාබද්ධවසෙන, බද්ධසීමා අබද්ධසීමා යන මොවුන්ගේ වශයෙන්; දුවිධා, දෙපරිද්දෙකින් වෙයි; තාසු, ඒ දෙදෙන අතුරෙහි; බද්ධසීමා නාම, බද්ධසීමා නම්; ඛණ්ඩසීමා; ඛණ්ඩසීමාය; සමානසංවාසසීමා, සමානසංවාසසීමාය; අවිප්පවාස සීමා, අවිප්පවාසසීමායයි; තිවිධා, තුන්පරිද්දෙකින් වෙයි; අබද්ධසීමා නාම, අබද්ධසීමා නම්; ගාමසීමා, ගාමසීමාය; සත්තබ්භන්තරසීමා, සත්තබ්භන්තරසීමාය; උදකුක්ඛෙපසීමාති, උදකුක්ඛෙපසීමායයි; තිවිධා, තුන්පරිද්දෙකින් වෙයි; තාසු, ඔවුන් අතුරෙන්; ඛණ්ඩසීමා, ඛණ්ඩසීමාතොමෝ; නාම මතෙන, නාමමාත්‍රයෙන්; විසෙසෙත්වා, වෙසෙසා; අට්ඨකථායං, අටුවායෙහි; වුත්තාපි, කියනලද්දී නමුදු; පාළියං එව, පෙළෙහි ම; අන්තොගධා, ඇතුළත් වෙයි; එවං, මෙප රිද්දෙන්, ඡසීමායො හොන්ති, ෂට්සීමාකෙනෙක් වෙත්; නදීපාර සීමා, නදීපාරසීමාතොමෝ; යථා, යම්සේ; බද්ධසීමාය, බද්ධසීමාවෙහි ඇතුළත්වේද?; එවං, එපරිද්දෙන්; විසුංගාමසීමා, විසුංගාමසීමා තොමෝ; ("විසුං පුථුභූතො ගාමො විසුංගාමො") ගාමසීමාය, ගාම සීමාවෙහි; පරියාපන්නා හොති, ඇතුළත් වූවා වෙයි, සීමාලඞ්කාර සඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහිද; සඞ්ඝකම්මාරහා සීමා– බද්ධාබද්ධවසා ද්විධා, තිධා බද්ධා තථාබද්ධා– ඉති ඡධාව දීපිතාති, "සඞ්ඝ කම්මාරහාසීමා=පෙ=ඉතිඡධාව දීපිතා" යනු කීහු; අරඤ්ඤසීමා, අරඤ්ඤ සීමාය; නදීසීමාති, නදීසීමායයි; අඤ්ඤාපි, අනිකුදු; පාළිමුත්තකා, පෙළෙන් උදුරණ ලද; ද්වෙ සීමායො, සීමාදෙ දෙනෙක්; පොත්ථකෙසු, පොත්වල; දිස්සන්ති, දක්නා ලැබෙත්;

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ යථාපරිසාය පාතිමොක්ඛං උද්දිසන්ති සකාය සකාය පරිසාය, භගවතො එතමත්ථං ආරොචෙසුං, න භික්ඛවෙ යථාපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං සකාය සකාය පරිසාය, යො උද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ සමග්ගානං උපොසථකම්මන්ති ...... අථ ඛො භික්ඛූනං එතදහොසි භගවතා පඤ්ඤත්තං සමග්ගානං උපොසථකම්මං, කිත්තාවතා නු ඛො සාමග්ගි හොති යාවතා එකාවාසො උදාහු සබ්බා පඨවීති, භගවතො එතමත්ථං ආරොචෙසුං, අනුජානාමි භික්ඛවෙ එත්තාවතා සාමග්ගි යාවතා එකාවාසොති ...... පෙ ...... අථ ඛො භික්ඛූනං එතදහොසි, භගවතා පඤ්ඤත්තා එත්තාවතා සාමග්ගි යාවතා එකාවාසොති කිත්තාවතා නු ඛො එකාවාසො හොතීති, භගවතො එතමත්ථං ආරොචෙසුං, අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නිතුන්ති ......

---

කස්මා පන, කුමක් හෙයින් වනාහි; භගවතා, භාග්‍යවත් වූ; බුද්ධෙන, බුදුරජානන්වහන්සේ විසින්; සීමා, සීමාතොමෝ; අනුඤ්ඤාතා, අනුදන්නා ලද්දී ද?; කිත්තාවතානුඛො, කොපමණකින් වනාහි; එකාවාසො හොතීති, එකාවාසය වේ දැයි යන; භික්ඛූනං, භික්ෂූන්ගේ; පරිවිතක්කාරොචනං, විතර්කාරොචනය, ආරබ්භ, අරභයා; එකාවාසස්සෙව, එකාවාසයට ම; සාමග්ගියා, සමගිය; භවිතබ්බතො, වියයුතු බැවින්; වග්ගකම්මපරිහරණෙන වර්ගකර්ම දුරුකිරීමෙන්; සඞ්ඝකම්මකරණසුඛත්ථං, සඞ්ඝකර්මකිරීමේ පහසුව සඳහා; අනුඤ්ඤාතා, අනුදන්නාලදී. උපොසථක්ඛන්ධකෙ, උපොසථක්ඛන්ධකයෙහි; තෙන, එහෙයින්; ආහ; වදාළසේක;

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; ඡබ්බග්ගියා භික්ඛූ, ෂඩ්වර්ගීය භික්ෂූහු; සකාය සකාය පරිසාය, ස්වකීය ස්වකීය පිරිසට; (නොහොත්) තමතමන්ගේ පිරිස්හි; යථාපරිසාය, පිරිස් වූ පරිද්දෙන්; පාතිමොක්ඛං, පාමොක්; උද්දිසන්ති, උදෙසත්; ("පාතිමොක්ඛං" යනු, තත්ථ සීලං යො නං පාති මොක්ඛෙති මොචයති ආපායිකාදීහි දුක්ඛෙහි අත්තානුවාදාදීහි වා භයෙහීති පාතිමොක්ඛං" යි කීහු.) භගවතො, භාග්‍යවතුන්වහන්සේට; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසුං, සැලකළාහුය; භික්ඛවෙ, මහණෙනි; සකාය සකාය පරිසාය, ස්වකීය ස්වකීය පිරිසට; යථාපරිසාය, පිරිස්වූ පරිද්දෙන්; පාතිමොක්ඛං, පාමොක්; න උද්දිසිතබ්බං, නො උදෙසියයුතු යි; යො, යමෙක්; උද්දිසෙය්‍ය, උදෙසන්නේ නම්; දුක්කටස්ස, දුකුළාව සම්බන්ධ; ආපත්ති, ඇවත වේ, භික්ඛවෙ, මහණෙනි; සමග්ගානං, සමගි වූවන්ට; උපොසථකම්මං; උපොසථකර්මය; අනුජානාමි ඉති, අනුදනිමි යි වදාළසේක; අථ

අයමෙත්ථ සනිදානා පාළි ~~~ එවං අනුජානන්තො බුද්ධො සො භගවා ආදිතොව නිමිත්තකිත්තනෙන සීමාසම්මන්නනාකාරං දස්සෙසි, තං උපරි පකාසයිස්සාම ~~~ එත්ථ යා පන සීමා සමන්තා සීමන්තරිකාය පරිච්ඡින්නා අඤ්ඤෙහි බද්ධසීමාහි අසම්භෙදෙන සමන්තතො බන්ධිතා අයං බද්ධසීමා නාම, සීමාලඞ්කාරසඞ්ගහෙපි ~~~ යා සීමන්තරිකායාසි-පරිච්ඡින්නා සමන්තතො, බද්ධසීමාති සා වුත්තා-පරිතො බන්ධිතා යතොති ~~~ යා පන සීමා නදීසමුද්දජාතස්සරබද්ධසීමාවිරහිතෙ භූමිපබ්බතපාසාණපිට්ඨාදිප්පදෙසෙ සම්මතා තියොජනපරමා අයං මහාසීමාසඞ්ඛාතා සමානසංවාසසීමා නාම, වුත්තං හෙතං, අනුජානාමි භික්ඛවෙ තියොජනපරමං සීමං සම්මන්නිතුන්ති, සීමාලඞ්කාරසඞ්ගහෙපි ~~~

---

බො, ඉක්බිත්තෙන්; භික්ඛූනං, භික්ෂූන්ට; එතං අහොසි, මෙබඳු සිතක් විය; (කෙබඳුසිතක්ද? යත්.) භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; සමග්ගානං, සමගි වූවන්ට; උපොසථකම්මං, උපෝසථ කර්මය; පඤ්ඤත්තං, පනවන ලද්දේය; කිත්තාවතා නු ඛො, කොපමණකින් වනාහි; සාමග්ගී හොති, සමගිය වේද?; යාවතා, යම්පමණකින්; එකාවාසො, එක්සීමාවෙක්හි විසීම වේ ද?; උදහු, නැතහොත්; සබ්බාපඨවීති, සියලු පෘථිවියෙහි විසීම වේ දැයි යන සිත වූයේ ය; භගවතා, භාග්‍යවතුන්වහන්සේට; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසුං, දැන්වූහ; භික්ඛවෙ, මහණෙනි; යාවතා, යම්පමණකින්; එකාවාසො; එකාවාසය වේ ද?; එත්තාවතා, එපමණකින්; සාමග්ගී, සමගිය වේ යයි වදාළසේක; අථ ඛො, එකල්හි වනාහි; භික්ඛූනං, භික්ෂූන්ට; එතං අහොසි, මේ සිත වීය; (කෙබඳු සිතක් ද? යත්.) භගවතා, භාග්‍යවත්හු විසින්; යාවතා, යම්පමණකින්; එකාවාසො, එකාවාසය වේ ද?; එත්තාවතා, එපමණකින්; සාමග්ගී, සාමග්‍රිය; පඤ්ඤත්තා ඉති, පනවන ලද්දීය යන සඞ්කල්පය වීය. (වැලි දු) කිත්තාවතා නු ඛො, කොපමණකින් වනාහි; එකාවාසො හොතීති, එකාවාසය වේ දැයි; භගවතො, භගවත්හට; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසුං, දැන්වූහ; භික්ඛවෙ, මහණෙනි; සීමං සම්මන්නිතුං, සීමාසම්මුතිකරණයට; අනුජානාමි ඉති, අනුදනිමි යි වදාළසේක.

එත්ථ, මෙහි; අයං, මේ; සනිදානා පාළි, නිදාන සහිත පෙළ යි; එවං, මෙසේ; අනුජානන්තො, අනුදත වදාරන්නා වූ; භගවා, භාග්‍යවත් වූ; සො බුද්ධො, ඒ බුදුරජතෙම; ආදිතොව, පළමු කොට ම; නිමිත්තකිත්තනෙන, නිමිතිකීර්තනයෙන්; සීමාසම්මන්නනාකාරං, සීමාසම්මුතික්‍රමය; දස්සෙසි, දක්වා වදාළසේක. තං, එය; උපරි, මත්තෙහි; පකාසයිස්සාම, ප්‍රකාශකරන්නෙමු; එත්ථ, මෙහි; යා සීමා

වුත්තා සමානසංවාසා–සීමන්තරිකතො බහි, ජාතස්සරනදී සින්ධු–බද්ධසීමාහි වජ්ජිතෙ… භූමිපබ්බතපාසාණ – පිට්ඨාදිසම්නතු සම්මතා, ගාමෙරඤ්ඤපදෙසෙ වා–විසෙසවා වීහි තෙහිපි… සීමා තියොජනුක්කංසා–මහාසීමාති සම්මතා, බහිද්ධාසන්නසීමානං සීමන්තරිකනිස්සටාති… යා පන සීමා උපචාරසහිතං ගාමං විනා චීවරාවිප්පවාසාය සම්මතා බද්ධසීමා එව අයං අවිප්පවාසසීමා නාම, පාළියං පන, සීමං භික්ඛවෙ සම්මන්නන්තෙන පඨමං සීමා සම්මන්නිතබ්බා පච්ඡා තිචීවරෙන අවිප්පවාසො සම්මන්නිතබ්බොති වුත්තං,

---

පන, යම් සීමාවක් වනාහි; සමන්තා, හාත්පස්හි; සීමන්තරිකාය, සීමාන්තරිකාවෙන්; (සීමාන්තරිකා නම්:- බද්ධසීමාවන් දෙදෙනා අතුරෙහි ඔවුන් දෙදෙනාගේ වෙන් කිරීම පිණිස තබන ලද යටත් පිරිසෙයින් සතරඟුල් පමණවූ ද ග්‍රාමසීමාවට අයත්භූමිප්‍රදෙශය යි. "සීමානං උභින්නං බද්ධසීමානං අන්තරෙ මජ්ඣෙ භවා සීමන්තරිකා") පරිච්ඡින්නා, පිරිසුන්වීද?; අඤ්ඤාහි බද්ධසීමාහි, අන් බදසිම් සමග; අසම්භෙදෙන, මිශ්‍ර නො වනභාවයෙන්; සමන්තතො, හාත්පස්හි; ඛණ්ඩිතා, පිරිසුන් වීද; අයං, මේ තොමෝ; ඛණ්ඩසීමා නාම, ඛණ්ඩ සීමා නම් වේ; සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහි ද; යා සීමන්තරිකායාසි… පෙ… ඛණ්ඩිතා යතොති, "යා සීමන්තරිකායාසි… පෙ… ඛණ්ඩිතා යතො" යනු කීහු; යා පන සීමා, යම් සීමාවක් තොමෝ වනාහි; නදී, ගංගාය; සමුද්ද, සමුද්‍රය; ජාතස්සර, ස්වයඤ්ජාත විල්ය; බද්ධසීමාවිරහිතෙ, අන්‍යබද්ධසීමාය යන මොවුන් කෙරෙන් තොර වූ; භූමි, පොළවය; පබ්බත, පර්වතය; පාසාණපිට්ඨාදිප්පදෙසෙ, පිටිපහන්ය යනාදි ප්‍රදෙශයෙහි; (මෙහි "ආදි" ශබ්දයෙන් පාසාණකුටිලෙනාදිය ගත්හු.) සම්මතා, සම්මතකරණ ලද්දී වූ; තියොජනපරමා, තුන්යොදුන් උත්කෘෂ්ටපරිච්ඡෙද කොට ඇති සීමාවක් වේද?; අයං, මේ තොමෝ; මහාසීමාසඞ්ඛාතා, මහාසීමාසඞ්ඛ්‍යාත වූ; සමානසංවාසසීමා නාම, සමානසංවාසසීමා නම් වේ; භික්ඛවෙ, මහණෙනි; තියොජනපරමං, තුන්යොදුන් උත්කෘෂ්ට පරිච්ඡෙද කොට ඇති; සීමං, සීමාව; සම්මන්නිතුං, සම්මත කිරීමට; අනුජානාමි ඉති, අනුදනිමි යි; එතං, මෙය; වුත්තං හි, වදාරන ලද මැයි. (තිණ්ණං යොජනානං සමාහාරො තියොජනං, තියොජනං පරමං පමාණමෙතිස්සාති තියොජනපරමා-තං තියොජනපරමං. සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහි ද;

වුත්තා සමානසංවාසා… පෙ… නිස්සටාති "වුත්තා සමානසංවාසා… පෙ… නිස්සටා" යනු කීහු; යා පන සීමා, යම් සීමාවක් වනාහි; උපචාරසහිතං ගාමං, උපචාරසහිත වූ ග්‍රාමය; විනා, හැර; චීවරාවිප්පවාසාය, තුන්සිවුරෙන් වියෝ නො වීම පිණිස; සම්මතා,

සීමාලඞ්කාරසඞ්ගහෙපි … චීවරාවිප්පවාසාය බද්ධසීමාව සම්මතා,
සො පචාර විනා ගාමං විප්පවාසාති දීපිතාති … යා පන සීමා
භික්ඛූනමුපනිස්සාය විහරණාරහානං ගාමනිගමනගරාදීනං සමන්ත
තො කරග්ගාහෙන පරිච්ඡින්නප්පදෙසො අයං ගාමසීමා නාම,
වුත්තං හෙතං, අසම්මතාය භික්ඛවෙ සීමාය අට්ඨපිතාය යං ගාමං වා
නිගමං වා උපනිස්සාය විහරන්ති යා තස්ස ගාමස්ස වා ගාමසීමා
නිගමස්ස වා නිගමසීමා අයං තත්ථ සමානසංවාසා එකූපොසථාති,

---

අවිප්පවාසනම් වදනින් සම්මුති කරණ ලද්දී ද; බද්ධසීමා එව, ඒ බද්ධ
සිම ම; අයං අවිප්පවාසසීමා නාම, මේ අවිප්පවාසසීමා නමු;
("අවිප්පවාසත්ථං සම්මතා සීමා අවිප්පවාසසීමා") පාළියං පන,
පෙළෙහි වනාහි; භික්ඛවෙ, මහණෙනි; සීමං සම්මන්නන්තෙන, සීමා
සම්මත කරන්නහු විසින්; පඨමං, පළමු කොට; සීමා, සීමාතොමෝ;
සම්මන්නිතබ්බා, සම්මත කටයුත්තීය; පච්ඡා, පසු ව; තිචීවරෙන,
තුන්සිවුරෙන්; අවිප්පවාසො, අවිප්පවාසයතෙම; සම්මන්නිතබ්බො
ති, සම්මතකටයුතු යයි; වුත්තං, වදාරණ ලදී; සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහි ද; චීවරාවිප්පවාසය … පෙ … දීපි
තාති "චීවරාවිප්පවාසාය … පෙ … දීපිතා" යනු කීහු. (උපචාරසහිත වූ
ගම හැර තුන්සිවුරෙන් වියෝ නො වීම පිණිස අවිප්පවාසනම්
වදනින් සම්මුති කරණ ලද යථොක්ත බද්ධසීමාව ම අවිප්පවාසසීමාව
යයි ප්‍රකාශ කරණ ලදු. ඉටු තුන්සිවුරු අතරෙන් එක්තරා සිවුරක්
සම්මුති නො ලද මහණෙක් අත්පසින් වෙන් කොට අරුණෙක්
නැගු ව ඒ සිවුර නිසගි වෙයි. ගාමගාමොපචාරයන් හැර අවිප්පවාස
සීමාවෙහි එසේ කළ නිසගි නො වෙයි. මේ අවිප්පවාසසීමාවේ
ප්‍රයොජන යි.) යා පන සීමා, යම් ගාමසීමාවක් (ගම් කෙතක්) භික්ඛූ
නං උපනිස්සාය, භික්ෂූන් ඇසුරු කොට; විහරණාරහානං, විහරණ
යට සුදුසු වූ; ගාමනිගමනගරාදීනං, ගාමනිගමනගරාදීන්ගේ;
සමන්තතො, හාත්පස්හි; කරග්ගාහෙන, අයබදු ගැන්මෙන්; පරි
ච්ඡින්න, පිරිසුන් කරණ ලද; පදෙසො, යම් ප්‍රදෙශයක් වේ ද?; අයං,
ඒ මේ ප්‍රදෙශය; ගාමසීමානාම, ගාමසීමානම් වේ; ("ගාමො එව සීමා
ගාමසීමා") භික්ඛවෙ, මහණෙනි; සීමාය, බද්ධසීමාවක්; අසම්මතාය,
සම්මත නොකරණ ලද කල්හි; අට්ඨපිතාය, පිරිසුන් නො කරණ ලද
කල්හි; යං, යම්බදු වූ; ගාමං වා, ගමක් හෝ; නිගමං වා, නිගමයක්
හෝ; උපනිස්සාය, ඇසුරු කොට; විහරන්ති, වෙසෙත් ද?; තස්ස ගා
මස්ස වා, ඒ ග්‍රාමයාගේ හෝ; යා ගාමසීමා, යම් ගාමසීමාවක් වේද?;
නිගමස්ස වා, නිගමයාගේ හෝ; යා නිගමසීමා, යම් නිගමසීමාවක්
වේද?; අයං, මෝ තොමෝ; තත්ථ, එහි; සමානසංවාසා, සමානසං

සීමාලඞ්කාරසඞ්ගහෙපි ෴ ගාමාදීනං සාරග්ගාහ-පරිච්ඡින්නා සමන්තතො, පදෙසො ගාමසිමාති-අබද්ධායං පකාසිතාති ෴ යා පන සීමා අගාමකෙ අරඤ්ඤස්මිං සමන්තා භික්ඛූනං සීතොකාසතො පට්ඨාය සත්තබ්භන්තරෙන පරිච්ඡින්නා අයං සත්තබ්භන්තරසීමා නාම, වුත්තම්පි චෙතං, අගාමකෙ චෙ භික්ඛවෙ අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා අයං තත්ථ සමානසංවාසා එකූපොසථාති, සීමාලඞ්කාරසඞ්ගහෙපි ෴ අගාමකෙ අරඤ්ඤස්මිං සත්තබ්භන්තරසම්මතා,

---

වාස ඇති; එකූපොසථාති, එකූපොසථයක් ඇති සීමාව වේ යයි; එතං, මෙය; වුත්තං හි, වදාරණ ලද මැයි; ("ගාමගහණෙන චෙත්ථ නගරම්පිගහිතමෙව හොති" යනු අටුවා යි.)

සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහි ද; ගාමාදීනං සාරග්ගාහ ෴ පෙ ෴ පකාසිතාති, "ගාමාදීනං සාරග්ගාහ ෴ පෙ ෴ පකාසිතා" යනු කීහු; යා පන සීමා, යම් සීමාවක් වනාහි; අගාමකෙ, ග්‍රාමක්ෂෙත්‍ර විරහිත වූ; ("ගාමො එව ගාමකො, ගාමකෙන ගාමක්ඛෙත්තෙන විරහිතො අගාමකො,) තස්මිං අගාමකෙ, අරඤ්ඤස්මිං, අරණ්‍යයෙහි; භික්ඛූනං සීතොකාසතො පට්ඨාය, භික්ෂූන් සිටි තැන් පටන්; සමන්තා, හාත්පස්හි; සත්තබ්භන්තරෙන, සත්අබතුරකින්; පරිච්ඡින්නා, පිරිසුන් කරණ ලද්දී ද; අයං, මේ තොමෝ; සත්තබ්භන්තරසීමා නාම, සත්තබ්භන්තර සීමා නම් වේ; (මෙහි අබ්භන්තර පරිච්ඡේදය නම්:- භික්ෂූන් සිටි තැන් පටන් නැගෙණහිරට සත්අබතුරෙක්ය, දකුණ බටහිර උතුරටත් එසේ ම වෙයි, "විනිබ්බෙධෙන චුද්දස හොන්ති" යනු අටුවා බැවින් සීමාවගේ නැගෙණහිර කෙළවර පටන් බටහිරකෙළවර දක්වා තුදුස් අබතුරුය, දකුණ පටන් උතුරටත් මෙසේ ම ය, (අබතුරෙක් නම්:- ප්‍රමාණ මධ්‍යම පුරුෂයාගේ රියනින් අටවිසිරියනෙක් වේ.) භික්ඛවෙ, මහණෙනි; අගාමකෙ, ග්‍රාමක්ෂෙත්‍රවිරහිත වූ; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; සමන්තා, හාත්පස්හි; සත්තබ්භන්තරා, සත්අබතුර කින් පිරිසිඳින ලද සීමාවක්; චෙ, ඉදින් වන්නී ද; අයං, මේ තොමෝ; තත්ථ, එහි; සමානසංවාසා, සමානසංවාස ඇති; ("සමානො සංවාසො එත්ථාති සමානසංවාසා") එකූපොසථාති, එකූපොසථයක් ඇති සීමාව වේ යයි; එතං, මෙය; වුත්තම්පි ච, වදාරනලද මැ යි ("එකො උපොසථො එත්ථාති එකූපොසථා") සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහි ද; අගාමකෙ අරඤ්ඤස්මිං ෴ පෙ ෴ සඤ්ඤිතාති, "අගාමකෙ අරඤ්ඤස්මිං ෴ පෙ ෴ සඤ්ඤිතා" යනු කීහු. මාතිකට්ඨකථායම්පි, මාතෘකාඅටුවායෙහි ද; අගාමකෙ, ග්‍රාමක්ෂෙත්‍ර විරහිත වූ; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; සමන්තා, හාත්පස්හි; සත්තබ්භන්තරා, සත්අබතුරු ඇත්තී; සත්තබ්භන්තරසීමා නාම,

සීමාසම්මන්නතො යං තු–සත්තබ්භන්තරසඤ්ඤිතාති මාතිකාට්ඨකථායම්පි, අගාමකෙ අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා සත්තබ්භන්තරසීමා නාම, තත්ථ අගාමකං නාම, අරඤ්ඤං විඤ්ඣාටවිආදිසුවා සමුද්දමජ්ඣෙ වා මච්ඡබන්ධානං අගමනපථෙසු දීපකෙසු ලබ්භති, සමන්තා සත්තබ්භන්තරාති මජ්ඣෙ ඨිතානං සබ්බදිසාසු සත්තබ්භන්තරා විනිබ්බෙධෙන චුද්දස හොන්ති,

තත්ථ එකං අබ්භන්තරං අට්ඨවීසතිහත්ථප්පමාණං හොති, අයඤ්ච සීමා පරිසවසෙන වඩ්ඪති තස්මා සමන්තා පරිසපරියන්තතො පට්ඨාය අබ්භන්තරපරිච්ඡෙදො කාතබ්බො, සචෙ පන ද්වෙ සඞ්ඝා විසුං උපොසථං කරොන්ති ද්වින්නං සත්තබ්භන්තරානං අන්තරෙ අඤ්ඤමෙකං සත්තබ්භන්තරං උපචාරත්ථාය

---

සත්තබ්භන්තරසීමා නම් වේ; තත්ථ, එහි; අගාමකං නාම, අගාමක නම්; අරඤ්ඤං, අරණ්‍ය යයි, විඤ්ඣාටවිආදිසු වා, වින්ධ්‍යවනාදියෙහි හෝ; සමුද්දමජ්ඣෙ වා, මුහුදමැද හෝ; මච්ඡබන්ධානං, මසුන් බඳින්නන්ට; අගමනපථෙසු, යා නොහැකිමාගී වූ; දීපකෙසු, දූපත්වල; ලබ්භති, ලැබෙයි; ("ද්විධා ආපො ගතො එත්ථාති දීපො, දීපො එව දීපකො, තෙසු දීපකෙසු") සමන්තා සත්තබ්භන්තරාති, "සමන්තා සත්තබ්භන්තරා" යනු; මජ්ඣෙ ඨිතානං, මැදසිටියවුන් විසින්; සබ්බදිසාසු නැගෙණහිරආදි සියලුදිශාවන්හි; සත්තබ්භන්තරා, සත්අබතුරෙන් පිරිසුන්කරණ ලද්දීද;

විනිබ්බෙධෙන, දිගින්; (නොහොත්) නැගෙණහිර කෙළවර පටන් බටහිර කෙළවර දක්වා, චුද්දස හොන්ති, තුදුස් අබතුරෙක් වෙත්; තත්ථ, ඒ තුදුස් අබතුරෙහි; එකං අබ්භන්තරං, එක් අබතුරෙක්; අට්ඨවීසතිහත්ථප්පමාණං හොති, (ප්‍රමාණ මධ්‍යම පුරුෂයාගේ රියනින්) අටවිසිරියනක් පමණවේ; (මෙහි "පමාණං" යනු, "මත්ත" ශබ්දපරියාය බැවින් "මත්තසද්දො බහුභාවංනිවත්තෙන්ති" යනු කී හෙයින් සත්තබ්භන්තර සීමාතොමෝ ද සත්අබතුරු ප්‍රමාණ යයි කියන ලද්දී ද යථොක්ත ප්‍රමාණයෙන් උනු වූවා ද, යම් හෙයකින් වථී ද, එහෙයින් අගාමකාරඤ්ඤ යයි කියන ලද තමන්ගේ ක්ෂෙත්‍රයෙහි යථොක්ත ප්‍රමාණයෙන් වැඩි වූවා නො ලැබෙයි යනු භාවයි.) අයඤ්ච සීමා, මේ සීමාතොමෝ ද; පරිසවසෙන, පිරිසගේ (ගැවසීම්) වශයෙන්; වඩ්ඪති, වැඩෙයි; තස්මා, එහෙයින්; සමන්තා, හාත්පස්හි; පරිසපරියන්තතො පට්ඨාය, පිරිස් කෙළවර පටන්; අබ්භන්තරපරිච්ඡෙදො, අබතුරු පරිච්ඡෙදය; කාතබ්බො, කටයුතුයි; සචෙ පන, ඉදින් වනාහි; ද්වෙ සඞ්ඝා, සඟ දෙකොටසක්; විසුං, වෙන් ව; උපොසථං කරොන්ති, පොහෝ කෙරෙද්ද?; ද්වින්නං

ඨපෙතබ්බන්ති වුත්තං…යා පන සීමා යථාවුත්තලක්ඛණසමඞ්ගීනං නදීආදීනං අන්තො ථාමමජ්ඣිමස්ස පුරිසස්ස උදකුක්ඛෙපෙන සමන්තතො පරිච්ඡින්නා අයං උදකුක්ඛෙපසීමා නාම, පාළි පනෙත්ථ හෙට්ඨා දස්සිතා යෙව, සීමාලඞ්කාරසඞ්ගහෙපි…අන්තො නජ්ජා සමුද්දස්ස–තථා ජාතස්සරස්ස ච, මජ්ඣිමස්සොදකුක්ඛෙපා පරිච්ඡින්නා සමන්තතො, උදකුක්ඛෙපසීමාති අබ්ඪායං පදීපිතාති… පාළිමුත්තකා අරඤ්ඤසීමා එවං දට්ඨබ්බා, බද්ධසීමාගාමනිගමනගරනදීසමුද්දජාතස්සරවිරහිතො අටවිප්පදෙසො ච අථවා විඤ්ඣාටවිසදිසො ච

ගාමතො නික්ඛමිත්වා තදහෙව නිවත්තිතුං අසක්කුණෙය්‍යභූතො සමුද්දන්තරන්තරදීපාදිප්පදෙසො නිම්මනුස්සාවාසො වාති සබ්බමෙතං සත්තබ්භන්තරසීමාය ඛෙත්තං අරඤ්ඤසීමාති උපලබ්භති, පාළියම්පන ඉමස්මිං ඨානෙ ආගමසො වෙ භික්ඛවෙ

---

සත්තබ්භන්තරානං අන්තරෙ, (ඒ පොහෝකම් කරණ සඟ දෙකොටසගේ සත් අබ්තුරු දෙසීමාවන් අතර; අඤ්ඤං, අනික්; එකං සත්තබ්භන්තරං, එක් සත් අබ්තුරක්; උපචාරත්ථාය, උපචාරය පිණිස; ඨපෙතබ්බන්ති, තැබියයුතු යයි; වුත්තං, කියන ලදී; යා පන සීමා, යම් සීමාවක් වනාහි; යථාවුත්තලක්ඛණසමඞ්ගීනං, යථොක්ත ලක්ෂණයෙන් යුක්ත වූ; නදීආදීනං, නදී ආදීන්ගේ; අන්තො, ඇතුළත; ථාමමජ්ඣිමස්සපුරිසස්ස, බල මැදුම් පිරිමිහුගේ (අතින්;) උදකුක්ඛෙපෙන, දිය නගා දැමීමෙන්; සමන්තතො, හාත් පස්හි; පරිච්ඡින්නා, පිරිසුන් කරණ ලද්දී ද?; අයං, මේතොමෝ; උදකුක්ඛෙපසීමා නාම, උදකුක්ඛෙපසීමා නම් වෙයි; පාළි පන, පෙළ වනාහි; එත්ථ, මෙහි; හෙට්ඨා දස්සිතා යෙව, යට දක්වන ලද්දී ම ය; සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාර සඞ්ග්‍රහයෙහි ද; අන්තොනජ්ජා සමුද්දස්ස…පෙ…පදීපිතාති, "අන්තොනජ්ජා සමුද්දස්ස…පෙ…පදීපිතා" යනු කීහු; පාළිමුත්තකා, පෙළෙන් උදුරා කියන ලද; අරඤ්ඤසීමා, අරණ්‍යසීමාතොමෝ; එවං, මෙසේ; දට්ඨබ්බා, දතයුත්තීය. බද්ධසීමා, බද්ධසීමාය; ගාම, ගාමසීමාය; නිගම, නිගමසීමාය; නගර, නගරසීමාය; නදී, නදීසීමාය; සමුද්ද, සමුද්‍ර සීමාය; ජාතස්සර, ජාතස්සරසීමාය යන මොවුන් කෙරෙන්; විරහිතො, වෙන් වූ; අටවිප්පදෙසො ච, අරණ්‍ය ප්‍රදෙශය ද; අථවා, නොහොත්; විඤ්ඣාටවිසදිසො ච, වින්ධ්‍යාවනය සමානවූ ද.

ගාමතො, ගමින්; නික්ඛමිත්වා, නික්මී; තදහෙව, එදවස් ම නිවත්තිතුං, (පෙරළා අවුත්) නවතින්ට; අසක්කුණෙය්‍යභූතො; නොහැකි වු; සමුද්දන්තරන්තරදීපාදිප්පදෙසො ච, මුහුදු අතර අතුරු දූපත් ආදි ප්‍රදෙශය ද; නිම්මනුස්සාවාසොවාති, අමනුෂ්‍යාවා

අරඤ්ඤ'ති අරඤ්ඤලක්ඛණං එත්තකමෙව දිස්සති, තථාපි තස්මිං තස්මිං ඨානෙ අනෙකවිධං අරඤ්ඤලක්ඛණං ආගතං, පාළියම්පි සාමඤ්ඤතො වුත්තත්තා අට්ඨකථාදිසු ආගතො නයො සුත්තානුලොමිකො ඉච්ඡිතබ්බො...අට්ඨකථායම්පන, තත්ථ අගාමකො වෙති ගාමනිගමනගරසීමාහි අපරිච්ඡින්නො අටවිප්පදෙසෙ, අථවා අගාමකො වෙති විඤ්ඣාටවිසදිසෙ අරඤ්ඤෙති වුත්තං, විමතිවිනොදනියම්පි, විඤ්ඣාටවිසදිසෙ අරඤ්ඤෙති යත්ථ අසුකගාමස්ස ඉදං ඛෙත්තන්ති ගාමවොහාරො නත්ථි යත්ථ පන නෙව කසන්ති න වපන්ති තාදිසෙ අරඤ්ඤෙ, මච්ඡබන්ධානං අගමනපථා නිම්මනුස්සාවාසා සමුද්දන්තරදීපකාපි එතෙව සඞ්ගය්හන්ති.

---

සයදූයි යන; එතං සබ්බං, මේ සියල්ල; සත්තබ්භන්තරසීමාය; සත්තබ්භන්තරසීමාවගේ; ඛෙත්තං, ක්ෂෙත්‍රයවෙයි; (ඛිත්තං බීජං තායතීති ඛෙත්තං) අරඤ්ඤසීමාති අරඤ්ඤසීමායි කියා ද; උපලබ්භති, සලකනු ලැබේ, පාළියම්පන, පෙළෙහි වනාහි; ඉමස්මිං ඨානෙ, මෙතැන්හි; අගාමකෙ වෙ භික්ඛවෙ අරඤ්ඤෙති, අගාමකෙ වෙ...පෙ...අරඤ්ඤෙ" යනුවෙන්; අරඤ්ඤලක්ඛණං, අරණ්‍යලක්ෂණය; එත්තකං එව, මෙපමණක් ම; දිස්සති, දක්නා ලැබේ; තථාපි, එසේ ද වුවත්; තස්මිං තස්මිං ඨානෙ, ඒ ඒ තන්හි; අනෙකවිධං, නොයෙක් ප්‍රකාරවූ; (එකං විධං පකාරං යස්ස තං එකවිධං, න එකවිධං අනෙකවිධං) අරඤ්ඤලක්ඛණං, අරණ්‍යලක්ෂණය; ආගතං, ආයේයි. පාළියම්පි පෙළෙහි ද; සාමඤ්ඤතො, සාමාන්‍යයෙන්; වුත්තත්තා කියනලද හෙයින්; අට්ඨකථාදිසු, අටුවා කථාදියෙහි; ආගතො ආ වාවූ සුත්තානුලොමිකො නයො, සූත්‍රානුලොමික වූ ක්‍රමයතෙම ඉච්ඡිතබ්බො, කැමතිවියයුතුයි; අට්ඨකථායම්පන, අටුවායෙහි වනාහි; තත්ථ අගාමකෙ වෙති, "තත්ථ අගාමකෙව" යනුවෙන්; ගාමනිගමනගරසීමාහි, ගාමනිගමනගරසීමාවන් ගෙන්; (ගාමො ච නිගමො ච නගරඤ්ච,ගාමනිගමනගරා–තා යෙව සීමායො ගාමනිගමනගරසීමායො, තාහි ගාමනිගමනගරසීමාහි) අපරිච්ඡින්නො, පිරිසුන් නුවූ; අටවිප්පදෙසෙ, අරණ්‍යප්‍රදෙශයෙහි කියනලදී; අථවා, නොහොත්; අගාමකෙ වෙති, "අගාමකෙව" යනු වෙන්; විඤ්ඣාටවිසදිසෙ, වින්ධ්‍යවනය සමාන වූ; අරඤ්ඤෙති, අරණ්‍යයෙහි යයි; වුත්තං, කියනලදී; විමතිවිනොදනියම්පි, විමතිවිනොදනියෙහි ද; විඤ්ඣාටවිසදිසෙ අරඤ්ඤෙති, "විඤ්ඣාටවිසදිසෙ අරඤ්ඤෙ" යනුවෙන්; යත්ථ, යම්තැනෙක්හි; අසුකගාමස්ස, අසවල් ග්‍රාමයාගේ; ඉදං ඛෙත්තන්ති, මේ ක්ෂෙත්‍ර යයි; ගාමවොහාරො, ග්‍රාම ව්‍යවහාරයක්; නත්ථි, නැත්තේ ද?; යත්ථ පන, යම් තැනෙක්හි වනාහි; නෙව කසන්ති, නො ම සාද්ද?; න වපන්ති, නො ම වපුරත්ද?;

යං හි අගාමක්ඛෙත්තභූතං නදීසමුද්දජාතස්සර විරහිතං පදෙසං තං සබ්බං අරඤ්ඤසීමාති වෙදිතබ්බං, සා ච සත්තබ්භන්තර සීමං විනාව සයමෙව සමානසංවාසා බද්ධසීමා සදිසා.

නදී ආදිසු විය සබ්බ'මෙප'තං තත්ථ සඞ්ඝකම්මං කාතුංවට්ටතී'ති ආදිනා පපඤ්චිතං ...... තත්ථෙව, එකස්මිං චක්කවාළෙ ගාමනදීසමුද්දජාතස්සරෙ මුඤ්චිත්වා තදවසෙසං අමනුස්සාවාසං දෙවබ්‍රහ්මලොකං උපාදාය සබ්බං අරඤ්ඤමෙව, ගාමො වා අරඤ්ඤං වාති වුත්තත්තා හි නදීසමුද්දජාතස්සරාපි අරඤ්ඤමෙව, ඉධ පන නදීආදීනං විසුං සීමාභාවෙන ගහිතත්තා තදවසෙස මෙව, අරඤ්ඤන්ති ගහෙතබ්බං, තත්ථ ච යත්තකෙ පදෙසෙ එකං අරඤ්ඤන්ති වොහරන්ති අය මෙකා අරඤ්ඤසීමා, ඉන්දපුරමපි සබ්බං එකාරඤ්ඤසීමා, තථා අසුරයක්ඛපුරාදි, ආකාසට්ඨකදෙවබ්‍රහ්මවිමානානි පන සමන්තා ආකාසපරිච්ඡින්නානි පච්චෙකං අරඤ්ඤසීමා සමුද්දමජ්ඣෙ පබ්බත දීපකා විය, තත්ථ සබ්බත්ථ සත්තබ්භන්තරසීමාය අරඤ්ඤසීමාය මෙව වාතිකම්මං කාතබ්බං,

---

තාදිසෙ අරඤ්ඤෙ, එබඳු අරණ්‍යයෙහි (වුත්තං, අරණ්‍ය ලක්‍ෂණය කියනලදී;) මච්ඡබන්ධානං, මසුන් බඳින්නන්ට; අගමනපථා, (එක දවසකින්) ගමනාගමනය නො කොටහැකි මාර්ගය වූ; නිම්මනුස්සා වාසා, අමනුෂ්‍යාවාස වූ; සමුද්දන්තරදීපකාපි, මුහුද අතර දූපත් ද; එත්ථෙව, මෙහිම; සඞ්ගණ්හීයන්ති, සඞ්ග්‍රහ කරණුලැබෙත්.

අගාමක්ඛෙත්තභූතං, ග්‍රාමක්‍ෂෙත්‍රවිරහිත වූ; ("ගාමො යෙව ඛෙත්තභූතො – ගාමක්ඛෙත්තභූතො – නගාමක්ඛෙත්තභූතො-අගාමක්ඛෙත්තභූතො, තං අගාමක්ඛෙත්තභූතං") නදීසමුද්දජාතස්සර විරහිතං, නදීසමුද්‍රජාතස්සර විරහිත වූ; යං හි පදෙසං, යම් ප්‍රදෙශ යක් ම වේ ද; තං සබ්බං, ඒ සියලු ප්‍රදෙශය; අරඤ්ඤසීමාති, අරඤ්ඤසීමා යයි; වෙදිතබ්බං, දතයුතු යි; සා ච, ඕ තොමෝ ද; සත්තබ්භන්තරසීමං විනාව, සත්තබ්භන්තරසීමාව හැර ම; සයමෙව, තෙමේ ම; සමානසංවාසා, සමානසංවාස ඇති; බද්ධසීමාසදිසා, බද සිම් සමානය; (බජ්ඣතෙති බද්ධා බද්ධා ච සා සීමා චාති බද්ධසීමා බද්ධ සීමාය සදිසා-බද්ධසීමාසදිසා") නදීආදිසු විය, නදීආදියෙහිමෙන්; තත්ථ, එහි; එතං සබ්බමපි සඞ්ඝකම්මං, ඒ සියලු ම සඞ්ඝකර්ම; කාතුං, කරන්ට; වට්ටතීති, වටනේය යන; ආදිනා, මේ ආදි ක්‍රමයෙන්; පපඤ්චිතං, විස්තර කරණ ලදී; තත්ථෙව, එහි ම; එකස්මිං චක්ක වාළෙ, එක්සක්වලෙක්හි; ගාමනදීසමුද්දජාතස්සරෙ, ගාමනදීසමුද්‍ර ජාතස්සරයන්; මුඤ්චිත්වා, හැර; තං අවසෙසං, ඉන් සෙසු; අමනුස්ස වාසං, අමනුෂ්‍යාවාසය ද; දෙවබ්‍රහ්මලොකං, දිව්‍යබ්‍රහ්මලොකය ද

තස්මා ඉධාපි උපරි අරඤ්ඤතලෙන සද්ධිං හෙට්ඨා පථවියා ඒකා'රඤ්ඤවොහාරාභාවා විසුං අරඤ්ඤසීමාති ගහෙතබ්බාති ච ලිඛිතං. යා පන සීමා, සබ්බා භික්ඛවෙ නදී අසීමාති ආදිනා නදීආදීනං අන්තො බද්ධසීමාය සම්මන්නනමෙව යදි පටික්ඛිත්තං භවෙය්‍ය න සබ්බසො අසීමභාවෙන, තස්මා යථාවුත්තලක්ඛණා අයං නදීසීමා නාම, අට්ඨකථායම්පි, සා පන අත්තනො සභාවෙනෙව බද්ධසීමසදිසා, සබ්බඤ්ඤෙවත්ථ සඞ්ඝකම්මං කාතුං වට්ටති, සමුද්ද

---

උපාදාය, ග්‍රහණය කොට; සබ්බං, සියල්ල; අරඤ්ඤමෙව, අරණ්‍යය මැයි; ගාමා වා අරඤ්ඤවාති, "ගාමා වා අරඤ්ඤෙ වා" යනුවෙන්; වුත්තත්තා හි, කියනලද බැවින් ම; නදීසමුද්දජාතස්සරාපි, නදීසමුද්‍ර ජාතස්සරයෝ ද; අරඤ්ඤමෙව, අරණ්‍යයෙ ම ය; ඉධ පන, මෙහි වනාහි; නදීආදීනං, නදී ආදිය තමන්; විසුංසීමාභාවෙන, විසුංසීමා භාවයෙන්; (උදකුක්ඛෙපයෙන් වෙන් කරගණු ලබන සීමා හෙයින්) ගහිතත්තා, ගන්නාලද බැවින්; තං අවසෙසං එව, ඉන් අවශෙෂවූ ම ප්‍රදෙශය; අරඤ්ඤන්ති, අරණ්‍ය යයි; ගහෙතබ්බං, ගතයුතු යි; තත්ථ ච, එහි ද; යත්තකෙ පදෙසෙ, යම්පමණ ප්‍රදෙශයෙක් හි; එකං අරඤ්ඤන්ති, එකම අරණ්‍යයයි; වොහරන්ති, ව්‍යවහාරකෙරෙද් ද?; අයං, මෝතොමෝ; එකාරඤ්ඤසීමා, එකාරඤ්ඤසීමා වේ; සබ්බං ඉන්දපුරම්පි, සියලු ඉන්ද්‍රපුරය ද; එකාරඤ්ඤසීමා, එකාරඤ්ඤසීමායි; අසුරයක්ඛපුරාදි, අසුරයක්ඛපුරාදිය ද; තථා, එසේ මැ යි; ආකාසට්ඨකදෙවබ්‍රහ්මවිමානානි පන, ආකාසට්ඨකදෙවබ්‍රහ්මවිමානයෝ වනාහි; සමන්තා, හාත්පස්හි; පච්චෙකං, වෙනවෙන ම; ආකාසපරිච්ඡින්නානි, අහසෙහි පිරිසුන් වූවාහ; අරඤ්ඤසීමා, අරඤ්ඤ සීමාතොමෝ; සමුද්දමජ්ඣෙ, මුහුදු මැද; පබ්බතදීපකා විය, පර්වත හා දූපත් මෙනි; තත්ථ සබ්බත්ථ, ඒ සියලු තන්හි; සත්තබ්භන්තරසීමාය, සත්තබ්භන්තරසීමායෙහි; අරඤ්ඤසීමාය මෙව වාති, අරණ්‍යසීමාවෙහි ම කියා හෝ; කම්මං කාතබ්බං, කම් කටයුතුයි;

තස්මා, එහෙයින්; ඉධාපි, මෙහි ද; උපරි, අරඤ්ඤතලෙන සද්ධිං, මතු අරණ්‍යතලය සමග; හෙට්ඨා පථවියා, යට පොළවෙහි; එකාරඤ්ඤවොහාරාභාවා, හුදෙක් අරණ්‍ය ව්‍යවහාරයක් නැති බැවින්; විසුංඅරඤ්ඤසීමාති, විසුං අරඤ්ඤසීමා යයි; ගහෙතබ්බාති ච, ගතයුතු යයි ද; ලිඛිතං, ලියනලදී; යා සීමා පන, යම් සීමාවක් වනාහි; "සබ්බා භික්ඛවෙ නදීඅසීමාති, "සබ්බා භික්ඛවෙ නදී අසීමා" යන; ආදිනා, මේ ආදි වශයෙන්; නදීආදීනං, නදී ආදීන්ගේ; අන්තො, ඇතුළත; බද්ධසීමාය, බද්ධසීමාවගේ; සම්මන්නනං එව, සම්මුතකිරීම ම; යදි, ඉදින්; පටික්ඛිත්තං න භවෙය්‍ය, ප්‍රතික්ෂෙප්

ජාතස්සරෙසුපි එසෙව නයොති වුත්තං—විමතිවිනොදනියම්පන, නදීසමුද්දජාතස්සරානං තාව අට්ඨකථායං අත්තනො සභාවෙන බද්ධසීමාසදිසානි ආදිනා වුත්තත්තා සීමතා සිද්ධාති ආගතං, සමුද්දජාතස්සරාදයොපි එත්ථෙව සඞ්ගහං ගච්ඡන්ති—ඉදං හි බද්ධසීමාදීනං සඞ්ඛෙපතො පාසඞ්ගිකාවසෙන පරිදීපනං අභිමතත්ථස්සාපි පයොජනත්තෙන චෙත්ථ වුත්තන්ති දට්ඨබ්බං.

සමත්තා චා’යං සීමාසාමඤ්ඤදීපනී.

---

කරණ ලද්දේ නො වන්නේ ද?; (වන්නේ මය.) කුමක්හෙයින්ද? යත්.) සබ්බසො, සර්වප්‍රකාරයෙන්; අසීමභාවෙන, සීමාබවෙක් නො වන හෙයිනි; (නදී ආදීන්ගේ ඇතුළත බද්ධසීමාභාවය සිද්ධ නො වන බැවින් ප්‍රතික්ෂෙප කරණ ලදැයි සේයි.) (යස්මා, නදී ආදීන්ගේ ඇතුළත බද්ධසීමාභාවය යම්හෙයකින් සිද්ධනොවේද?.) තස්මා, එහෙයින්; යථාවුත්තලක්ඛණා, යථොක්තලක්ෂණ ඇති; අයං, මේතොමෝ; නදීසීමා නාම, නදීසීමාතම් වේ; සා පන, ඒ නදී සීමාතොමෝ වනාහි; අත්තනොසභාවෙනෙව, තමන් නිසර්ගයෙන් ම; බද්ධසීමසදිසා, බදසිම් සමානය; (එබැවින්) එත්ථ, මෙහි; සබ්බඤ්ච සඞ්ඝකම්මං, සියලු ම සඞ්ඝකර්ම, කාතුං, කරන්ට; වට්ටති, වටී; සමුද්දජාතස්සරෙසුපි, සමුද්දජාතස්සරයන්හි ද; එසෙව නයොති, මෙ ම ක්‍රම යයි; අට්ඨකථායම්පි, අටුවායෙහි ද; වුත්තං, කියනලදී; නදීසමුද්දජාතස්සරානං, නදීසමුද්‍රජාතස්සරසීමාවන්; තාව, පළමු කොට අට්ඨකථායං, අටුවායෙහි; අත්තනො සභාවෙන, තමන්ගේ ස්වභාවයෙන්; බද්ධසීමාසදිසානි, බද්ධසීමා සමානයයි; ආදිනා, මේ ආදි වශයෙන්; වුත්තත්තා, කියන ලද බැවින්; සීමතා, සීමාභාවය; සිද්ධාති, සිද්ධ යයි; ආගතං, ආයේ යි; සමුද්දජාතස්සරාදයොපි, සමුද්‍රජාතස්සරාදි සීමාවෝ ද; එත්ථෙව, මෙහි ම; සඞ්ගහං ගච්ඡන්ති, සඞ්ග්‍රහයට යෙත්; ඉදං හි, මෙය වනාහි; බද්ධසීමාදීනං, බද්ධසීමාදීන්ගේ; සඞ්ඛෙපතො, පිඩුකිරීමෙන්; පාසඞ්ගිකාවසෙන, ප්‍රාසඞ්ගිකාවශයෙන්; ප්‍රසඞ්ගනම්:–එක් යම්දෙයක් කරන්නට පටන්ගත්කල්හි කාරණයක් නැතුව ම අනිකක් සම්භව වීමයි. මෙහි අභිප්‍රාය නම්:–උදකුක්ඛෙපාදි සීමාවන්ගේ ලක්ෂණ දක්වන්ට යාමෙන් අනිකුදු බද්ධසීමාදීන්ගේ ස්වභාව අවයව දක්වන්ට ලැබීම ප්‍රසඞ්ගයෙන් සිද්ධ යයි දතයුතු. “පසඞ්ගා ආගතං පාසඞ්ගිකං, “පසඞ්ග” ශබ්දයා කෙරෙන් ආගතාර්ථයෙහි “යෙනවා” යනාදියෙහි “වා” ග්‍රහණයෙන් “ණික” වූ තැනි.) පරිදීපනං, දැක්වීම; එත්ථ, මෙහි; අභිමතත්ථස්සාපි, අභිමතාර්ථයාගේ ද; පයොජනත්තෙන ච, ප්‍රයොජන භාවයෙන් ද; විමතිවිනොදනියං පන, විමතිවිනොදනියෙහි වනාහි; වුත්තන්ති, කියන ලදැයි; දට්ඨබ්බං, දතයුතුයි.

ඉතො පරං යථාවුත්තා'භිමතත්ථමෙව වක්ඛාම ‒ පාළියම්පන අබද්ධසීමාසඞ්ඛාතානං උදකුක්ඛෙපසීමාදීනං අඤ්ඤමඤ්ඤං සම්බන්ධෙ සති සම්භෙදජ්ඣොත්ථරණදොසා නා'නුඤ්ඤාතා, තථාපි අට්ඨකථායම්පන යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතාවචාදිනා පච්ඡා සම්මතාය අසීමත්තඤ්ච නියමෙත්වා, න භික්ඛවෙ සීමාය සීමා සම්භින්දිතබ්බාති ආදිනා උභින්නං බද්ධසීමානං සම්භෙද'ජ්ඣොත්ථරණදොසෙ ච පරිවජ්ජෙත්වා, අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්මන්නිතුන්ති තාසං අන්තරා සීමන්තරිකං ඨපෙත්වා

---

අයං සීමාසාමඤ්ඤදීපනී, මේ සීමාසාමඤ්ඤදීපනී තොමෝ; සමත්තාව, සමාප්ත කරණලදූ.

ඉතො පරං, මෙයින් මතු; යථාවුත්තඅභිමතත්ථං එව, යථොක්ත අභිමතාර්ථය ම ; වක්ඛාම, කියන්නෙමු; පාළියම්පන, පෙළෙහි වනාහි; අබද්ධසීමාසඞ්ඛාතානං, අබද්ධසීමාසඞ්ඛ්‍යාත වූ; උදකුක්ඛෙපසීමාදීනං, උදකුක්ඛෙපසීමාදීන්ගේ; අඤ්ඤමඤ්ඤසම්බන්ධෙ සති, ඔවුනොවුන් (එකිනෙකට) සම්බන්ධයෙක් ඇතිකල්හි; සම්භෙදජ්ඣොත්ථරණදොසා, සීමාසම්භෙදජ්ඣොත්ථරණදොසයෝ; නානුඤ්ඤාතා, අනු නො දන්නා ලදහ; තථාපි, එසේද වුවත්; අට්ඨකථායම්පන, අටුවායෙහි වනාහි; යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතා ඉති "යෙසං භික්ඛවෙ=පෙ=සම්මතා" යන; ආදිනා, මේ ආදිවශයෙන්, පච්ඡා සම්මතාය, (ප්‍රථම සම්මත සීමාව සම්භින්දනය කොට) පසුව බඳින ලද සීමාවගේ; අසීමත්තඤ්ච, අසීමභාවය ද; නියමෙත්වා; නියම කොට; න භික්ඛවෙ සීමාය සීමා සම්භින්දිතබ්බාති, "න භික්ඛවෙ=පෙ=සම්භින්දිතබ්බා" යන; ආදිනා, මේආදි වශයෙන්; උභින්නං බද්ධසීමානං, බද්ධසීමා දෙදෙනාගේ; සම්භෙදජ්ඣොත්ථරණදොසෙ ච, සම්භින්දනඅජ්ඣොත්ථරණ දොෂයන් ද; (සම්භින්දනදොෂය නම්:- තමන්ගේ බද්ධසීමාවෙන් මෙරමාගේ බද්ධසීමාව කොශාග්‍රමාත්‍රයේ පටන් සාමීකිරීමට සතරනමකට නො පොහොනා ප්‍රදෙශය දක්වා, තමන්ගේ සීමාවට ඇතුල් කොට සම්මතකිරීම සීමාසම්භින්දනදොෂ නම්:- අජ්ඣොත්ථරණ දොෂය නම්:- තමන්ගේ බද්ධසීමාවෙන් අනුන්ගේ බද්ධසීමාව මර්දනය කිරීම (හෙවත්) අනුන්ගේ බද්ධසීමාව සියල්ල ම හෝ ඈගේ එකප්‍රදෙශයක් හෝ තමාගේ සීමාවට ඇතුල් කොට බැඳ ගැණීම සීමා අජ්ඣොත්ථරණ දොෂ නම්.) පරිවජ්ජෙත්වා, දුරු කොට; අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්මන්නිතුන්ති, "අනුජානාමි භික්ඛවෙ=පෙ=සම්මන්නිතුං" යනුවෙන්; තාසං අන්තරා ඒ බද්ධසීමාවන් අතර; සීමන්තරිකං ඨපෙත්වා, (අසම්මිශ්‍රභාවය පිණිස) සීමන්තරිකාය තබා; සම්මන්නිතුං, සම්මත කිරීමට; අනුඤ්ඤාතසුත්තසාමත්ථියෙන ච, අනු

සම්මන්නිතුං අනුඤ්ඤාතසුත්තසාමග්ගියෙන ච, අබද්ධසීමානම්පි තාසං උප්පත්තිකාලෙ වෙව පච්ඡා ච පාළිමුත්තකො සම්භෙදදොසො පටික්ඛිත්තො, තථා සීමන්තරිකා ච වුත්තා, තෙනාහ උදකුක්ඛෙප සීමාකථායං...... නදියා පන කම්මං කරිස්සාමා'ති ගතෙහි සචෙ නදී පරිපුණ්ණා හොති සමතිත්තිකා උදකසාටිකං නිවාසෙත්වාපි අන්තො නදියං යෙව කම්මං කාතබ්බං, සචෙ න සක්කොන්ති නාවායපි ඨත්වා කාතබ්බං,

ගච්ඡන්තියා පන නාවාය කාතුං න වට්ටති, කස්මා? උදකුක්ඛෙපමත්තමෙව හි සීමා තං නාවා සීඝමෙව අතික්කමති, එවං සති අඤ්ඤිස්සා සීමාය ඤත්ති අඤ්ඤිස්සා අනුසාවනා හොති, තස්මා නාවං අරිත්තෙන වා ඨපෙත්වා පාසාණෙ වා ලම්බෙත්වා අන්තොනදියං ජාතරුක්ඛෙ වා බන්ධිත්වා කම්මං කාතබ්බං...... අන්තොනදියං බද්ධ අට්ටකෙපි අන්තොනදියං ජාතරුක්ඛෙපි ඨිතෙහි කාතුං වට්ටති,

---

දන්නාලද සූත්‍රසාමග්‍රියෙන් ද; අබද්ධසීමානම්පි, අබද්ධසීමාවන්ගේ ද; තාසං, ඔවුන්ගේ; උප්පත්තිකාලෙවෙව, උත්පත්ති කාලයෙහි ද; පච්ඡා ච, පසුව ද; පාළිමුත්තකො, පෙළෙන් උදුරණලද්දා වූ; සම්භෙදදොසො, සඞ්කරදොෂයතෙම; පටික්ඛිත්තො, ප්‍රතික්ෂෙප කරණලදී; (සඞ්කර, සම්භෙද, සම්බන්ධ, යනු එකාර්ථයි.) තථා, එසේ ම; සීමන්තරිකා ච, සීමන්තරිකා ද; වුත්තා, කියන ලදී; උදකුක්ඛෙපකථායං, උදකෝත්ක්ෂෙප කථායෙහි; තෙන, එහෙයින්; ආහ, කීය; නදියා පන, නදියෙහි වනාහි; කම්මං කරිස්සාම ඉති, කම් කරන්නෙමු යයි; ගතෙහි, පැමිණියවුන් විසින්; සචෙ, ඉදින්; නදී, නදීතොමෝ; පරිපුණ්ණාහොති, පිරුණා වේ ද; සමතිත්තිකා, සමව පිණාගිය තොට ඇත්තී වේද; ("සමතිත්තිකානති" භාවනපුං සකනිද්දෙසො.")

("බ්‍යඤ්ජනම්පන අනාදියිත්වා අත්ථමත්තමෙව දස්සෙතුං" සමතිත්තිකා යනු යොදන ලදී.)

ගච්ඡන්තියා, යන්නාවූ; නාවාය පන, නැවෙහි වනාහි; කාතුං; කම් කරන්ට; නවට්ටති, නො වටී; කස්මා, කුමක්හෙයින් ද? යත්; හි, යම්හෙයකින්; සීමා, සීමාතොමෝ; උදකුක්ඛෙපමත්තං එව, උදකුක්ඛෙපමාත්‍රය ම; වේ ද? (එහෙයිනි;) තං, ඒ සීමාව; නාවා, නැව් තොමෝ; සීඝං එව, සීඝ්‍රව ම; අතික්කමති, ඉක්ම වයි; එවං සති එසේ ඇතිකල; අඤ්ඤිස්සා සීමාය, අනික් සීමාවෙක්හි; ඤත්ති, ඤත්තිය වෙයි; අඤ්ඤිස්සා, අන්සීමාවෙක්හි; අනුසාවනා, අනුසාවණාව වේ; තස්මා, එහෙයින්; නාවං, නැව; අරිත්තෙන වා, පලුපතින් හෝ; (රිටකින් හෝ) ඨපෙත්වා, නවත්වා; පාසාණෙ වා, පාෂාණ

සචෙ පන රුක්ඛස්ස සාඛා වා තතො නික්ඛන්තපාරොහො වා බහිනදීතීරෙ විහාරසීමාය වා ගාමසීමාය වා පතිට්ඨිතො, සීමං වා සොධෙත්වා සාඛං වා ඡින්දිත්වා කම්මං කාතබ්බං ...... බහිනදීතීරෙ ජාතරුක්ඛස්ස අන්තොනදිං පවිට්ඨසාඛාය වා පාරොහෙ වා නාවං බන්ධිත්වා කම්මං කාතුං නවට්ටති, කරොන්තෙහි සීමං වා සොධෙතබ්බා ඡින්දිත්වා වාස්ස බහි පතිට්ඨිතභාවො නාසෙතබ්බො ...... නදීතීරෙ පන ඛාණුකං කොට්ටෙත්වා තත්‍ථ බද්ධනාවාය නවට්ටති යෙව ...... නදියං සෙතුං කරොන්ති සචෙ අන්තොනදියං යෙව සෙතු වා සෙතුපාදා වා සෙතුම්හි ඨිතෙහි කම්මං කාතුං වට්ටති, සචෙ පන සෙතු වා සෙතුපාදා වා.

---

යන් හෝ; ලම්බෙත්වා, එල්බ ගෙණ; අන්තොනදියං, ඇතුල් නදියෙහි; ජාතරුක්ඛෙ වා, හටගත් රුකෙහි හෝ; බන්ධිත්වා, බැඳ; කම්මං කාතබ්බං, කම් කටයුතුයි; අන්තොනදියං, ඇතුල් නදියෙහි; බද්ධෙ, බඳිනලද; අට්ටකෙපි, අටල්ලෙහි ද; අන්තොනදියං, නදිය තුළ; ජාතරුක්ඛෙපි, හටගත් රුකෙහි ද; ඨිතෙහි, සිටියවුන් විසින්; කාතුං, කම් කරන්ට; වට්ටති, වටී; සචෙ පන, ඉදින් වනාහි; රුක්ඛස්ස, වෘක්ෂයාගේ; සාඛාවා, ශාඛාවක් හෝ; තතො, ඒ රුකින්; නික්ඛන්තපාරොහො වා, නික්මුනු අරළුවක් හෝ; බහිනදීතීරෙ, පිට ගංඉවුරෙහි; විහාරසීමාය වා, බඩසීමාවෙහි හෝ; ගාමසීමාය වා, ගාමසීමාවෙහි හෝ; පතිට්ඨිතො, පිහිටියේවේ ද; සීමං වා, සීමාව හෝ; සොධෙත්වා, ශුඬ කොට; සාඛං වා, ශාඛාව හෝ; ඡින්දිත්වා, සිඳ; කම්මං කාතබ්බං, කම් කටයුතුයි; බහිනදීතීරෙ, පිට ගංඉවුරෙහි; ජාතරුක්ඛස්ස, හටගත් වෘක්ෂයාගේ; අන්තොනදිං, නදිය තුළට; පවිට්ඨසාඛාය වා, පිවිටු අත්තෙහි හෝ; පාරොහෙ වා, අරළුවෙහි හෝ; නාවංබන්ධිත්වා, නැව බැඳ; කම්මං කාතුං, කම් කරන්ට; න වට්ටති, නො වටී; කරොන්තෙහි, කරන්නන් විසින්; සීමං වා, සීමාව හෝ; සොධෙතබ්බං, ශුඬ කටයුත්තීය; අස්ස, මේරුක අත්ත හෝ අරළුව හෝ; ඡින්දිත්වා වා, සිඳ හෝ; බහිපතිට්ඨිතභාවො, බැහැර පිහිටි සවභාවය; නාසෙතබ්බො, නැසියයුතුයි; නදීතීරෙ පන, ගංඉවුරෙහි වනාහි; ඛාණුකං කොට්ටෙත්වා, කණුවක් සිටුවා; තත්‍ථ, එහි; බද්ධනාවාය, බඳින ලද නැවෙහි; න වට්ටතියෙව, කම්කරන්ට නොවටී මය; නදියං, නදියෙහි; සෙතුං කරොන්ති, හෙයක් කොරේද්ද; සචෙ, ඉදින්; අන්තොනදියං එව, නදියතුළ ම; සෙතු වා, හෙය හෝ; සෙතුපාදා වා, හේදඹුකණු හෝ වේද් ද; සෙතුම්හිඨිතෙහි, හෙයෑ සිටියවුන් විසින්; කම්මං කාතු , කම් කරන්ට; වට්ටති, වටී; සචෙ පන, ඉදින් වනාහි; සෙතු වා, හෙය හෝ; සෙතුපාදා වා, හේදඹුකණු හෝ;

බහිතීරෙ පතිට්ඨිතා කම්මං කාතුං නවට්ටති සීමං සොධෙත්වා කාතබ්බං, අථ සෙතුපාදා අන්තො සෙතු පන උභින්නම්පි තීරානං උපරි ආකාසෙ ඨිතො වට්ටතී'ති.—— එත්ථ, සචෙ පන රුක්ඛස්ස සාඛා වා ඡවාදීනං ච, බහි නදීතීරෙ ජාතරුක්ඛස්සෙවාදීනං ච නදීතීරෙ පන බාණුකං කොට්ටෙත්වා වාදීනාංච, සචෙ පන සෙතු වා සෙතුපාදා වා ඡවාදීනං ච, අන්තොනදියං පතිට්ඨිතානම්පි රුක්ඛ නාවා සෙතූනං විසභාගාය බද්ධසීමායවා ගාමසීමායවා සද්ධිං සම්බන්ධෙ විජ්ජමානෙ තත්ථ උදකුක්ඛෙපසීමූප්පත්තියා අභාවතො අට්ඨකථායං කම්මකරණං පටික්ඛිපිත්වා, පුන, සීමං වා සොධෙත්වා ති බද්ධසීමාය වා ගාමසීමාය වා ඨිතභික්ඛූනං හත්ථපාසා'නයනබහිකරණවසෙන

---

බහිතීරෙ, පිට ඉවුරෙහි; පතිට්ඨිතා, පිහිටියාහු වෙද්ද; කම්මං කාතුං, කම්කරන්ට; න වට්ටති, නො වටී; සීමං සොධෙත්වා, සීමාව ශුද්ධ කොට; කාතබ්බං, කම් කටයුතුයි; අථ, නැවත ද; සෙතුපාදා, ඒ දඬුකණු; අන්තො, ගඟ තුළ වෙද් ද; සෙතු පන, හෙය වනාහි; උභින්නම්පි තීරානං, දෙතෙරගේ; උපරි ආකාසෙ, මතු අහසෙහි; ඨිතො,පිහිටියේ; වට්ටතීති, කම් කිරීමට වටිය යනුයි;—— එත්ථ,මෙහි; "සචෙ පන රුක්ඛස්ස සාඛාවාඡවාදීනං ච, "සචෙ පන-පෙ-සාඛා වාඡවාදීනං" යනුවෙන්ද; බහිනදීතීරෙ - පෙ- ජාතරුක්ඛස්සෙවා දීනාංච "බහිනදීතීරෙ-පෙ-රුක්ඛ ස්සෙවවාදීනං" යනුවෙන් ද; සචෙ පන සෙතු වා සෙතුපාදාවාඡවාදීනාංච "සචෙ පන සෙතු වා-පෙ-පාද වාඡවාදීනං" යනුවෙන් ද; අන්තොනදියං, නදිය තුළ; පතිට්ඨිතා නම්පි, පිහිටියාවූ ද; රුක්ඛනාවාසෙතූනං, වෘක්ෂනාවාසෙතූන්ගේ; විසභාගාය බද්ධසීමාය වා, විෂභාගවූ බද්ධසීමාව සමග හෝ; ගාම සීමාය වා සද්ධිං, ගාමසීමාව සමග හෝ; සම්බන්ධෙ විජ්ජමානෙ සම්බන්ධයක් ඇතිකල; තත්ථ, එහි; උදකුක්ඛෙපසීමූප්පත්තියා, උද කුක්ඛෙපසීමාවගේ හටගැන්ම; අභාවතො, නො වනහෙයින්, අට්ඨ කථායං, අටුවායෙහි; කම්මකරණං, කම් කිරීම; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; පුන, නැවත; සීමං වාසොධෙත්වාති, "සීමං වා සොධෙත්වා" යනුවෙන්; බද්ධසීමාය වා, බද්ධසීමායෙහි හෝ; ගාම සීමාය වා, ගාමසීමායෙහි හෝ; ඨිතභික්ඛූනං, සිටිභික්ෂූන්; හත්ථපා සානයන, අත්පසටගැණීම්; බහිකරණවසෙන, බිහිසිම්කිරීම් වශ යෙන්; සොධෙත්වා, ශුද්ධ කොට; තස්සං බද්ධසීමායං වා, ඒ බද්ධසීමා වෙහි හෝ; ගාමසීමායං වා, ගාමසීමාවෙහි හෝ; කම්මකරණං, කම් කිරීම; වුත්තං, කියනලදි; ("අට්ඨකථායං" සි ගම්‍යමාන අර්ථ ඇති හෙයින් නොකීහු) සාඛං වා ඡින්දිත්වා කම්මං කාතබ්බන්ති, "සාඛං වා-පෙ-කාතබ්බං" යන; ඉමිනා, මෙයින්; උදකුක්ඛෙපසීමාය, උද කුක්ඛෙපසීමාවෙහි; කම්මං කාතුකාමානං, කම් කරන්ට රුචි

ඡොඩෙත්වා තස්සං බද්ධසීමායං වා ගාමසීමායං වා කම්මකරණං වුත්තං, සාඛං වා ඡින්දිත්වා කම්මං කාතබ්බන්ති ඉමිනා උදකුක්ඛෙප සීමායං කම්මං කාතුමිච්ඡන්තානං ආධාරභූතස්ස රුක්ඛාදිස්ස විසභාග සීමාහි සද්ධිං විජ්ජමානසම්බන්ධස්ස අපනීතමත්තෙන උදකුක්ඛෙප සීමා සම්භවො ච තත්ථ කම්මකරණාරහභාවො ච දස්සිතො; න පන ඡින්නං නදීබද්ධසීමානං වා නදීගාමසීමානං වා අඤ්ඤමඤ්ඤ සම්බන්ධෙසති

තත්ථ උදකුක්ඛෙප සීමාපි උප්පජ්ජිත්වා එකීභාවං ගච්ඡතීති දස්සිතො ...... යදෙවං වෙමා විසභාගසීමායො එකතො හුත්වා පච්ඡා වා එකක්ඛණෙ වා උප්පජ්ජෙය්‍යුං, වෙපිබද්ධසීමායො එකතො

---

ඇත්තවුන්ට; ආධාරභූතස්ස, ආධාර වූ; රුක්ඛාදිස්ස, වෘක්ෂාදියගේ; විසභාගසීමාහි සද්ධිං, විසභාගසීමාවන් හා; විජ්ජමානසම්බන්ධස්ස, විද්‍යමානසම්බන්ධයාගේ; අපනීතමත්තෙන, පහවීම් මාත්‍රයකදී; උදකුක්ඛෙපසීමාසම්භවො ච, උදකුක්ඛෙපසීමාවගේ හටගැන්ම ද; තත්ථ, එහි; කම්මකරණාරහො ච, කම්කිරීමට සුදුසුබව ද; දස්සිතො, දක්වනලදී; ඡින්නං නදීබද්ධ සීමානං වා, නදීබද්ධසීමාදෙදෙනාගේ හෝ; නදීගාමසීමානං වා, නදීගාම සීමාදෙදෙනාගේ හෝ; අඤ්ඤමඤ්ඤසම්බන්ධෙ සති, ඔවුනොවුන් සම්බන්ධයක් ඇතිකල;

තත්ථ, එහි; උදකුක්ඛෙපසීමාපි, උදකුක්ඛෙපසීමාතොමෝ ද; උප්පජ්ජිත්වා, ඉපිද; එකීභාවං, සමබවට; න පන ගච්ඡතීති, නොයේම යයි; දස්සිතො, දක්වනලදී; යදි, ඉදින්; එවං, මෙසේ; ඉමා වෙ විසභාගසීමායො, මේ විසභාග සීමා දෙදෙන; එකතො හුත්වා, එකක් ව; පච්ඡා වා, පසුව හෝ, එකක්ඛණෙ වා, එකක්ෂණයෙහි හෝ; උප්පජ්ජෙය්‍යුං, උපදින්නාහු නම්; වෙපි බද්ධසීමායො, බදසිම් දෙදෙනා ද; එකතො හුත්වා, එකක් ව; උප්පජ්ජිතුං, හටගැණීමට; භබ්බා හොන්ති, භව්‍යවෙත්; එවං සති, එසේ ඇතිකල්හි; පාළියාපි, පෙළට ද; අට්ඨකථාදීහිපි, අටුවාකථාදියට ද; විරුජ්ඣති, විරුඬ වෙයි; පාළියා පන, පෙළෙහි වනාහි; "යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතා තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහන්ති 'යෙසං භික්ඛවෙ...පෙ...අට්ඨානාරහං" යනු, වචනතො, වදාළහෙයින්; ඡින්නං බද්ධසීමානං විය, බද්ධසීමා දෙදෙනාගේ මෙන්; සබ්බාසං විසභාගසීමානං, සියලු විසභාගසීමාවන්; එකතො හුත්වා, එක් වෑ; අසම්භවතො එව, හට නො ගන්නාබව ම; සිද්ධා, සිඬය; තස්මා එහෙයින්; උදකුක්ඛෙප බද්ධසීමානංවා, උදකුක්ඛෙප බද්ධසීමාවන්ගේ හෝ; උදකුක්ඛෙප ගාමසීමානං වා, උදකුක්ඛෙපගාමසීමාවන්ගේ හෝ; අඤ්ඤසම්පි විසභාගසීමානං වා; අතිකුද්‍ර විසභාග සීමාවන්ගේ හෝ; එකතො හුත්වා, එක් ව, (මිශ්‍රව) සම්භවො, හට

හුත්වා උප්පජ්ජිතුං භබ්බා හොන්ති, එවං සති පාළියාපි අට්ඨකථාදීහිපි විරුජ්ඣති, පාළියම්පන, යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතා තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහන්ති වචනතො ඡින්නානං බද්ධසීමානං විය සබ්බාසං විසභාගසීමානං එකතො හුත්වා අසම්භවතො එව සිද්ධා ~~~ තස්මා උදකුක්ඛෙප බද්ධසීමානං වා උදකුක්ඛෙප ගාමසීමාන වා අඤ්ඤසම්පි විසභාගසීමාන වා එකතො හුත්වා සම්භවො නත්ථෙවෙති ගහෙතබ්බං, සො පන අට්ඨකථා නයෙන නදී උදකුක්ඛෙප සීමානඤ්ච ගාම බද්ධසීමානඤ්ච අරඤ්ඤ සත්තබ්භන්තරසීමානඤ්ච අඤ්ඤමඤ්ඤසභාගතො විසයවිසයීභාවා යෙව සම්භවො යුජ්ජතෙව, න හි අඤ්ඤමඤ්ඤවිසභාගානන්ති දට්ඨබ්බං ~~~ අයමෙත්ථ විසෙසතො උපරිපි පාකටො හෙස්සති.

සමන්තාවායං පාළිමුත්තකසම්භෙද සම්භෙදාදි දීපනී.

එකච්චෙ පන ථෙරා අන්තොනදියං බද්ධට්ටකස්ස අනාගච්ච සත්තට්ඨරතනතො පරතො ගාමසම්බන්ධෙන එකතො හුත්වාඨිතසෙ

---

ගැණිමෙක්; නත්ථි එව ඉති, නැත්තේ ම යයි; ගහෙතබ්බං, ගත යුතුයි; අට්ඨකථානයෙන, අටුවාකථාක්‍රමයෙන්; නදීඋදකුක්ඛෙප සීමානඤ්ච, නදීඋදකුක්ඛෙප සීමාවන්ගේද ගාම බද්ධ සීමානඤ්ච, ගාමබද්ධ සීමාදෙදෙනාගේ ද; අරඤ්ඤසත්තබ්භන්තරසීමානඤ්ච, අරඤ්ඤසත්තබ්භන්තරසීමාවන්ගේද; අඤ්ඤමඤ්ඤසභාගතො, ඔවුනොවුන් සඤ්ජාතිසීමා හෙයින්; විසයවිසයීභාවාඑව, ආධාර ආධෙය්‍යභාවයෙන් ම; (සීමාවන්ගේ) සො පන සම්භවො, ඒ හට ගැන්ම වනාහි, යුජ්ජතෙ එව, යෙදේ මැයි; (මෙහි භාවය:– අටුවා ක්‍රමයෙන් නදී උදකුක්ඛෙපසීමාදෙදෙනාගේද, ගාමබද්ධසීමාදෙදෙනාගේද, 'අරඤ්ඤසත්තබ්භන්තරසීමාදෙදෙනාගේද, සමානජාතීයවේ, එහෙයින්, උදකුක්ඛෙපසීමාවට නදීසීමාව ආධාරය. උදකුක්ඛෙපසීමාව ආධෙය්‍යයයි, බද්ධසීමාවට ගාමසීමාව ආධාරයි, බද්ධසීමාව ආධෙය්‍යයයි, සත්තබ්භන්තරසීමාවට අරඤ්ඤසීමාව ආධාරයි, සත්තබ්භන්තරසීමාව ආධෙය්‍යයයි,) අඤ්ඤමඤ්ඤවිසභාගානං, ඔවුනොවුන් විසභාගසීමාවන්ගේ; ("සීමානං"යි ගම්‍යමාන අර්ථ හෙයින් නොකීහු.) (එක්ව) මිශ්‍රව හටගැන්මෙක්, නහි දට්ඨබ්බාති, නො ම දතයුතු යයි, අයං අත්ථො, මේ අර්ථයතෙම; උපරිපි, මත්තෙහිද; පාකටො හෙස්සති, ප්‍රකටවන්නේයි;

අයං, මේ; පාළිමුත්තකසම්භෙද සම්භෙදාදි දීපනී, පාළිමුත්තක සම්භෙද සම්භෙද දි දීපනී තොමෝ; සමන්තාව, සමාප්තකරනලදු.

එකච්චෙ ථෙරා පන, ඇතැම් ස්ථවිරහු වනාහි, අන්තොනදියං, ගඟතුළ; බද්ධට්ටකස්ස, බඳින ලද අටල්ලට; අනාගච්ච, නො

තුතො හෙට්ඨා නදීලක්ඛණස්ස විජ්ජමානත්තා උදකුක්ඛෙපෙන වුසිතබ්බතො තං සෙතුකොටිං අන්තො කත්වා උදකුක්ඛෙපසීමා සම්භින්නා හුත්වා උප්පජ්ජතීති වදන්ති, තං තෙසං මතිමත්තං, න සුත්තානුලොමිකං, විසභාගසීමාසම්බන්ධෙන උදකුක්ඛෙපසීමා සම්භවාභාවො වුත්තනයෙනෙව ගහෙතබ්බො. තෙ පනෙත්ථ ථෙරා පාළිඅට්ඨකථාටීකාසු ආගතෙ පාඨෙ අයොනිසො මනසිකාරවසෙන අභිනිවෙසං කත්වා නදීලක්ඛණස්ස විජ්ජමානත්තෙනව මජ්ඣිමපුරිසස්ස සබ්බථාමෙන උක්ඛිත්තොදකපතනොකාසස්ස අප්පහොණකත්තෙන ච සීමාසංකරං වදන්තා එවං ව්‍යාහරන්ති. අන්තොනදියං පන අට්ටකස්සපරිසපරියන්තතො සබ්බථාමෙන

---

හැපී; සත්තට්ඨරතනතො, හත්අටරියනකින්; පරතො, ඉදිරියෙන්; ගාමසම්බන්ධෙන, ගම හා සම්බන්ධයෙන්; එකතො හුත්වා, එකතු ව; ඝිතසෙතුනො, සිටිහෙයගේ; හෙට්ඨා, යට; නදීලක්ඛණස්ස, නදී ලක්‍ෂණය තමා; විජ්ජමානත්තා, විද්‍යමාන බැවින්; උදකුක්ඛෙපෙන, දියනගාදූමීමෙන්; (ජලයගැසීමෙන්) වුසිතබ්බතො, දියසපශී වියහැකි බැවින්; තං සෙතුකොටිං; ඒ හෙයකෙළවර; අන්තො කත්වා, ඇතුල් කොට; උදකුක්ඛෙපසීමා, උදකුක්ඛෙපසීමාතොමෝ; සම්භින්නා හුත්වා, මිශ්‍රව; උප්පජ්ජතීති, උපදීයයි; වදන්ති කියත්; තං, ඒකීම; තෙසං, ඔවුන්ගේ; මතිමත්තං, මතිමාත්‍රයකි; න සුත්තානුලොමිකං, සූත්‍රයට අනුලොම් නො වේ; විසභාගසීමාසම්බන්ධෙන, විජාතීයසීමාසම්බන්ධවීමෙන්; උදකුක්ඛෙපසීමාසම්භවාභාවො, උදකුක්ඛෙපසීමාවගේ හටගැන්මක් නො වීම; වුත්තනයෙනෙව, කියනලදක්‍රමයෙන්ම; ගහෙතබ්බො, ගතයුතුයි; එත්ථ, මෙහි, තෙ පන ථෙරා ඒ තෙරවරු වනාහි; පාළිඅට්ඨකථාටීකාසු, පෙළඅටුවාටීකාවන්හි; ආගතෙපාඨෙ, ආවා වූ පාඨයන්; අයොනිසො මනසිකාරවසෙන, නුනුවතින් මෙනෙහිකිරීම් වශයෙන්; අභිනිවෙසංකත්වා, වරදවා පිහිටා ගෙණ; නදීලක්ඛණස්ස, නදී ලක්‍ෂණයතමා; විජ්ජමානත්තෙනව; විද්‍යමාන බැවින් ද; මජ්ඣිමපුරිසස්ස, බලමැදුම් පිරිමිහුගේ; සබ්බථාමෙන, සියලු ශක්තියෙන්; උක්ඛිත්ත, ඉසිනලද; උදකපතනොකාසස්ස, ජලය වැටීමෙහිඅවකාශයට; අප්පහොණකත්තෙන, නො පොහොණා බැවින්; සීමාසංකරං, සීමාසඞ්කරය; වදන්තා; කියන්නාහු; එවං, මෙසේ; ව්‍යාහරන්ති, ව්‍යවහාර කෙරෙත්; අන්තොනදියං පන, නදියතුළ වනාහි; අට්ටකස්ස, අටලුසම්බන්ධ; පරිසපරියන්තතො, පිරිස්කෙළවරින්; සබ්බථාමෙන, සියලු ශක්තියෙන්; උක්ඛිත්තොදකෙන, ඉසිත ලද ජලයෙන්; යදා, යම්කාලෙක්හි; සෙතුකොටි, හෙයකොණ වුසිතබ්බා සියා, සපශීකටයුතුවේ ද; තදා, එකල්හි; සෙතුපාදා, ඒ

උක්ඛිත්තොදකෙන යදා සෙතුකොටි ඵුසිතබ්බා සියා, තදා සෙතුපාදා උදකුක්ඛෙපසීමාය අන්තොඨිතා හොන්ති, තස්මා උභතොභාගෙන ගාමනදීසීමායො ඵුසිත්වා ඨිතරුක්ඛෙන උපමෙතබ්බාති.—

අයං තෙසං පඨමො වාදො.— තෙසමෙත්ථ නිදස්සනමිදං නෙව යුජ්ජති, ගාමොදකුක්ඛෙපසීමායො ඵුසිත්වා ඨිතසෙතුපාදෙහි ගාමනදීසීමායො ඵුසිත්වා ඨිතො රුක්ඛො කථං උපමෙතබ්බො, තෙසං පුථුභූතත්තා නෙව සමෙති ගාමොදකුක්ඛෙපසීමායො ඵුසිත්වා වා ඉතරාපි විසභාගසීමායො ඵුසිත්වා වා ඨිතරුක්ඛස්ස උපමෙතබ්බතො, නදී පන උදකුක්ඛෙපසීමාය නිස්සයා, ගාමනදීනං සම්බන්ධතො අයම්පන නදීසීමා සම්භින්නාති වා ගාමසීමාසම්භින්නාති

---

දබුසාණු; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමාවෙහි; අන්තො ඨිතා හොන්ති, ඇතුළත සිටියාහු වෙද් ද; තස්මා, එහෙයින්; උභතොභාගෙන, දෙපාර්ශ්වයෙන්; ගාමනදීසීමායො, ගාමසීමා නදීසීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට; ඨිත රුක්ඛෙන, සිටියාවූවෘක්ෂය හා; උපමෙතබ්බාති, උපමාකටයුත්තීයයි; කියායි.—

අයං, මේ; තෙසං, ඔවුන්ගේ; පඨමො වාදො, ප්‍රථමවාදයයි.— එත්ථ, මෙහි; තෙසං, ඔවුන්ගේ; ඉදං නිදස්සනං, මේ නිදර්ශනය; නෙව යුජ්ජති, නො ම යෙදෙයි; ගාමඋදකුක්ඛෙපසීමායො, ගාම උදකුක්ඛෙපසීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට; ඨිතසෙතුපාදෙහි, සිටිසෙතුපාදයන් හා; ගාමනදීසීමායො, ගාමනදීසීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට; ඨිතො රුක්ඛො, සිටියාවූ වෘක්ෂයතෙම; කථං, කෙසේ; උපමෙතබ්බො, උපමාකටහැක්කේද? තෙසං, ඒ සෙතුපාදයන්; පුථුභූතත්තා, (උදකුක්ඛෙප පරිච්ඡේදයෙන්) බැහැර වූ බැවින්; නෙව සමෙති, නො සමවෙයි; (කුමක්හෙයින්ද? යත්. ගාමඋදකුක්ඛෙපසීමායො, ගාමඋදකුක්ඛෙප සීමාවන්; ඵුසිත්වා වා, ස්පර්ශ කොට හෝ; ඉතරාපි විසභාගසීමායො, අනිකුදු විෂභාග සීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට හෝ; ඨිතරුක්ඛස්ස, සිටියාවූ වෘක්ෂයහට; උපමෙතබ්බතො, උපමාකටයුතු හෙයිනි; නදී පන, නදී වනාහි; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමාවට; නිස්සයා, අධාරයි; (නි අන්තො සනති එත්ථාති=නිස්සයා") ගාමනදීනං, ගාමනදී සීමාවන්ගේ; සම්බන්ධතො, සම්බන්ධයෙන්; අයම්පන නදීසීමා, මේ නදී සීමාතොමෝ; සම්භින්නාති වා, මිශ්‍රවූවායයි කියා හෝ; ගාමසීමා, ගාමසීමාතොමෝ; සම්භින්නාති වා, මිශ්‍ර වූ වා යි කියා හෝ; පාළිඅට්ඨකථාදිසු, පෙළ අටුවාදියෙහි; නෙව දිස්සති, නො ම දක්නා ලැබේ; විමතිවිනොදනියං, විමතිවිනොදනියෙහි; තෙන, එහෙයින්; වුත්තං, කියනලදී; යා එතා පන, යම් බඳු වූ මේ; ලොකවොහාරසිද්ධා. ලොකව්‍යවහාර සිද්ධ වූ; ගාමාරඤ්ඤනදීසමුද්දජාතස්සරසීමා, ගාමාරඤ්ඤනදී

වා පාළිඅට්ඨකථාදීසු නෙව දිස්සති, තෙනෙව වුත්තං විමතිවිනොදනියං ...... යා පනෙතා ලොකවොහාරසිද්ධා ගාමාරඤ්ඤනදීසමුද්දජාතස්සරසීමා පඤ්ච තා අඤ්ඤමඤ්ඤං රුක්ඛාදිසම්බන්ධෙපි දෙසං නාපජ්ජන්ති තථා ලොකවොහාරාභාවතො, නහි ගාමාදයො ගාමන්තරාදීහි නදීආදීහි ච රුක්ඛාදිසම්බන්ධමත්තෙන සම්භින්නාති ලොකෙ වොහරන්ති ලොකවොහාරසිද්ධානඤ්ච ලොකවොහාරතොව සම්භෙදො වා අසම්භෙදො වා ගහෙතබ්බො.

නාඤ්ඤතො, තෙනෙව අට්ඨකථායං තාසං අඤ්ඤමඤ්ඤං කත්ථචි සම්භෙදනයො න දස්සිතො, සාසන වොහාරසිද්ධො යෙව දස්සිතො, ඉමිනාව පන තෙසං පඨමවාදෙ නිරත්ථකො, **අයං තෙසං පඨමො දුබ්බිනයොකො,** පුන, සචෙ පන සෙතු වා සෙතුපාදා වා බහි

---

සමුද්දජාතස්සර සීමාකොතෙක් වෙද් ද; නාපඤ්ච, ඔව්හු පස්දෙන; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; රුක්ඛාදිසම්බන්ධෙපි, වෘක්ෂාදීන්ගේ සම්බන්ධය ඇති කල්හි ද; දෙසං, සාංකර දෙෂයට; නාපජ්ජන්ති, නො පැමිණෙත්; (කුමක්හෙයින්ද? යත්.) (තථා) ලොකවොහාරාභාවතො, එසේ ලොකව්‍යවහාරයක් නැතිබැවිනි; ගාමාදයො, ග්‍රාමාදීහු; ගාමන්තරාදීහි, අන්‍ය ග්‍රාමාදින් සමග ද; ("අඤ්ඤොගාමො, ගාමන්තරං, ගාමන්තරං ආදි යස්ස සො= ගාමන්තරාදි=තෙහි ගාමන්තරාදීහි) නදීආදීහි ච, නද්‍යාදීන් සමග ද; රුක්ඛාදිසම්බන්ධතො, ගස් වැල් ආදියෙන් සම්බන්ධ වූ පමණකින්; සම්භින්නාති, මිශ්‍රවූවාහයි; ලොකෙ, ලොකයෙහි; නහි වොහරන්ති, නොම ව්‍යවහාර කෙරෙත්; ලොකවොහාරසිද්ධානඤ්ච, ලොකව්‍යවහාර සිද්ධ සීමාවන්ගේ ම; සම්භෙදෙ වා, මිශ්‍රවීම හෝ; අසම්භෙදෙ වා, මිශ්‍රනොවීම හෝ; ලොකවොහාරතොව, ලෝවහරින්ම; ගහෙතබ්බො, ගතයුතුයි.

අඤ්ඤතො, අන් පරිද්දකින්, (න ගහෙතබ්බො.) නොගත යුතුයි; (යම් ගමක් අමුතු ගමක් හා ගස් වැල් ආදියෙන් සම්බන්ධ ව සිටි පමණින් මිශ්‍ර වූයේ යයි ලොක ව්‍යවහාර නො කෙරෙත්; ලොක ව්‍යවහාර සිද්ධ සීමාවන්ගේ මිශ්‍රවීම හෝ නො වීම හෝ ලෝ වහරින් ම ගතයුතුය යන අදහසි.) අට්ඨකථායං, අටුවායෙහි; තෙනෙව, එහෙයින් ම කියන ලදි. තාසං, ඒ ගාමසීමාවන්ගේ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; (එකිනෙකට) කත්ථචි, කිසිතැනෙක්හි; සම්භෙදනයො, මිශ්‍රකක්‍රමය; න දස්සිතො, නො දක්වනලදී; සාසනවොහාරසිද්ධො යෙව, ශාසන ව්‍යවහාරසිද්ධ යම; දස්සිතො, දක්වනලද; ඉමිනාව පන, මෙයින් ම වනාහි; තෙසං, ඒ තෙරවරුන්ගේ; පඨමො වාදෙ, ප්‍රථම වාදය තෙම; නිරත්ථකො, ව්‍යර්ථවී; තෙසං, ඔවුන්ගේ; **අයං,** මේ; **පඨමො දුබ්බිනයොකො, ප්‍රථම දුර්විනීතයයි;** පුන, නැවතද;

තීරෙ පතිට්ඨිතා කම්මං කාතුං නවට්ටති සීමං සොධෙත්වා කාතබ්බන්ති ඉමං අට්ඨකථාපාඨං දස්සෙන්තො, කම්මං කාතුං න වට්ටතීති තස්සසෙතුනො ගාමසම්බන්ධෙන සීමාසඞ්කරදොසකරත්තා උදකුක්ඛෙපසීමට්ඨෙපි තස්මිං සෙතුම්හි ඨිතෙහි කම්මං කාතුං න වට්ටතීති අධිප්පායො'ති අධිප්පායත්ථං වණ්ණෙන්ති… එත්ථ ච උදකුක්ඛෙපසීමට්ඨෙපි තස්මිං සෙතුම්හීති වුත්තො යමධිප්පායො අයථාධිප්පායොව, යදි පන සෙතුම්හි වා සෙතුපාදෙ වා බහිතීරෙ පතිට්ඨිතෙ තත්ථ උදකුක්ඛෙපසීමාපි උප්පජ්ජෙය්‍ය අට්ඨකථාවචනං පාළියා විසදිසමෙව, තස්මා සචෙ පන සෙතු වා සෙතුපාදා වා බහිතීරෙ පතිට්ඨිතා කම්මං කාතුං නවට්ටතීති ඉමිනා තත්ථ උදකුක්ඛෙපසීමුප්පත්තියා අභාවතො කම්මකරණං පටික්ඛිපිත්වා,

---

සචෙපන, ඉදින් වනාහි; සෙතු වා, හෙය හෝ; සෙතුපාදා වා, සෙතුපාදයෝ හෝ; බහිතීරෙ, පිට ඉවුරෙහි; පතිට්ඨිතා, පිහිටියාහු ද; (එහි) කම්මං කාතුං, කම්කරන්ට; න වට්ටති, නො වටී; සීමං, සොධෙත්වා, සීමාව ශුද්ධ කොට; කාතබ්බන්ති, කටයුතුය යන; ඉමං අට්ඨකථා පාඨං, මේ අටුවා පාඨය; දස්සෙන්තො, දක්වන්නාහු; කම්මං කාතුං න වට්ටතීති" "කම්මං කාතුං න වට්ටති" යනු වෙන්; තස්ස සෙතුනො ඒ හෙයගේ; ගාමසම්බන්ධෙන, ගම හා සම්බන්ධවීමෙන්; සීමාසඞ්කර දොසකරත්තා, සීමාසඞ්කර දෝෂය කරණ බැවින්; උදකුක්ඛෙප සීමට්ඨෙපි, උදකුක්ඛෙප සීමාවෙහි පිහිටි; තස්මිං සෙතුම්හි, ඒ ඒදණ්ඩෙහි; ඨිතෙහි, සිටියවුන් විසින්; කම්මං කාතුං, කම් කරන්ට; න වට්ටතී ති, නො වටීයයි; අධිප්පායොති, අදහසය යන; අභිප්පායත්ථං, අභිප්‍රායාර්ථයක්; වණ්ණෙන්ති, වර්ණනා කෙරෙත්… එත්ථච, මෙහි ද; උදකුක්ඛෙපසීමට්ඨෙපි, උදකුක්ඛෙප සීමාවෙහි පිහිටියා වූ තස්මිං සෙතුම්හීති, ඒ හෙයෙහි යනු; වුත්තො, කියනලද; අයං අධිප්පායො, මේ අභිප්‍රාය තෙම; අයථාධිප්පායොව, අනියම් අදහසක් මැ යි; යදි පන, ඉදින් වනාහි; සෙතුම්හි වා, හෙය හෝ; සෙතුපාදෙ වා, සෙතුපාදයන් හෝ; බහිතීරෙ, පිට ඉවුරෙහි; පතිට්ඨිතෙ, පිහිටි කල්හි; තත්ථ, එහි; උදකුක්ඛෙපසීමාපි, උදකුක්ඛෙපසීමාතොමෝ ද; උප්පජ්ජෙය්‍ය, උපදින්නී නම්; අට්ඨකථාවචනං, අටුවා වචනය; පාළියා, පෙළට; විසදිසමෙව, සම නො වේ මය; තස්මා, එහෙයින්; තස්මා සචෙ පන සෙතුවාසෙතුපාදාවා බහිතීරෙ පතිට්ඨිතා කම්මං කාතුං න වට්ටතීති" "තස්මා සචෙ පන…පෙ…නවට්ටති" යන; ඉමිනා, මෙයින්; තත්ථ, එහි; උදකුක්ඛෙපසීමුප්පත්තියා, උදකුක්ඛෙප සීමාවගේ හටගැන්ම; අභාවතො, නො වන හෙයින්; කම්මකරණං, කම් කිරීම; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට.

පුන සීමං සොධෙත්වා කාතබ්බම්ච්චනෙන සෙතුනො ගාමෙක සම්බන්ධාගතත්තා ගාමසීමාභාවො, වුත්තො යෙවාති ගහෙතබ්බො යමධිප්පායත්ථො සුන්දරතරෙ, පාළියා අට්ඨකථාවචනං න විරුජ්ඣති, තස්මා යං දුතියොපි වාදෙ පාළිඅට්ඨකථාදීහි න සමෙති. (**අයං තෙසං දුතියො දුබ්බිනිච්ඡයො.**)

පුනෙකච්චානං ථෙරානං වාදං සන්ධාය ගාමසම්බන්ධසෙතුස්ස ගාමාභාවං වත්තුකාමා කට්ඨමයසෙතුනො කොට්ඨකආවරණානං විය නදීලක්ඛණ විනාසනාභාවෙන ගාමාභාවතො අන්තොනදියං හි සෙතුථම්භානං නිඛණිතමත්තෙන නදීලක්ඛණං න භිජ්ජතීති

---

පුන, වැලිදු; සීමං සොධෙත්වා, සීමාවශුද්ධ කොට; කාතබ්බං ඉති, කටයුතුය යන; අනෙන, මේ කියමනෙන්; සෙතුනො, හෙය; ගාම සම්බන්ධාගතත්තා, ගම හා එකට සම්බන්ධය ආබැවින්; ගාමසීමා භාවො, ගාමසීමාබව; වුත්තො යෙවාති, කියනලද්ද ම යයි; ගහෙ තබ්බො, ගතයුතු වූ; අයං අධිප්පායත්ථො, මේ අභිප්‍රායාර්ථය තෙම; සුන්දරතරෙ, ඉතා මැනවි; පාළියා, පෙළටද; අට්ඨකථාවචනං, අටුවා යෙහි කීම; න විරුජ්ඣති, විරුද්ධ නො වේ; තස්මා, එහෙයින්; අයං දුතියොපි වාදෙ, මේ දෙවන වාදය ද; පාළිඅට්ඨකථාදීහි, පෙළ අටුවාදිය හා; න සමෙති, සම නො වේ; තෙසං, ඔවුන්ගේ; **අයං, මේ; දුතියො දුබ්බිනිච්ඡයො, දෙවන දුර්විනිශ්චයයි;** පුන, නැවත ද; එකච්චානං ථෙරානං, ඇතම් තෙරවරුන්ගේ;(“පිරෙහි සීලක්ඛන්ධාදීහි සමන්නාගතාති ථෙරා” දසවස්සාතිරෙකදසවස්සාව ථෙරා, ඌන පඤ්චවස්සා නවා, පඤ්චවස්සාතිරෙකපඤ්චවස්සා ච මජ්ඣිමා” තෙසං ථෙරානං,) වාදං සන්ධාය, වාද සඳහා; ගාමසම්බන්ධ සෙතුස්ස, ගම සම්බන්ධ හෙයගේ; ගාමාභාවං, ග්‍රාමක්ෂෙත්‍රය නොවන බව; වත්තු කාමා, කියනු කැමැත්තාහු; කට්ඨමය සෙතුනො, කාෂ්ඨමයහෙයගේ කොට්ඨක ආවරණානං විය, කොටු ආවරණයන්ගේ මෙන්; නදී ලක්ඛණ විනාසනාභාවෙන, නදී ලක්ෂණයාගේ බිඳීම නොවන බැවින්; ගාමාභාවතො, ගම නොවන බැවින්; අන්තො නදියං හි, නදියතුළ ම; සෙතුථම්භානං, සෙතු ස්තම්භයන්ගේ; නිඛණිතම ත්තෙන, සිටුවීම් පමණකින්; නදීලක්ඛණං, නදීලක්ෂණය; න භිජ්ජ තීති, නො බිඳේ යයි; වදන්නා, කියන්නාහු; අට්ඨකථායං, අටුවා යෙහි; අන්තො නදියං, ගඟතුළ; බද්ධෙ, බඳිනලද; අට්ටකෙපි, අටල් ලෙහි ද; රුක්ඛෙපි, රුකෙහි ද; ඨිතෙහි, සිටියවුන් විසින්; කම්මං කාතුං, කම් කරන්ට; වට්ටතීති, වටනේය යන; ඉමිනා පාඨෙන, මේ පාඨයෙන්; නිදස්සනං කරොන්ති, නිදසුන් කරත්; තෙසං, ඔවුන්ගේ; ඉදම්පි නිදස්සනං, මේ නිදර්ශනය ද; නෙව සංසන්දති, නො ම ගැළපෙයි; කස්මාති චෙ, කුමක් හෙයින්ද? යත්, ගාමසම්බන්ධ

වදන්ති, අට්ඨකථායං අන්තොනදියං බද්ධෙ අට්ටකෙපි රුක්ඛෙපි ඨිතෙහි කම්මං කාතුං වට්ටතීති ඉමිනා පාඨෙන නිදස්සනං කරොන්ති, ඉදම්පි තෙසං නිදස්සනං නෙව සංසන්දති, න සමෙති ච, ගාමසම්බද්ධසෙතුතො චෙව අන්තොනදියං ගාමතො විසුං හුත්වා ඨිතානං අට්ටකරුක්ඛානඤ්ච විසදිසත්තා, තෙනෙව අට්ඨකථායං බහිතීරෙ පතිට්ඨිතසෙතුස්සොපරි කම්මකරණං පටික්ඛිපිත්වා අන්තො නදියං යෙව ඨිතෙසු අට්ටකරුක්ඛනාවාසෙතූසු කම්මකරණං වුත්තං.

අයං තෙසං තතියො දුබ්බිතක්කො.

පුන, සීමං සොධෙත්වා කාතබ්බන්ති අට්ඨකථාවචනං නිස්සාය ගාමසම්බන්ධසෙතුපදෙසෙ උදකුක්ඛෙපසීමායං කම්මං කරොන්තෙහි ගාමසීමං සොධෙත්වා ව කාතබ්බන්ති අධිප්පායඤ්ච, කම්මං කාතුං නවට්ටතී ති වචනං නිස්සාය ගාමසීමං සොධෙත්වා තස්මිං සෙතු

---

සෙතුතො චෙව, ගමසම්බන්ධ හෙයගේ ද; අන්තොනදියං, නදියතුළ; ගාමතො, ගමින්; විසුං හුත්වා, වෙන් ව; ඨිතානං, සිටියා වූ; අට්ටකරුක්ඛානඤ්ච, අටළු හා වෘක්ෂයන් ද; විසදිසත්තා, අසමාන බැවිනි; අට්ඨකථායං, අටුවායෙහි; තෙනෙව, එහෙයින් ම කියනලදී; බහි තීරෙ, පිට ඉවුරෙහි; පතිට්ඨිතා, පිහිටියා වූ; සෙතුස්ස, හෙයගේ; උපරි, මතුයෙහි; කම්මකරණං, කම්කිරීම; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; අන්තො නදියං යෙව, නදියතුළ ම; ඨිතෙසු, සිටියාවූ; අට්ටකරුක්ඛනාවාසෙතූසු, අටළුරුක් නැව් හේවලැ; කම්මකරණං; කම් කිරීම; වුත්තං, කියන ලදී; තෙසං, ඔවුන්ගේ; අයං, මේ, තතියො දුබ්බිතක්කො, තුන් වන දුර්විතර්කයයි.

පුන, වැලිදු; සීමං සොධෙත්වා, සීමාව ශුද්ධකොට; කාතබ්බන්ති, කටයුතුය යන; අට්ඨකථාවචනං නිස්සාය, අටුවාවචනය නිසා; ගාමසම්බන්ධසෙතුපදෙසෙ, ගමසම්බන්ධ ඒදඬු පෙදෙසෙහි; උදකුක්ඛෙපසීමායං, උදකුක්ඛෙපසීමායෙහි; කම්මං කරොන්තෙහි, කම්කරන්නවුන් විසින්; ගාමසීමං සොධෙත්වාව, ගාමසීමාව ශුද්ධකොට ම; කාතබ්බන්ති, කටයුතුය යන; අධිප්පායඤ්ච, අභිප්‍රායක්ද; කම්මං කාතුං නවට්ටතී'ති, කම්කරන්ට නොවටී යන; වචනං නිස්සාය, වචනය නිසා; ගාමසී මං සොධෙත්වා, ගාමසීමාවශුද්ධකොට; තස්මිං සෙතුපදෙසෙ පි, ඒ හෙය පෙදෙසෙහි ද; උදකුක්ඛෙපසීමායං, උදකුක්ඛෙපසීමායෙහි; කම්මං කාතුං, කම්කරන්ටවට්ටතෙ වා ති, වටී මය යන; අධිප්පායඤ්ච, අභිප්‍රායක් ද; වදන්ති, කියත්; සො, ඒ අභිප්‍රායතෙම; තෙසං, ඔවුන්ගේ; විපල්ලාසගාහො හි, විඩම්බන ග්‍රාහයෙක් මැයි; (පෙරලාගැන්මක්මය) අට්ඨකථායං අටුවායෙහි;

පදෙසෙ පි උදකුක්ඛෙප සීමායං කම්මං කාතුං වට්ටතෙ වාති අධිප්පායඤ්ච වදන්ති, සො හි තෙසං විපල්ලාස ගාහො, න හි අට්ඨකථායං තස්මිං සෙතුපදෙසෙ කම්මකරණං වුත්තං, සෙතුපදෙසො නාම සෙතුනො පතිට්ඨානොකාසො, සෙතු නාම කම්මං කරොන්තානං ආධාරො, තස්මිං ආධාරෙ එව කම්මාරහත්තං විහිතං, න පි අට්ඨකථායං ගාමසීමං සොධෙත්වා සෙතුපදෙසෙ උදකුක්ඛෙප සීමාය කම්මකරණං වුත්තං, ගාමසීමාය සම්බන්ධෙ සති උදකුක්ඛෙප සීමුප්පත්තියා අභාවතො තස්සං ගාමසීමායං එව කම්මං කාතබ්බන්ති වුත්තමෙව, එත්ථ පි කාරණං වුත්ත නයෙනෙව දට්ඨබ්බං.

අයං තෙසං චතුත්ථො දුබ්බිතක්කො.

පුන, ඉධ පන එකච්චෙ ථෙරා ගාම සම්බන්ධස්ස සෙතුනො ගාමභාව සඞ්ගහිතත්තා තස්මිං ගාමසඞ්ඛාතෙ සෙතුම්හි යෙව කම්මං කරොන්තෙනහි ගාමසීමං සොධෙත්වා කාතබ්බං න සෙතුසමීපෙ උදකපිට්ඨෙ ති අත්ථං වණ්ණෙන්ති ති වදන්තා, අයමෙත්ථ තෙස

---

තස්මිං සෙතුපදෙසෙ, ඒ හේදඬු පෙදෙසෙහි; කම්මකරණං, කම්කිරීම; න වුත්තං හි, නො කියනලදමය; (මෙතැන්හි, හි; ශබ්ද අවධාරණාර්ථවාචීය, න හි" සි, අසථාන ප්‍රයුක්තාවූ ව ද, වුත්තං" යනුහා සම්බන්ධයි.) සෙතුපදෙසො නාම, සෙතුප්‍රදෙශය නම්; සෙතුනො, හෙයගේ; පතිට්ඨානොකාසො, පිහිටීමේ අවකාශ (ස්ථාන) යයි; සෙතුනාම, හෙය නම්; කම්මං කරොන්තානං, කම් කරන්නවුන්ට; ආධාරො, ආධාරයයි; (ආධාරීයති අස්මින්ති ආධාරො) තස්මිං ආධාරෙ එව, ඒ ආධාරයෙහිම; කම්මාරහත්තං, කම්මාර්හබව; විහිතං, ප්‍රකාශ කරණලදී. ගාමසීමං සොධෙත්වා, ගාමසීමාව ශුඬකොට; සෙතුපදෙසෙ, ඒදඬු පෙදෙසෙහි; උදකුක්ඛෙප සීමාය, උදකුක්ඛෙප සීමායෙහි; කම්මකරණං, කම්ම කිරීමක්; න පි වුත්තං, නො කියනලද මැයි. ගාමසීමාය, ගාමසීමාව ගේ; සම්බන්ධෙ සති, සම්බන්ධය ඇතිකල; උදකුක්ඛෙපසීමුප්පත්තියා, උදකුක්ඛෙප සීමාවගේ හටගැන්ම; අභාවතො, නොවන හෙයින්; තස්සං ගාමසීමායං එව, ඒ ගාමසීමායෙහි ම; කම්මං කාතබ්බන්ති, කම්ම කටයුතුයයි; වුත්තමෙ ව, කියනලද මය. එත්ථ පි, මෙහි ද; කාරණං, කාරණය; වුත්ත න යෙනෙ ව, කියනලද ක්‍රමයෙන් ම; දට්ඨබ්බං, දතයුතුයි.

තෙසං, ඔවුන් ගේ; අයං චතුත්ථො දුබ්බිතක්කො, මේ සිවුවන දුර්විතර්ක යයි.

පුන, නැවතද; ඉධ පන, මෙහි වනාහි; එකච්චෙ ථෙරා, ඇතැම් තෙරහු; ගාමසම්බන්ධස්ස, ගම සම්බන්ධවූ; සෙතුනො, හෙය නමං;

**මහි නිවෙසො ති අත්තනොභිනිවෙසං** පරේසු **ආරොපෙන්තා පප ඤ්චිත්වා අත්තනො** වාදං පතිට්ඨාපෙතුං **එකන්තෙන** අට්ඨකථාන යෙන උජුපටිපක්ඛා **ති ච වත්වා, වුත්තං හි** අට්ඨකථායං, **සචෙ** ආව රණෙන වා කොට්ඨකබන්ධෙන වා සොතං **පච්ඡිජ්ජති** උදකං න **පපවත්තති** අප්පවත්තනට්ඨානෙ කම්මං කාතුං න වට්ටති, ආවරණ මත්තකෙ පි කම්මං කාතුං න වට්ටති.....පෙ.....නදිං විනාසෙත්වා තළාකං කරොන්ති හෙට්ඨා පාළිබද්ධා උදකං ආගන්ත්වා තළාකං පූරෙත්වා තිට්ඨති එත්ථ කම්මං කාතුං න වට්ටති, නදීතො නීහත මාතිකාය න වට්ටතීති,

---

ගාමභාවසඞ්ගහිතත්තා, ග්‍රාමක්ෂෙත්‍ර භාවයෙහි ඇතුළත්වූ බැවින්; තස්මිං ගාමසඞ්ඛාතෙ සෙතුම්හි යෙව, ඒ ග්‍රාම සඞ්ඛ්‍යාත ඒදණ්ඩහි ම; කම්මං කරොන්තෙහි, කර්මකරන්නන් විසින්; ගාමසීමං සොධෙත්වා, ගාමසීමාව ශුද්ධකොට; කාතබ්බං, කටයුතුය; සෙතුසමීපෙ, හෙය සමීපයෙහිවූ; උදකපිට්ඨෙ, දිය මතුයෙහි; න ඉති, නො කටයුතුය යි; අත්ථං, අදහසක්; වණ්ණෙන්තීති, වණත් යයි; වදන්තා, කියන්නාහු වෙත්. එත්ථ, මේ කියමනෙහි; තෙසං, ඔවුන්ගේ; අයං අභිනිවෙසො, මේ වරදවා පිහිටා ගැන්මයි; ඉති, මෙසේ; අත්තනො, තමන්ගේ; අභිනිවෙසං, අභිනිවෙසය; පරේසු, අනුන් කෙරෙහි; ආරොපෙන්තා, නගන්නාහු; පපඤ්චිත්වා, විස්තර කොට; අත්තනො වාදං, තමන් කියමන; පතිට්ඨාපෙතුං, පිහිටුවන්ට; එකන්තෙන, එකාන්තයෙන්; අට්ඨකථානයෙන ච, අටුවාක්‍රමයෙනුත්; (අටුවාවටත්) උජුපටිපක්ඛාති, ඉඳුරා පටහැණිවූවාහ යි; වත්වා, කියා; අට්ඨකථායං, අටුවායෙහි; වුත්තං හි, කියනලද මැයි. සචෙ; ඉදින්; ආවරණෙන වා, ආවරණයෙන් හෝ; ("අපෙක්ඛාන්තරිත්වා ආවරණං පවත්තන්ති යෙ වාති ආවරණං,) කොට්ඨකබන්ධෙන වා, කොටුවක් බැඳීමෙන් හෝ; සොතං, ප්‍රවාහය; (ජලවහණය,) පච්ඡිජ්ජති, සිඳේද; උදකං, ජලය; නපපවත්තති, බැස නොයා ද; අප්පවත්තනට්ඨානෙ, ජලය බැස නොයන තන්හි; කම්මං කාතුං, කර්මකරන්ට; න වට්ටති, නොවටියි. ආවරණමත්තකෙ පි, ආවරණය මත්තෙහි ද; කම්මං කාතුං, කර්ම කරන්ට; න වට්ටති, නොවටියි.....පෙ.....මෙහි, ආවරණෙන වා, යන්නෙන් නදියෙහි දූව ආදිය සිටුවා ජලවහණය වැලැක්ම දක්වයි.) "ආවරණෙන වාති" දාරුආදීනි බන්ධිත්වා උදකනිවාරෙණ වා, යනු සිඬයි, "කොට්ඨබන්ධෙන වා" යන්නෙන් (කොටුවක් බැඳීමෙන් ප්‍රවාහය වැළැක්වීම් දක්වයි.) "කොට්ඨකබන්ධෙන වා'ති" මත්තිකාදීහි **පූරෙත්වා** කත සෙතුබන්ධනෙන වා උභයෙනා පි ආවරණමෙවද**ස්සෙති" කොට්ඨකබන්ධෙන වා" යනු,** (මැටි ආදියෙන් පුරවා කරණලද සෙතුබන්ධනය දක්වයි. මේ දෙයා

එත්ථ පන සබ්බසො නදී ලක්ඛණ විරහෙන කදාචි පි තත්ථ තත්ථ කම්මස්ස කත්තබ්බාකාරාභාවතො කම්මං කාතුං න වට්ටතී ති චෙව ච වුත්තං, න පුන සීමං සොධෙත්වා ච්චාදි, තස්මා එත්ථ සීමං සොධෙත්වාච්චාදිවචනෙන තස්ස සෙතුනො ගාමාභාවො දීපිතො ති එවං වදන්ති, තං න යුජ්ජති

යදි පන සො සෙතු ගාමසීමා න සියා කො තත්ථ කම්මකරණෙ දෙසො හොති, එත්ථ පන අප්පවත්තන්තට්ඨානාදීසු චතූසු ඨානෙසු කම්මකරණං පටික්ඛිපිත්වා පුන ගාමසීමං සොධෙත්වා කම්මං කාතබ්බන්ති අවුත්තත්තා ච ගාමසම්බන්ධසෙතුම්හි කම්මකරණං පටික්ඛිපිත්වා පුන ගාමසීමං සොධෙත්වා කාතබ්බන්ති වුත්තත්තා ච සො

---

කාරයෙන්ම නදියෙහි ජලය බැස යාම වැළැක්ම දක්වනලදි. නදී සවභාවය නැතිවී ගාමසීමාවම වෙයි කියනලද අර්ථයම ප්‍රකාශ කෙරෙයි යනු අභිප්‍රායයි.)

නදිං විනාසෙත්වා, නදිය වියලා; තළාකං, කරොන්ති, තඩාග යක් කෙරෙද්ද; හෙට්ඨා, යට; (නදිය ආවරණය කොට) පාළිබද්ධා, මියර බඳිත ලද්දීද? ("හෙට්ඨා නදිං ආවරිත්වා පාළිබද්ධා ති අත්ථො, යනු ටීකායි.) උදකං ආගන්ත්වා, ජලය අවුත්; තළාකං, තඩාගය; පූරෙත්වා, පිරී; තිට්ඨන්ති, සිටීද? එත්ථ, මෙහි; කම්මං කාතුං, කර්ම කරන්ට; න වට්ටති, නොවටියි. නදීතො, නදියෙන්; නීහත, හරණු ලබන; මාතිකාය, මාතෘකායෙහි; (මාතෘකා නම් ඇළයි) න වට්ටතීති, නොවටියයි කියායි.

එත්ථ පන, මෙහි වනාහි; සබ්බසො, සාකල්‍යයෙන්; නදීලක්ඛණ විරහෙන, නදීලක්ෂණය වෙනස්වූ හෙයින්; කදාචි පි, කිසිකලෙක; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; කම්මස්ස, කර්මයාගේ; කත්තබ්බාකාරාභාවතො, කටයුතු ආකාරයක් නොවන හෙයින්; කම්මං කාතුං න වට්ටති ඉති එව, කර්ම කරන්ට නොවටීමය යනු; වුත්තං, කියනලදී. "පුන සීමං සොධෙත්වා ඉච්චාදි" පුන සීමං සොධෙත්වා, යනාදිය; න, නො කියනලදී. තස්මා, එහෙයින්; එත්ථ, මෙහි; සීමං සොධෙත්වා ච්චාදිවචනෙන, සීමං සොධෙත්වා, යනාදි වචනයෙන්; තස්ස සෙතුනො, ඒ හෙයගේ; ගාමාභාවො, ගම නො වන බව; දීපිතොති, දක්වනලදයයි; එවං, මෙසේ; වදන්ති, කියත්; තං න යුජ්ජති, ඒ නො යෙදෙයි. (යොග්‍ය නොවේ) යදි පන, ඉදින් වනාහි; සො සෙතු, ඒ හෙය; ගාමසීමා න සියා, ගාමසීමාව නො වේ නම්; තත්ථ, එහි; කම්මකරණෙ, කර්මකිරීමේ; කො දෙසො, කවර දෝෂයෙක් වේද? එත්ථ පන, මෙහි වනාහි; අප්පවත්තන්තට්ඨානාදිසු, ජලවහණය නොවන ස්ථානාදීවූ; චතූසු ඨානෙසු, සිවු

සෙතු නෙව ගාමසීමා ති අධිප්පායත්ථං දීපෙන්ති නදීලක්ඛණස්ස අවිජහණතො, යදෙවං සියා, අට්ඨකථායං නදීතීරෙ ඛාණුකං කොට්ටෙත්වා තත්ථ බද්ධනාවාය න වට්ටති යෙවාති ඉමිනා එකංසෙන තත්ථ කම්මකරණපටික්ඛෙපං විනා පුන කස්මා සීමං සොධෙත්වා කම්මකරණං න වුත්තං?

කිම්පන තෙත්ථ නදීතීරෙ ඛත ඛාණුකස්මිං බද්ධනාවා පතිට්ඨානට්ඨානෙ නදීලක්ඛණං අන්තරධානං, එවං සති තෙසං ථෙරානං අධිප්පායත්ථො අට්ඨකථම්පි පුබ්බාපරවිරොධිනිං කරොන්තො විය දිස්සති, තස්මා සො වාදෙ ඡඩ්ඩෙතබ්බො. **අයං තෙසං පඤ්චමො දුබ්බිතකොකා.**

---

තන්හි; කම්මකරණං, කර්ම කිරීම; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; පුන, නැවත; ගාමසීමං සොධෙත්වා, ගාමසීමාව ශුද්ධකොට; කම්මං කාතබ්බන්ති, කර්ම කටයුතුයයි; අවුත්තත්තා ච, නො කියන ලද බැවින්ද; ගාමසම්බන්ධ සෙතුම්හි, ගම සම්බන්ධ ඒදණ්ඩෙහි; කම්මකරණං, කර්මකිරීම; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; පුන, නැවත; ගාමසීමං සොධෙත්වා, ගාමසීමාව ශුද්ධකොට; කාතබ්බන්ති, කටයුතුයයි; වුත්තත්තා ච, කියනලද බැවින් ද; සො සෙතු, ඒ හෙය; නෙ ව ගාමසීමා ති, ගාමසීමාව නො වේ මය යන; අභිප්පායත්ථං, අභිප්‍රායාර්ථයක්; නදීලක්ඛණස්ස, නදීලක්ෂණය තමා; අවිජහණතො, අත්නොහරින බැවින්; දීපෙන්ති, ප්‍රකාශ කරත්; යදෙවං සියා, ඉදින් මෙසේ වේ නම්; අට්ඨකථායං, අටුවාවෙහි; නදීතීරෙ, ගංඉවුරෙහි; ඛාණුකං, කොට්ටෙත්වා, කණුවක් සිටුවා; තත්ථ, එහි; බද්ධනාවාය, බඳිනලද නැවෙහි; නවට්ටති යෙවා ති, විනයකර්ම කිරීමට නොවටීම යයි යන; ඉමිනා මෙයින්; එකංසෙන, එකතින්; තත්ථ, එහි; කම්මකරණපටික්ඛෙපං, කර්ම කිරීමේ ප්‍රතික්ෂෙපය; විනා, හැර; පුන, නැවත; කස්මා, කුමක් හෙයින්; සීමං සොධෙත්වා, සීමාව ශුද්ධකොට; කම්මකරණං, කර්ම කිරීම; න වුත්තං, නොකියන ලදද?

කිම්පන, කිමෙක්ද? එත්ථ නදීතීරෙ, මේ ගංඉවුරෙහි; ඛත ඛාණුකස්මිං, සිටුවා කරණලද කණුවෙහි; බද්ධනාවා පතිට්ඨානට්ඨානෙ, බඳිනලද නැව පිහිටනතැන; නදීලක්ඛණං, නදී ලක්ෂණය; අන්තරධානං, සැඟවිතිද? එවං සති, එසේ ඇතිකල; තෙසං ථෙරානං, ඒ තෙර වරුන්ගේ; අභිප්පායත්ථො, අභිප්‍රායාර්ථය තෙම; අට්ඨකථම්පි, අටුවාවටද; පුබ්බාපරවිරොධිනිං, පූර්ව වචනයෙන් අපර වචනයට විරුද්ධව සිටීම; කරොන්තො විය, කරන්නාක් මෙන්; දිස්සති, දක්නා ලැබේ. (ගාමසම්බන්ධ සෙතුම්හි, යනාදි පූර්

පුන, අනෙතා නදියං බඬෙ අට්ටකෙ පි...පෙ...තස්ස බහි පති ට්ඨිතභාවො නාසෙතබ්බොති ඉමෙ අට්ඨකථා පාඨෙ ආහරිත්වා, එත්ථ හි අනෙතා නදියං බඬෙ අට්ටකෙ චාදිනා අනෙතා නදියං ඝිත සෙතු අට්ටාදීනං පටිච්ච තත්ථ නදීලක්ඛණස්ස අ විනාස භාවො විභාවිතො හී ති වදන්තා, එත්ථ ච අනෙතා නදිං පවිට්ඨානං යෙව වුත්තත්තා චාදි නිරත්ථකම්පි වාදං ආරොපෙන්තා පපඤ්චෙන්ති... න හෙත්ථ අට්ඨකථායං අනෙතා නදියං බඬෙ අට්ටකෙ චාදිනා නදීලක්ඛණස්ස විනාසාවිනාසත්තං වුත්තං, අථ ඛො කිං වුත්තං හොති, බඬ ගාම සීමා හි සඞ්ං සම්බන්ධං අප නෙත්වා උදකුක්ඛෙප සීමායං කම්ම කරණූපායො වුත්තො ති ගහෙතබ්බො...

---

වචනයෙන් ගම සම්බන්ධ ඒදණ්ඩහි කම්කිරීම ප්‍රතික්ෂෙපකොට නැවත, ගාමසීමං සොධෙත්වා, යනාදි අපර වචනයෙන් ගාමසීමාව ශුඬකොට කම්කිරීම කටයුතු බවෙක් දැක්වූ ව අටුවාකථාව පූර්‍වා පර විරුඬවෙයි. යනු භාවයි.) තසමා, යම් හෙයකින් අටුවාකථාව පූර්‍වාපර විරුඬවේද? එහෙයින්; සො වාදො, ඒ වාදය තෙම ඡඬ්ඩතබ්බො, බැහැරලිය යුතුයි. **තෙස., ඒ තෙර වරුන්ගේ; අයං, මේ; පක්ඛමො දුබ්බිතඤ්ඤතා, පක්ෂවම දුර්විතර්කයයි.**

පුන, වැලිදු; අනෙතා නදියං, නදිය තුළ; බඬෙ, බඳනා ලද; අට්ටකෙ පි, අටල්ලෙහිද;...පෙ...තස්ස, ඒ අටල්ලෙහි; බහි පතිට්ඨිතභාවො, පිටත පිහිටි සවභාවය; නාසෙතබ්බො ති, නැසිය යුතුය යන; ඉමෙ අට්ඨකථාපාඨෙ, මේ අටුවා පාඨයන්; ආහ රිත්වා, ගෙණහැර දක්වා; එත්ථ,මෙහි; අනෙතා නදියං හි, නදියතුළම; බඬෙ අට්ටකෙ ඉති, බඳනාලද අටල්ලෙහිය යන; ආදිනා, මේ ආදි යෙන්; අනෙතා නදියං, නදිය තුළ; ඝිතසෙතු අට්ටාදීනං, සිටිහේ අටළු ආදින්; පටිච්ච, නිසා; තත්ථ, එහි; නදීලක්ඛණස්ස, නදී ලක්ෂණ යාගේ; අවිනාසභාවො, නොබිඳුන බව; විභාවිතොහී ති, ප්‍රකාශ කරණලදම යයි; වදන්තා, කියන්නාහු; එත්ථ ච, මෙහි දු; අනෙතා නදිං, නදිය තුළට; පවිට්ඨානං යෙව, ප්‍රවිෂ්ටවූවන්ම; (නිසානදී ලක්ෂණය නොබිඳුන සවභාවය) වුත්තත්තා ඉති ආදි, කියනලද හෙයින්ය යනාදිවූ; නිරත්ථක මපි, ව්‍යර්ථවූද; වාදං, වාදයක්; ආරො පෙන්තා, නගමින්; පපඤ්චෙන්ති, විස්තර කරත්...

එත්ථ, මෙහි; අට්ඨකථායං, අටුවායෙහි; අනෙතා නදියං, නදිය තුළ; බඬෙ, බඳිනලද; අට්ටකෙ ඉති ආදිනා, අටල්ලෙහි යනාදි යෙන්; නදීලක්ඛණස්ස, නදීලක්ෂණය තමා; විනාසාවිනාසත්තං, බිඳුන නොබිඳුන බව; න වුත්තං හි, නොකියන ලදමැයි. අථ ඛො, එසේ නොකියනලද නම්; කිං වුත්තං, හොති, කුමක් කියනලද්දේ

තෙනෙව විමතිවිනොදනියං, අන්තො නදියං ජාතරුක්ඛෙ වා ති උදකුක්ඛෙපපරිච්ඡෙදස්ස බහි ඨිතෙ රුක්ඛෙ වා, බහි නදීතීර මෙව හි විසභාගසීමත්තා අබන්ධිතබ්බට්ඨානං න අන්තො නදී, නිස්සයත්තෙන සභාගත්තා, තෙනෙව ච බහි නදීතීරෙ විහාර සීමාය වාති ආදිනා තීරමෙව අබන්ධිතබ්බට්ඨානත්තෙන දස්සිතං. න පන නදී, රුක්ඛෙපි ඨිතෙහී ති ඉදං අන්තො උදකුක්ඛෙපට්ඨං සන්ධාය වුත්තං, න හි බහි උදකුක්ඛෙපෙ භික්ඛූනං ඨාතුං වට්ටති, රුක්ඛස්සාති තස්සෙව අන්තො උදකුක්ඛෙපට්ඨස්ස රුක්ඛස්ස සීමං වා සොධෙන්තා ති යථාවුත්තවිහාරෙ බද්ධසීමං ගාමසීමංවා තත්ථ ඨිතභික්ඛූනං හත්ථපාසානයන බහි සීමාකරණවසෙනෙව සොධෙන්තා වා ති වුත්තං.

---

වේද? බද්ධගාමසීමාහි සද්ධිං, බද්ධසීමා ගාමසීමාවන් සමග; සම්බන්ධං, සම්බන්ධය; අපනෙන්තා, පහ කොට; උදකුක්ඛෙප සීමායං, උදකුක්ඛෙප සීමායෙහි; සාමග්ගිකරණූපායො, සාමග්‍රී කිරීමේ උපාය තෙම; වුත්තො'ති, කියනලදූයි; ගහෙතබ්බො, ගතයුතුයි.

අන්තො නදියං ජාතරුක්ඛෙ වාති, අන්තො නදියං ජාතරුක්ඛෙ වා, යනු; උදකුක්ඛෙප පරිච්ඡෙදස්ස, උදකුක්ඛෙප පරිච්ඡෙදයෙන්; (අවධි අර්ථයෙහි සම්බන්ධ විභක්තියි) බහි ඨිතෙ, පිට සිටියාවූ; රුක්ඛෙ වා, වෘක්ෂයන් හෝ; බහි නදීතීර මෙව, පිට ගංඉවුරම; විසභාගසීමත්තාහි, විජාතිසීමා බැවින්ම; අබන්ධිතබ්බට්ඨානං, අටළු ආදිය නොබැඳියයුතු ස්ථානයි; න අන්තොනදී, ඇතුල් නදිය නො වේ; නිස්සයත්තෙන, අටල්ලට නදිය නිශ්‍රයවන බැවින්; සභාගත්තා, සභාග හෙයිනි; (නදියතුළම අටළු ආදිය බැඳීම යෙදේ මැයි) තෙනෙව ච, එහෙයින්ම; "බහි නදීතීරෙ විහාර සීමාය වා ති, බහි නදීතීරෙ විහාරසීමාය වා, යන" ආදිනා, මේ ආදියෙන්; තීරං එව ඉවුරම; අබන්ධිතබ්බට්ඨාන නෙත්ත, අටළුආදිය නොබැඳියයුතු තැන හෙයින්; දස්සිතං, දක්වනලදී, පන, යම්හෙයකින්; (පන, යනු යස්මාදර්ථයි) නදී න, නදිය නොවේද? එහෙයිනි; රුක්ඛෙ පි ඨිතෙ හීති, රුක්ඛෙ පි ඨිතෙහි,, යනු; ඉදං අන්තො උදකුක්ඛෙපට්ඨං, මේ උදකුක්ඛෙපය තුළ සිටියහු; සන්ධාය, සඳහා; වුත්තං, කියනලදී. බහි උදකුක්ඛෙපෙ, උදකුක්ඛෙපයෙන් පිට; භික්ඛූනං, භික්ෂූන්ට; ඨාතුං, සිටින්ට; න හි වට්ටති, නොවටී ම ය. රුක්ඛස්සාති, රුක්ඛස්ස යනු තස්සෙව අන්තො උදකුක්ඛෙපට්ඨස්ස, ඒ උදකුක්ඛෙපය තුළම පිහිටි; රුක්ඛස්ස, රුක ගේය; සීමං වා සොධෙන්තා ති, සීමං වා සොධෙන්තා,, යනු, යථාවුත්තවිහාරෙ, යථොක්ත විහාරයෙහි; බද්ධසීමං, බද්ධසීමා වක් ද; ගාමසීමංවා, ගාමසීමාවක්ද වෙත් නම්; තත්ථ, එහි; ඨිත භික්ඛූනං, සිටි භික්ෂූන්; හත්ථපාසානයන, අත් පසට ගැණීම්; බහි

අයං තෙසං ජෙට්ඨා දුබ්බිතකො.

ඉතො පරං තීසු විනයටීකාසු තත්ථ තත්ථ ආගතං තං තං පාඨං පරිදීපෙන්තා අත්තනො වාදං පතිට්ඨාපෙතුකාමා තෙ බෝ පන ථෙරා තාව, යථා ච උදකුක්ඛෙපසීමාය කම්මං කරො නෙතහි එවං බද්ධසීමාය වා ගාමසීමාය වා කම්මං කරොන්තෙහි. උදකුක්ඛෙපසීමට්ඨෙ සොධෙත්වා කාතබ්බන්ති ඉමං විමති විනොදනීපාඨං දස්සෙත්වා, එත්ථ හි යථා උදකුක්ඛෙප සීමාය කම්මං කරොන්තෙහි සති රුක්ඛාදීනං ගාමසම්බන්ධෙ ගාමට්ඨෙ භික්ඛු සොධෙත්වා කම්මං කාතබ්බං තථා බද්ධසීමාය වා ගාමසීමාය වා කම්මං කරොන්තෙහි සති උදකුක්ඛෙපසීමාසම්බන්ධෙ තට්ඨිතෙ

---

සීමාකරණ වසෙන ච, කිහිසිම් කිරීම් වශයෙන් ම; සොධෙත්වා ති, ශුද්ධකොට මය යනු; විමතිවිනොදනියං, විමතිවිනොදනියෙහි; වුත්තං, කියනලදී. **තෙසං, ඒ සථවිරවරුන්ගෙ; අයං ජෙට්ඨා දුබ්බිතකො, මේ සවන දුවිතක්කයයි.**

ඉතො පරං, මෙයින් මතු; තීසු විනයටීකාසු, විනයටීකාත්‍රයෙහි; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; ආගතං, ආවාවූ; තං තං පාඨං, ඒ ඒ පාඨය; පරිදීපෙන්තා, පැහැදිලි කරමින්; අත්තනො වාදං, තම වාදය; පතිට්ඨාපෙතුකාමා, පිහිටුවනු කැමැත්තාවූ; තෙ බෝ පන ථෙරා, ඒ තෙරවරු වනාහි; තාව, පළමුකොට ම; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමායෙහි; කම්මං කරොන්තෙහි, කම්කරන්නහු විසින්; යථා ච, යම්සේ සීමාව ශුද්ධකොට කටයුතුද? එවං, එසේම; බද්ධසීමාය වා, බද්ධසීමායෙහි හෝ ගාමසීමාය වා, ගාම්සීමායෙහි හෝ; කම්මං කරොන්තෙහි, කම්කරන්නන් විසිනුත්; (තත් තත් සීමසථයන් ශුද්ධකොට කටයුතුයි.)

"උදකුක්ඛෙපසීමට්ඨෙ සොධෙත්වා කාතබ්බන්ති, උදකුක්ඛෙපසීමට්ඨෙ සොධෙත්වා කාතබ්බං, යන" ඉමං විමතිවිනොදනීපාඨං, මේ විමතිවිනොදනී ටීකාපාඨය; දස්සෙත්වා, දක්වා; එත්ථ හි උදකුක්ඛෙපසීමාය, මේ උදකුක්ඛෙපසීමායෙහි වනාහි; යථා, යම්සේ; කම්මං කරොන්තෙහි, කම්කරන්නන් විසින්; රුක්ඛාදීනං, වෘක්ෂාදීන්ගේ; ගාමසම්බන්ධෙ සති, ගම හා මිශ්‍රවීමක් ඇතිකල; ගාමට්ඨෙ භික්ඛු, ගාමසීමායෙහි සිටි භික්ෂූන්; සොධෙත්වා, ශුද්ධකොට; කම්මං කාතබ්බං, කම්කටයුතුයි; බද්ධසීමාය වා, බද්ධසීමායෙහි හෝ; ගාමසීමාය වා, ගාමසීමායෙහි හෝ; කම්මං කරොන්තෙහි, කම්කරන්නන් විසින් තථා, එසේම කටයුතු. උදකුක්ඛෙප සීමා සම්බන්ධෙ සති, උදකුක්ඛෙප සීමා සම්බන්ධය ඇතිකල; තට්ඨිතෙ භික්ඛු, එහි සිටි භික්ෂූන්; සොධෙත්වා, ශුද්ධකොට; කාතබ්බන්ති, කටයුතුය යන; අධිප්පායො ති ච, අදහසක් ය කියා ද; එත්ථ ච මෙහිද උදකුක්ඛෙප

භික්ඛූ සොධෙත්වා ඨාතබ්බන්ති අධිප්පායො තිච, එත්ථ ච උදකුක්ඛෙප සීමට්ඨෙ සොධෙත්වා එවාදිනා අන්තො නදියං ජාතරුක්ඛසෙතුආදීනං ගාමසම්බන්ධෙපි උදකුක්ඛෙපසීමට්ඨතං න විජහතීති අත්ථො සිජ්ඣතීති දට්ඨබ්බන්ති ච, යම්පන ද්විධාඅධිප්පායං වණ්ණෙන්ති තෙසු පුරිමාධිප්පායො යුජ්ජති, දුතියො පන අධිප්පායො අන්තො නදියං ජාතරුක්ඛාදීනං ගාමසම්බන්ධෙ විජ්ජමානෙ පි යදි උදකුක්ඛෙප සීමා උප්පජ්ජතීති වුත්තො සියා තං න යුජ්ජති, කස්මා? ගාමසම්බන්ධෙ සති උදකුක්ඛෙපසීමාය අසම්භවතො, තස්මා යථා වුත්තෙන ටීකාපාඨෙන සයං උප්පන්නාය උදකුක්ඛෙප සීමාය විසභාග විහාර ගාමසීමාදීහි සද්ධිං පච්ඡා ජාත සම්බන්ධො එව දොසො'ති දස්සිතො,

යදි හි විසභාගසීමාදීහි සද්ධිං සම්බන්ධො හුත්වා අඤ්ඤ විසභාග සීමා එකක්ඛණෙ වා පච්ඡා වා උප්පජ්ජෙය්‍ය එකං සෙත පාළියා

---

සීමට්ඨෙ, උදකුක්ඛෙප සීමා යෙහි සිටියවුන්; සොධෙත්වා ඉති, ශුද්ධ කොට යන; ආදිනා, මේ ආදිවශයෙන්; අන්තො නදියං, ඇතුල් නදියෙහි; ජාතරුක්ඛසෙතුආදීනං, හටගත් රුක් හේ ආදීන් ගේ; ගාමසම්බන්ධෙ පි, ගම හා සම්බන්ධය ඇතිකලද; උදකුක්ඛෙප සීමට්ඨතං, උදකුක්ඛෙපසීමාව පිහිටන බව; න විජහතී'ති, අත්නොහරී යන; අත්ථො, අදහසක්; සිජ්ඣතී'ති, සිද්ධවෙයි යනු; දට්ඨබ්බන්ති ච, දතයුතුය කියා ද; යම්පන අධිප්පායං, යම් අදහසක්; ද්විධා, දෙපරිද්දෙකින්; වණ්ණෙන්ති, වණ්නත්ද; තෙසු, ඔවුන් අතුරෙහි; පුරිමාධිප්පායො, පළමු අදහස තෙමේ; යුජ්ජති, යෙදේ; දුතියො අධිප්පායො පන, දෙවන අදහස වනාහි; අන්තො නදියං, නදිය තුළ, ජාතරුක්ඛාදීනං, හටගත් වෘක්ෂාදීන්ගේ; ගාමසම්බන්ධෙ, ගම හා සම්බන්ධය; විජ්ජමානෙ පි, පවත්නා කල්හිද; යදි, ඉදින්; උදකුක්ඛෙප සීමා, උදකුක්ඛෙප සීමා තොමෝ; උප්පජ්ජතී'ති, උපදී යයි; වුත්තො සියා, කියනලදවේ නම්; තං, ඒ කීම; නයුජ්ජති, නොයෙදේ; (සුදුසු නොවේ) කස්මා, කුමක් හෙයින්ද? යත්, ගාම සම්බන්ධෙ සති, ගම හා සම්බන්ධය ඇතිකල්හි; උදකුක්ඛෙප සීමාය, උදකුක්ඛෙප සීමාව ගේ; අසම්භවතො, හටනොගැන්මවන හෙයිනී; තස්මා, එහෙයින්; යථා වුත්තෙන ටීකාපාඨෙන, යථොක්ත ටීකා පාඨයෙන්; සයං උප්පන්නාය, තෙමේ හටගත්තාවූ; උදකුක්ඛෙප සීමාය, උදකුක්ඛෙප සීමාවගේ; විසභාග විහාර ගාම සීමාදීහි සද්ධිං, විසභාග බද්ධ ගාම සීමාදීන් සමග; පච්ඡා ජාත සම්බන්ධො එව, පසුව හටගත් සම්බන්ධයම; දොසො'ති, දොෂයයි; දස්සිතො, දක්වන ලදී.

යදි හි, ඉදින් වනාහි; විසභාගසීමාදීහි සද්ධිං, විසභාගසීමාදීන් සමග; සම්බන්ධො හුත්වා, සම්බන්ධව; අඤ්ඤ විසභාගසීමා, අන්‍ය විසභාග

විරුජ්ඣති, යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතා තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහන්ති වුත්තත්තා ~~~ යථා හි බද්ධසීමාය එකදෙසං අන්තො කත්වා පච්ඡා සම්මතා පි සීමා අසම්මතා විය විසභාගං බද්ධසීමං වා ගාමසීමං වා ඉතරං වා අන්තො කත්වා උදකුක්ඛෙප සීමා න උප්පජ්ජතෙ ච ~~~ තෙනෙව විමතිවිනොදනියං, යථා හි බද්ධසීමාය සම්මතා බද්ධසීමා විපත්තිසීමා හොති තාසං අඤ්ඤමඤ්ඤං රුක්ඛාදිසම්බන්ධො න වට්ටති, එවං නදීආදීසු සම්මතා පි බද්ධසීමා විපත්තිසීමා ච හොතී ති තාහි පි සද්ධිං තාසං රුක්ඛාදිසම්බන්ධො න වට්ටතීති සිජ්ඣතීති වුත්තං.

---

සීමාවක් තොමෝ; එකක්ඛණෙ වා, එකවිට හෝ; පච්ඡා වා, පසුව හෝ; උප්පජ්ජෙය්‍ය, උපදින්නී නම්; එකං සෙත, එකතින්; පාළියං, පෙළට; විරුජ්ඣති, විරුද්ධවේ; (කුමක්හෙයින්ද යත්?,) භික්ඛවෙ, මහණෙනි; යෙසං, යම් කෙනෙකුන් විසින්; සීමා, ප්‍රථම සම්මත සීමාවක් තොමෝ; පච්ඡා සම්මතා, (සමගිකඳනය කිරීමෙන්) පසුව බඳනා ලද්දීද?; තෙසං, ඔවුන්ගේ; (ඒ සීමාවෙහි කරණලද) තං කම්මං, ඒ කර්මය; අධම්මිකං, අධාර්මිකවෙයි; කුප්පං, කොප්‍යවේ; අට්ඨානාරහන්ති, (උපසම්පදා කර්මයට) කාරණය නොවේයයි; වුත්තත්තා, වදාරණලද බැවිනි; (උපසම්පදා කම්මස්ස කාරණං හොතීති ඨානාරහං නාම, යනු කීහු. අට්ඨානාරහං, යන මෙහි (අකාර, විරහාර්ථකරවේ;) යථා හි, මෙසේම; බද්ධසීමාය, බද්ධ සීම්හි; එකදෙසං, එකදෙශයක්; අන්තො කත්වා, ඇතුල් කොට; පච්ඡා සම්මතා පි, පසුව සම්මතවූ ද සීමා තොමෝ; අසම්මතා විය, අසම්මත වූවාක් මෙන්; විසභාගං, විසභාගවූ; බද්ධසීමං වා, බද්ධසීමාවක් හෝ; ගාමසීමං වා, ගාමසීමාවක් හෝ; ඉතරං වා, අනිකුදු සීමාවක් හෝ අන්තො කත්වා, ඇතුල් කොට; උදකුක්ඛෙපසීමා, උදකුක්ඛෙප සීමා තොමෝ; න උප්පජ්ජතෙව, නූපදීමය; ~~~ බද්ධසීමාය, බද්ධ සීමාවෙහි; සම්මතා, සම්මතකරණලද; බද්ධසීමා, බද්ධසීමා තොමෝ; විපත්තිසීමා හොති, විපත්තිසීමා වෙයි. තාසං, ඔවුන්ගේ; අඤ්ඤමඤ්ඤං, එකිනෙකට; රුක්ඛාදි සම්බන්ධො, වෘක්ෂාදීන් හා සම්බන්ධය; යථා හි, යම්සේ; න වට්ටති, නොවටීද; එවං, එසේම; නදී ආදීසු, නදී ආදියෙහි; සම්මතා, සම්මත කරණලද; බද්ධසීමා පි, බද්ධසීමා වද; විපත්ති සීමා ච හොතී ති, විපත්ති සීමාවම වේයයි යනු ද; තාහි පි සද්ධිං, ඒ බද්ධසීමාවන් සමග; තාසං, ඒ නදී සිමාවන්ගේ සම්බන්ධය ද; රුක්ඛාදි සම්බන්ධො, ඔවුන් හා වෘක්ෂාදීන්ගේ සම්බන්ධය ද; න වට්ටතී ති, නොවටියි යනු ද; සිජ්ඣතී ති, සිද්ධවේ යයි; විමතිවිනොදනියං, විමතිවිනොදනියෙහි; තෙනෙ ච, එහෙයින් ම; වුත්තං, කියනලදී.

අයං තෙසං සත්තමො දුබ්බිතක්කො.

පුන, විසභාග සීමාසු රුක්ඛාදිසම්බන්ධෙ සති එකත්ථ ඨිතො ඉතරට්ඨානං කම්මං කොපෙතී ති ඉමස්ස ටීකාපාඨං ආහරිත්වා ඉමස්ස ච පාඨස්ස යථාධිප්පායං වණ්ණෙත්වා, පුන, එකත්ථ ඨිතො ඉතරට්ඨානනන්ති වචනෙන යථා වුත්තසෙතුනො ගාමසම්බන්ධස්සා පි ගාමතො පට්ඨාය වුට්ඨිතස්සා පි න කෙවලං ගාමට්ඨභාවො යෙව හොති, අථ ඛො ගාමප්පවිට්ඨභාගස්ස ගාමට්ඨභාවො උදකුක්ඛෙප සීමප්පවිට්ඨභාගස්ස උදකුක්ඛෙපසීමට්ඨභාවො පසිද්ධතරො ති අඤ්ඤථාධිප්පායං වණ්ණෙන්ති, තං නෙව යුජ්ජති, එත්ථ සෙතුනො ඉතරො පි භාගො අත්ථි, කො සො, නදියං පතිට්ඨිත

---

තෙසං, ඔවුන්ගේ; අයං, මේ; සත්තමො දුබ්බිතක්කො සප්තම දුර්විතර්කයයි.

පුන, ඉක්බිති; විසභාගසීමාසු, විසභාග සීමාවල; රුක්ඛාදි සම්බන්ධෙ සති, වෘක්ෂාදීන් හා සම්බන්ධය ඇතිකල්හි; එකත්ථ, එක් සීමාවෙක්හි; ඨිතො, සිටියේ; ඉතරට්ඨානං, අනික් තැන; (කරණ ලද) කම්මං, කර්මය; කොපෙතීති, කොප්‍ය කෙරෙයි යන; ඉමස්ස ටීකාපාඨං, මේ ටීකා පාඨයද; ආහරිත්වා, ගෙණහැර දක්වා. ඉමස්ස ච පාඨස්ස, මේ පාඨයාගේද; (“ඉමස්ස ච” යන මෙහි “ච, ශබ්දය අන්‍ය පාඨයන්ගේද දැක්වීම පිණිසය “අවධාරනම්පන අඤ්ඤසම්පි නිදස්සනත්ථං” යනු එහෙයින් කියනලදී.) යථාධිප්පායං වණ්ණෙත්වා, අදහස්වූ පරිදි වර්ණනාකොට; පුන, නැවත; එකත්ථ ඨිතො ඉතරට්ඨානනන්ති” එකත්ථ ඨිතො ඉතරට්ඨානං, යනු; වචනෙන, කීමෙන්; ගාමසම්බන්ධස්සා පි, ගම හා සම්බන්ධවූද; ගාමතො පට්ඨාය, ගම පටන්; වුට්ඨිතස්සා පි, නැගී සිටියාවූද; යථා වුත්තසෙතුනො, යථොක්ත හෙයගේ; කෙවලං, හුදෙක්; ගාමට්ඨභාවො යෙව, ගමෙහි පිහිටි ස්වභාවය ම; න හොති, නො වෙයි; අථ ඛො, එසේ වී නම් කෙසේ ගමෙහි පිහිටි ස්වභාවය නොවේද? ගාමප්පවිට්ඨභාගස්ස, ගමෙහි ඇතුලත් කොටසගේ; ගාමට්ඨභාවො, ගමෙහි පිහිටි ස්වභාවයද; උදකුක්ඛෙප සීමප්පවිට්ඨභාගස්ස, උදකුක්ඛෙප සීමාවෙහි ඇතුලත් කොටසගේ; උදකුක්ඛෙපසීමට්ඨභාවො, උදකුක්ඛෙප සීමාවෙහි; පිහිටි ස්වභාවයද; පසිද්ධතරො ති, ඉතා ප්‍රසිද්ධවෙයි යන අඤ්ඤථාධිප්පායං අන් ප්‍රකාර අදහසක්; වණ්ණෙන්ති, වණීත්, තං, එය; නෙ ව යුජ්ජති, නො ම යෙදෙයි. එත්ථ, මෙහි; සෙතුනො, හෙයගේ; ඉතරො පි භාගො, අනිකුදු කොටසෙක්; අත්ථි, ඇත; සො, ඒ කොටස; කො, කවරේද?; නදියං, නදියෙහි; පතිට්ඨිතභාගො, පිහිටි කොටසයි;

භාගො, තදෙත්ථ වත්තුං පමුට්ඨා විය දිස්සන්ති, යදි පන යතො විසභාගසීමතො ආගන්ත්වා සෙතු වා අඤ්ඤං වා යො කො චි ඉතරං විසභාගසීමං පවිසිත්වා සො පවිට්ඨභාගො පුරිමසීමට්ඨ භාවං හිත්වා ඉතර සීමට්ඨභාවං උප ගච්ඡෙය්‍ය කො එත්ථ දෙසො සියා, ඉමිනා තෙසං විපල්ලාසාධිප්පායහෙතුනා සකං වාදං සය මෙ ච දුබ්බලීකරොන්ති මොසං වත අම්හාකං වාදෙ නිරත්ථකො ති පකාසෙන්තා විය පි දිස්සන්ති—තෙ එව පන ථෙරා පරතො යම්පන ඉතො ගතන්ති වා චවාදිං විමතිවිනොදනීපාඨං නිදස්සනං කරිස්සන්ති, සො එවෙත්ථ පාඨො සාධකො ති දට්ඨබ්බො, අඤ්ඤ මෙපෙත්ථ කාරණං උපරි වක්ඛාම.

අයං තෙසං අට්ඨමො දුබ්බිතක්කො.

---

තං, එය; එත්ථ, මෙහි; වත්තුං, කියන්ට; පමුට්ඨා විය, මුළාවූවන් මෙන්; දිස්සන්ති, දක්නා ලැබෙත්. යදි පන, ඉදින් වනාහි; යතො විසභාග සීමතො, යම් විසභාග සිමාවකින්; ආගන්ත්වා, අවුත්; සෙතු වා, හෙයක් හෝ; අඤ්ඤං වා, යො කොචි, වෙන යම් කිසිවක් හෝ; ඉතරං විසභාගසීමං, අන්‍ය විසභාග සීමාවකට; පවිසිත්වා, ප්‍රවිෂ්ටව පවතීද? සො පවිට්ඨභාගො, ඒ ප්‍රවිෂ්ටවූ කොටස; පුරිම සීමට්ඨභාවං, පළමු සීමාවෙහි පිහිටි සවභාවය; හිත්වා, හැර; ඉතර සීමට්ඨභාවං, අන්‍ය සීමාවක පිහිටි සවභාවයට; උප ගච්ඡෙය්‍ය, පැමිණෙන්නේ නම්; එත්ථ, මෙහි; කො දෙසො සියා, කවර දෙෂයක් වේද? තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; ඉමිනා විපල්ලාසාධිප්පාය හෙතුනා, මේ විඩම්බනාභිප්‍රායහෙතුකොටගෙණ; සකං වාදං, සවකීය වාදය; සය මෙව, තුමූම; දුබ්බලීකරොන්ති, දුර්වල කරත්. අම්හාකං, අපගේ; වාදෙ, වාදය තෙමෙ; වත, එකාන්තයෙන්; මොසං, හිස්වූයේය; නිරත්ථකො ති, ව්‍යර්ථයයි; පකාසෙන්තා විය, ප්‍රකාශ කරන් නවුන් මෙන්; දිස්සන්ති, දක්නා ලැබෙත්.—තෙ එව පන ථෙරා, ඒ ස්ථවිරහුම වනාහි; "පරතොයම්පන ඉතො ගතන්ති වාචවාදිං, පරතො යම්පන ඉතො ගතන්ති වා, යනාදිවූ; විමතිවිනොදනීපාඨං, විමතිවිනොදනී පාඨය; නිදස්සනං කරිස්සන්ති, නිදසුන් කරත්; (කරිස්සන්ති" යන මෙහි වර්තමානාර්ථයෙහි භවිස්සන්ති, ප්‍රයොගයි.) එත්ථ, මෙහි; සො එව පාඨො, ඒ පාඨය ම; සාධකො ති, සාධක යයි; දට්ඨබ්බො, දතයුතුයි. එත්ථ, මෙහි; අඤ්ඤං, කාරණම්පි, අනික් කාරණක්ද; උපරි, මත්තෙහි; වක්ඛාම; කියන්නෙමු.

තෙසං, ඒ තෙරවරුන්ගේ; අයං අට්ඨමො දුබ්බිතක්කො, මේ අෂටම දුර්විතර්කයයි.

පුන, විසභාගාය සීමාය එවං පවිට්ඨෙ සකල සීමා සොධනං, සභාගාය සීමාය එවං පවිට්ඨෙ වුසිත්වා ඨිතමත්ත භික්ඛූ සොධනන්ති, එතස්ස තට්ටිකාපාඨස්ස අධිප්පායත්ථං වණ්ණෙත්වා, අථ ඉමිනා පි යථා වුත්ත සීමාමාළකෙ කම්මං කරොන්තෙහි යථා වුත්ත සෙතු සම්බන්ධ ගාමට්ඨෙ භික්ඛූ සොධෙත්වා කාතබ්බං, තථා තස්මිං ගාමෙ කම්මං කරොන්තෙහි යථා වුත්තසෙතුනො සමීපෙ අන්තො උදකුක්ඛෙපෙ පතිට්ඨිතමාළකට්ඨෙ පි භික්ඛූ සොධෙත්වා කාතබ්බන්ති අත්ථො පාකටතරො ති වදන්ති, ඉදම්පන ගාමොදකුක්ඛෙපානං සම්බන්ධෙ සති යුජ්ජතෙව නාසතීති දට්ඨබ්බං, එත්ථ හි ගාමොදකුක්ඛෙපසීමායො අඤ්ඤමඤ්ඤව්‍යවච්ඡෙජ්ජා හුත්වා පවත්තන්ති තස්මා සො අධිප්පායත්ථො එත්ථ අපාකටතරො.

අයං තෙසං නවමො දුබ්බිතක්කො.

---

පුන, නැවතද; විසභාගසීමාය, විසභාග සීමාවෙහි; එවං, මෙසේ; පවිට්ඨෙ, සෙත්වා දිය ප්‍රවිෂ්ටවූ කල්හි; සකලසීමා සොධනං, සියලු සීමාවගේ ශුද්ධකිරීම වේ. සභාගාය සීමාය, සභාග සීමාවෙහි; එවං, මෙසේ; පවිට්ඨෙ, ප්‍රවිෂ්ටවූවන්; වුසිත්වා, සපශීකොට; ඨිත මත්තභික්ඛූසොධනන්ති, සිටි පමණ භික්ෂූන් ශුද්ධකිරීම වේ යන; එතස්ස තට්ටීකාපාඨස්ස, මේ ඒ ටීකා පාඨයාගේ; අධිප්පායත්ථං, අභිප්‍රායාර්ථය; වණ්ණෙත්වා, වර්ණනා කොට; අථ, අනතුරුව; ඉමිනා පි, මෙයින්ද; යථා වුත්ත සීමා මාළකෙ, යථොක්ත සීමා මාලකයෙහි; කම්මං කරොන්තෙහි, කර්ම කරන්නන් විසින්; යථා වුත්ත, යථොක්තවූ; සෙතුසම්බන්ධ, හෙය සම්බන්ධවූ; ගාමට්ඨෙ භික්ඛූ, ග්‍රාමස්ථ භික්ෂූන්; සොධෙත්වා, ශුද්ධකොට; කාතබ්බං, කටයුතුයි. තස්මිං ගාමෙ, ඒ ගාමසීමායෙහි; කම්මං කරොන්තෙහි, කර්ම කරන් නන් විසින්; යථාවුත්ත සෙතුනො, යථොක්ත හෙයගේ; සමීපෙ, සමීපයෙහිවූ; අන්තො උදකුක්ඛෙපෙ, උදකුක්ඛෙපය තුළ; පතිට්ඨිතමාළකට්ඨෙපි, පිහිටි මාලකයෙහි සිටියාවූ ද; භික්ඛූ, භික්ෂූන්; සොධෙත්වා, ශුද්ධ කොට; කාතබ්බන්ති, කටයුතුය යන; අත්ථො, අදහස; පාකටතරො ති, ප්‍රකට තරය යි; වදන්ති, කියත්. ඉදම්පන, මේ කීම වනාහි; ගාමොදකුක්ඛෙපානං, ගාමොදකුක්ඛෙපයන්ගේ සම්බන්ධෙ සති, සම්බන්ධය ඇතිකල; යුජ්ජතෙ ච, යෙදේමැ යි අසති, නැතිකල්හි; න ඉති, නොයෙදේයයි; දට්ඨබ්බං, දතයුතුයි. එත්ථ හි, මෙහි වනාහි; ගාමොදකුක්ඛෙප සීමායො, ගාමොදකු ක්ඛෙපසීමාවෝ; අඤ්ඤමඤ්ඤව්‍යවච්ඡෙජ්ජා හුත්වා, ඔවුනොවුන් පිරිසුන්වූවෝ ව; පවත්තන්ති, පවතිත්. තස්මා, එහෙයින්; සො අධිප්පායත්ථො, ඒ අභිප්‍රායාර්ථය, එත්ථ, මෙහි; අපාකට තරො, ඉතා අප්‍රකටවේ.

පුන, යම්පන ඉතො ගතනති වා තතො ආගතනති වා වත්තුං අසක්කුණෙය්‍යෙසු උභොසු බඩසීමා ගාමසීමාසු උදකුක්ඛෙපනදී ආදිසු ච තිරියං. පතිතරජ්ජුදණ්ඩාදි, තත්‍ථ කිංකාතබ්බනති, එත්‍ථ පන බඩසීමාය පතිට්ඨිතභාගො බඩසීමා ගාමසීමාය පතිට්ඨිතභාගො ගාමසීමා තදුභයසීමට්ඨ පබ්බතාදිවිය, බඩසීමතො උට්ඨිත වටරුක්ඛස්ස පාරොහො ගාමසීමාය ගාමසීමතො උට්ඨිතවටරුක්ඛස්ස පාරොහො ච බඩසීමාය පතිට්ඨිතො පි එසෙව නයො, මූලෙහි පතිට්ඨිතකාලතො පට්ඨාය ඉතො ගතනති වා තතො ආගතනති වා වත්තුං අසක්කුණෙය්‍යතො සො සො භාගො යථා පති

---

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; නවමො දුබ්බිනකෙකා නවමම් දුර්විතර්කයයි.

පුන, වැලිදු; යම්පන, යමක් වනාහි ඉතො ගතනති වා, මෙයින් ගියේයයි හෝ; තතො ආගතනති වා, එයින් ආයේය යි හෝ; වත්තුං, කියන්ට; අසක්කුණෙය්‍යෙසු, නොහැකිවූ; උභොසු බඩ සීමා ගාම සීමාසු, බඩ සීමා ගාම සීමා දෙක්හි ද; උදකුක්ඛෙප නදී ආදීසුච, උදකුක්ඛෙප සීමා නදී සීමා ආදියෙහිද; තිරියං, සරස පතිතරජ්ජුදණ්ඩාදි, හුණුරුහැන්දඬු ආදියක් වේ ද; තත්‍ථ, එහි දී; කිං කාතබ්බනති, කුමක්කටයුතු දැයි; එත්‍ථ පන, මෙහි වනාහි; බඩසීමාය, බදසිම්හි; පතිට්ඨිතභාගො, පිහිටිකොටස; බඩසීමා, බඩසීමානම් වෙයි; ගාමසීමාය, ගාමසීමාවෙහි; පතිට්ඨිත භාගො, පිහිටිභාගය; ගාමසීමා, ගාමසීමා වෙයි; තදුභයසීමට්ඨ පබ්බතාදී විය, ඒ ද්විවිධවූ බඩසීමාග්‍රාමසීමාවන්හි පිහිටි පර්‍වතාදිය මෙනි; (ද්විප්‍රකාරවූබඩසීමා ගාමසීමාවන්හි ද උදකුක්ඛෙපසීමා නදීසීමාවන්හිද රුහැන්දඬුආදීහු සරසවැටෙත් ද, එතනදී කුමක් කටයුතුද? බඩසීමායෙහි පිහිටිකොටස බඩසීමා නමැයි, කියාද ගාමසීමායෙහි පිහිටි කොටස ගාමසීමා නමැයි. කියාද ඒ බඩගාම සීමාවන්හි පිහිටි පර්‍වත පිට්පහන් ආදිය මෙන් දතයුතුය, යනු මෙහි භාවයි.) බඩසීමතො, බදසිමින්; උට්ඨිත, නැංගාවූ; වටරුක්ඛස්ස, නුගරුකගේ; පාරොහො, අරළුව; ගාමසීමාය, ගාමසීමා වෙහි ද; ගාමසීමතො, ගාමසීමාවෙන්; උට්ඨිත, නැංගාවූ; වටරුක්ඛස්ස, නුගරුකගේ, පාරොහො, අරළුව; බඩසීමාය ච, බදසිම්හි ද; පතිට්ඨිතො පි, පිහිටියේ ද? එසෙව නයො, මේ ක්‍රමය මැයි; මූලෙහි, මුල්වලින්; පතිට්ඨිතකාලතො පට්ඨාය, පිහිටිකාලයේ පටන්; ඉතො ගතනති වා, මෙයින් ගියේය යි හෝ; තතො ආගතනති වා, එයින් ආයේය යි හෝ; වත්තුං, කියන්ට; අසක්කුණෙය්‍යතො, නොහැකිහෙයින්; සො සො භාගො, ඒ ඒ භාගය; යථාපතිට්ඨිත,

ට්ඨිත සීමාසඞ්ඛමෙව ගච්ඡති, තෙසං රුක්ඛපාරොහානං අන්තරා පන ආකාසට්ඨසාඛා භූමියං සීමාපරිච්ඡෙදප්පමාණෙන තදුභය සීමං හොන්ති ති කෙ චි වදන්ති, යස්මා පනස්සා සාඛාය පාරොහො පවිට්ඨසීමාය පථවියං මූලෙහි පතිට්ඨහිත්වා පි යාව සාඛං විනා. ඨාතුං න සක්කොති තාව මූලසීමට්ඨතං න විජහති, යදා පන විසුං ඨාතුං සක්කොති තදා පි පාරොහමත්තමෙව පවිට්ඨසීම ට්ඨතං සමුපෙති තස්මා සබ්බො පි ආකාසට්ඨසාඛාභාගො පුරිම සීමට්ඨතං න විජහති තතො ආගතභාවස්ස අවිජහිතත්තා ති අම්හාකං ඛන්ති,

උදකුක්ඛෙප නදීආදිසු පි එසෙව නයො ති අස්ස ටීකාපාඨස්ස යම්පන ඉතො ගතන්ති ආදිතො යාව ගාමසීමාය පතිට්ඨිත භාගො ගාමසීමා ති ච මූලෙහි පතිට්ඨිතකාලතො ති ආදිතො

---

පිහිටිපරිදි; සීමාසඞ්ඛ මෙව, සීමාව්‍යවහාරයට ම; ගච්ඡති, යෙයි. තෙසං රුක්ඛපාරොහානං, ඒ වෘක්‍ෂප්‍රරොහයන්ගේ; අන්තරා පන, අතර වනාහි; ආකාසට්ඨසාඛා, අහසපිහිටි ශාඛාවෝ; භූමියං, බිම; සීමාපරිච්ඡෙදප්පමාණෙන, සීමාපරිච්ඡෙද ප්‍රමාණයෙන්; තදුභය සීමාහොන්ති ති, ඒ විප්‍රකාරවූ බද්ධගාමසීමාවෙත් යයි; කෙ චි, කිසිකෙනෙක්; වදන්ති, කියත්; යස්මා පන, යම්හෙයකින් වනාහි; අස්සා සාඛාය, මේ ශාඛාවගේ; පාරොහො, අරළුවතෙම; පවිට්ඨ සීමාය, ප්‍රවිෂ්ටසීමාවෙහි; පථවියං, පොළොවෙහි; මූලෙහි, මුල් වලින්; පතිට්ඨහිත්වා පි, පිහිටාගෙණ ද; සාඛං යාව, ශාඛාව දක්වා; විනා ඨාතුං, වෙන්ව සිටින්ට; න සක්කොති, නො හැකිවේද? තාව, ඒතාක්; මූලසීමට්ඨතං, මුල්සීමාවෙහි පිහිටිබව; න විජහති, අත්නොහරියි; යදා පන, යම්කලෙක්හි වනාහි; විසුං ඨාතුං, වෙන්ව සිටීමට; සක්කොති, හැකිවේද? තදා පි, එකල්හි දු; පාරොහමත්ත මෙව, අරළුවපමණක් ම; පවිට්ඨසීමට්ඨතං, ප්‍රවිෂ්ටවූසීමාබවට; සමුපෙති, පැමිණේද? තස්මා, එහෙයින්; සබ්බො පි, සියලුම; ආකාසට්ඨසාඛාභාගො, ආකාශස්ථශාඛාභාගය; පුරිමසීමට්ඨතං, පළමුසීමායෙහි පිහිටි ස්වභාවය; න විජහති, අත්නොහරියි. තතො, එයින්; ආගතභාවස්ස, පැමිණිස්වභාවය තමා; අවිජහිතත්තා ති, අත්නොහැරියෙ බැවින් පළමු සීමාවම වෙයි යනු, අම්හාකං, අපගේ, ඛන්ති, රුචියයි;

උදකුක්ඛෙප නදීආදිසු පි, උදකුක්ඛෙප සීමා නදීසීමාදියෙහි ද; එසෙව නයො ති, මේ ක්‍රමය මැයි යන; අස්ස ටීකාපාඨස්ස, මේ ටීකාපාඨයාගේ; "යම්පන ඉතො ගතන්ති, යම්පන ඉතො ගතං," යන්නෙන්; ආදිතො යාව, මුලදක්වා; ගාමසීමාය, ගාමසීමායෙහි; පතිට්ඨිතභාගො, පිහිටිකොටස; ගාමසීමා ති ච, ගාමසීමා යයි

යාව අසක්කුණෙය්‍යතො ති ච, එවං අන්තරන්තරා වාක්‍යද්වයං උද්ධරිත්වා අත්තනො වාදං පතිට්ඨාපෙතු මිච්ඡන්තා එත්ථ යථා ධිප්පායත්ථං සබ්බථා පරි වජ්ජෙත්වා අත්තනො යථා රුචි පරිදී පෙන්තා, එත්ථ හි රජ්ජුදණ්ඩාදීනං ද්වීසු සීමාසු ඵුසිත්වා පතිට්ඨිත භාගො යථා සකං පතිට්ඨිත සීමාභාවෙන වුත්තො, එත්ථ පන කිඤ්චා පි රජ්ජුදණ්ඩාදිකො යෙව වුත්තො තථා පි සෙත්වාදිකො පි ගහිතො යෙව, සෙත්වාදිකො පි හි උදකුක්ඛෙප ගාමාදිසම්බන්ධො ඉතො ගතො ති වා තතො ආගතො ති වා වත්තුං අසක්කුණෙය්‍යො, අපි චෙ සො උභයසීමා සඞ්කරකාරෙ ත්වෙ ච වුච්චතී ති එවං වදන්ති — අයමෙතෙස මභිනිවෙසො, ටීකායම්පන නිස්සය නිස්සිතානං ද්වින්නං ගාම බද්ධ සීමානඤ්ච ඉතරානං නදීඋදකුක්ඛෙපා

---

කියාද; “මූලෙහිපතිට්ඨිතකාලතො ති, මූලෙහිපතිට්ඨිතකාලතො,” යන්නෙන්; ආදිතො යාව, මුලදක් වා; අසක්කුණෙය්‍යතොතිච, (මෙසින් ගියේය යි හෝ එසින් ආයේය යි හෝ කියන්ට) නොහැකි හෙයිනැයි කියාද; එවං, මෙසේ; අන්තරන්තරා, අතර අතර; වාක්‍යද්වයං, වාක්‍යදෙකක්; උද්ධරිත්වා, උදුරා; අත්තනො වාදං, තම වාදය; පතිට්ඨාපෙතුං, පිහිටුවන්ට; ඉච්ඡන්තා, කැමතිවන්නාහු; එත්ථ, මෙහි; යථාධිප්පායත්ථං, නියම අභිප්‍රායාර්ථය; සබ්බථා, සර්ව ප්‍රකාරයෙන්; පරි වජ්ජෙත්වා, බැහැර කොට; අත්තනො, තමන්ට; යථා රුචි, රුචිවූපරිදි; පරි දීපෙන්තා, ප්‍රකාශකරන්නාහු; එත්ථහි, මෙහි වනාහි; රජ්ජුදණ්ඩාදීනං, රැහැන්දඬුආදීන්; ද්වීසු සීමාසු, දෙසීමාවන්හි; ඵුසිත්වා, ස්පර්ශකොට. පතිට්ඨිතභාගො, පිහිටි භාගයතෙම; යථා සකං, තමතමාගේවශයෙන්; පතිට්ඨිතසීමාභාවෙන, පිහිටිසීමාබැවින්; වුත්තො, කියනලදී. එත්ථ පන, මෙහි වනාහි; කිඤ්චාපි, කිසි විධියකින්; රජ්ජුදණ්ඩාදිකො යෙව, රැහැන් දඬුආදියක්ම; වුත්තො, කියනලදී. තථා පි, එතකුදු වුවත්; සෙත්වාදිකො පි, හේදඬුආදිය ද; ගහිතො යෙව, ගන්නාලද මැයි, සෙත්වාදිකොපි හි, ඒදඬුආදිය වනාහි; උදකුක්ඛෙප ගාම සීමාදි සම්බන්ධො, උදකුක්ඛෙප සීමා ගාම සීමාදීන් හා, මුසුවීම; ඉතො ගතොති වා, මෙසින් ගියේය යි හෝ; තතො ආගතොති වා, එසින් ආයේය යි හෝ; වත්තුං, කියන්ට, අසක්කුණෙය්‍යො, නොහැක් කේය. අපි ච, එසේද වුවත්; එසො, මේසම්බන්ධයතෙම; (මුසුවීම) උභයසීමාසඞ්කරකාරො. ති එව, උදකුක්ඛෙප සීමා ගාම සීමා දෙදෙනාගේ. සඞ්කරය (මිශ්‍රීභාවය) කෙරේ මැයි, යනු; වුච්චතීති, කියනු ලැබේයයි; එවං, මෙසේ, වදන්ති, කියත්. එතෙසං, මේ ස්ථවිර ඇදුරන්ගේ; අයං අභිනිවෙසො, මේ වරදවාපිහිටාගැන්මකි; ටීකායම්පන, ටීකාවෙහි වනාහි; නිස්සයනිස්සිතානං, ආධාරආධෙය වූ;

දීනඤ්ච යෙන කෙන චි සම්බන්ධෙ සති පි දෙසාභාවො නිස්සය නිස්සිතවසෙන සභාගත්තා වුත්තො න පන විසභාගානං ගාමොද කුක්ඛෙපසීමාදීනං වුත්තො, යදි පන විසභාගානං ගාමොද කුක්ඛෙපසීමානං යො කො චි සම්බන්ධො. ඉතො ගතොති වා තතො ආගතොති වා වත්තුං අසක්කුණෙය්‍යො සියා කො හි නාම දෙසො භවෙය්‍ය, විමතිවිනොදනියං අසෙස ච පාඨස්ස ආදිම්හි විසභාගසීමා යො සඞ්ඛාය, එකසම්බන්ධෙන ගතනති රුක්ඛලතාදිං තත්‍ර ජාත මෙ ච සඞ්ඛාය වුත්තං තාදිසං හි ඉතො ගතනති වත්තබ්බතං අරහ තීති තාව දස්සෙත්වා යම්පන ඉතො ගතනති වා එවාදි වුත්තො, ඉමිනා පි චෙතං සිද්ධං, තස්මා තෙසං විපල්ලාසගාහො න ගහෙ තබ්බො ච.

අයං තෙසං දසමො දුබ්බිතක්කො.

---

චිත්තං ගාම බඩ සීමානඤ්ච, ගාමසීමා බඩසීමා දෙදෙනාගේද; ඉත රානං, අනිකුදු; නදී උදකුක්ඛෙපාදීනඤ්ච, නදීසීමාඋදකුක්ඛෙප සීමාදීන්ගේ ද; යෙන කෙන චි, යම් කිසි වෘක්ෂලතාදියක් හා; සම්බන්ධෙ සති පි, සම්බන්ධය ඇතිකල්හි ද; දෙසාභාවො, දෙසක් නොවීම; නිස්සයනිස්සිතවසෙන, නිශ්‍රයනිශ්‍රිතවශයෙන්; සභාගත්තා, සභාගහෙයින්; වුත්තො, කියනලදි. විසභාගානං, විසභාගවූ; ගාමො දකුක්ඛෙපාදීනං, ගාමොදකුක්ඛෙපාදි සීමාවන්ගේ; අන්‍යොන්‍ය සම්බන්ධය ඇතිකල්හි දෙසක් නැතිබව, න පන වුත්තො, නොකිය නලදමැයි.(දෙසක් ඇතිබැව් කියනලද මැයි සේයි) යදි පන, ඉදින් වනාහි; විසභාගානං, විසභාගවූ; ගාමොදකුක්ඛෙපසීමානං, ගාමො දකුක්ඛෙපසීමාවන්ගේ; යොකොචි සම්බන්ධො, යම්කිසි සම්බන්ධයක් තෙම; ඉතො ගතොති වා, මෙයින් ගියේය යි හෝ; තතො ආගතො ති වා, එයින් ආයේය යි හෝ; වත්තුං, කියන්ට; හි, යම්හෙයකින්; අසක්කුණෙය්‍යො සියා, නො හැකිවන්නේ නම්; කො නාම දෙසො, කිනම් දෙසෙක්; භවෙය්‍ය, වන්නේ ද? විමතිවිනොදනියං, විමති විනොදනියෙහි; අසෙස ච පාඨස්ස, මේ පාඨයාගේ ම; ආදිම්හි, ආදියෙහි; විසභාගසීමායො සඞ්ඛාය, විසභාගසීමාවන් සඳහා; එක සම්බන්ධෙන ගතනති, එකසම්බන්ධෙන ගතං, යත්‍ර, තත්‍ර ජාතං, එහි හටගත්තාවූ; රුක්ඛලතාදිං එව, වෘක්ෂලතාදිය ම, සඞ්ඛාය, සඳහා; වුත්තං, කියනලදී. තාදිසං හි, එබඳුවූ ම වෘක්ෂලතාදියක්; ඉතො ගත්නති, මේ සීමාවෙන් අන්‍යසීමාවකට ගියේය යි; වත්තබ්බතං, කියයුතුබව; අරහතී ති, සුදුසු යයි; තාව, පළමු කොට; දස්සෙත්වා, දක්වා; "යම්පන ඉතො ගතනති වා එවාදි, යම්ප න ඉතො ගතනති වා," යනාදිය; වුත්තො, කියනලදී. ඉමිනා පී ච, මේ කියමනෙන් ද; එතං, මේ කාරණය; සිද්ධං, සිද්ධ වෙයි. තස්මා, එසේහෙයින්; තෙසං, ඒ ස්ථවිර වරුන්ගේ; විපල්ලාසගාහො, විකාරගාහය; න ගහෙ තබ්බො ච, නො ගතයුතු මැයි.

පුන, ආවරණෙනාති දාරුආදීනි නිඛණිත්වා උදකනීවරණෙන, කොට්ඨකබන්ධෙනාති මත්තිකාදීහි පූරෙත්වා කතසෙතුබන්ධෙනාති එතම්පි ටීකාපාඨං ආහරිත්වා, එත්ථ ච මත්තිකාමයසෙතුනො උදකසොතාවරණත්තා නදීලක්ඛණවිනාසභාවො වුත්තොති අට්ඨකථාචරියෙනාති පකාසෙත්වා, එතෙන ඉට්ඨකාමයසෙතුපි සඞ්ගහිතො උදකසොතාවරණස්ස සාමඤ්ඤලක්ඛණත්තාති අධිප්පායත්ථඤ්ච වණ්ණෙත්වා, යථාවුත්තකට්ඨමයසෙතුනො නදීලක්ඛණවිනාසාභාවතො ගාමභාවාභාවතො පසිද්ධතරාති වදන්ති. ඉදම්පි තෙසං නිදස්සනං නෙවෙත්ථ යුජ්ජති, සො පන සෙතුගාමසඞ්ඛමෙව ගච්ඡති, කස්මා?

---

(සීමාභ්‍යන්තරයෙහි උපන්නා වූ යම් කිසිවෘක්‍ෂලතාදියක් ඇද්ද? ඔහු සීමාවෙහි උපන් බැවින් තෙමේ සීමා වෙයි. ඒ සීමාවෙහි හට ගත් රුක්ලියආදිය අමුතුසීමාවක් ඇතුළට ගියකල සඞ්කරය වෙයි සේයි.)

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; දසමො දුබ්බිතක්කො, දශමදුර්විතර්කය යි.

පුන, නැවතද; ආවරණෙනාති, "ආවරණෙන, යනු; දාරුආදීනි" දැවආදිය,. නිඛණිත්වා, සිටුවා; උදකනීවරණෙන, ජලආවරණය කරණ කොට ගෙණද; කොට්ඨකබන්ධෙනාති, "කොට්ඨකබන්ධෙන" යනු, මත්තිකාදීහි, මැටිආදියෙන්; පූරෙත්වා, පුරවා; කතසෙතුබන්ධෙනාති, කරණ ලද සෙතුබන්ධනයෙන් දැයි යන; එතම්පි ටීකාපාඨං, මේ ටීකාපාඨය ද; ආහරිත්වා, ගෙණ හැර දක්වා; එත්ථ ච, මෙහි ද; මත්තිකාමය සෙතුනො, මැටිමුවා හෙය තමා; උදකසොතාවරණත්තා, ජලප්‍රවාහය ආවරණය කරණ බැවින්; නදීලක්ඛණවිනාසභාවො, නදීලක්‍ෂණය බිඳෙනබව; අට්ඨකථාචරියෙන, අටුවාචාර්‍ය්‍යයන් විසින්; වුත්තොති, කියන ලදැ යි; පකාසෙත්වා, ප්‍රකාශ කොට; එතෙන, මෙයින්; උදකසොතාවරණස්ස, ජලප්‍රවාහයාගේ ආවරණය තමා; සාමඤ්ඤලක්ඛණත්තා, සාමාන්‍යලක්‍ෂණය හෙයින්; ඉට්ඨකාමයසෙතුපි, ගඩොලින් කරණ ලද හෙය ද; සඞ්ගහිතො ති, ඇතුළත් කරණ ලදැයි යන; අධිප්පායත්ථඤ්ච, අභිප්‍රායාර්ථයක් ද; වණ්ණෙත්වා, වර්‍ණනා කොට; යථාවුත්තකට්ඨමයසෙතුනො, යථොක්තකාෂ්ඨමයහෙයගේ; නදීලක්ඛණවිනාසාභාවතො, නදීලක්‍ෂණයාගේ බිඳීම නො වන හෙයින්; ගාමභාවාභාවතො, ග්‍රාමක්‍ෂෙත්‍රභාවය නො වනබව; පසිද්ධතරාති අතිප්‍රසිද්ධය යි; වදන්ති, කියත්.

තෙසං, ඔවුන්ගේ; ඉදම්පි නිදස්සනං, මේ නිදර්‍ශනය ද; එත්ථ, මෙහි; නෙව යුජ්ජති, නො ම යෙදෙයි. සො පන සෙතු, ඒ හෙය වනාහි; ගාමසඞ්ඛමෙව, ගාමසඞ්ඛ්‍යාවට ම; ගච්ඡති, යෙයි. කස්මා,

තස්ස සෙතුනො අට්ටකං අනාහච්ච ගාමසම්බන්ධෙන ඨිතත්තානි, තෙන වුත්තං අට්ඨකථායං, සචෙ පන සෙතු වා සෙතුපාද වා බහි තීරෙ පතිට්ඨිතා කම්මංකාතුං න වට්ටති කරොන්තෙහි සීමං සොධෙත්වා කාතබ්බන්ති, අනෙන සට්ඨමයසෙතුනො ගාමභාවො එව පසිද්ධතරො, අපි චෙසො ගාමො න භවෙය්‍ය කම්මකරණම්පි තත්ථ න පටික්ඛිපෙය්‍යාති.

අයං තෙසං එකාදසමො දුබ්බිතක්කො.

පුන, අනොතානදිං පවිට්ඨසාඛායාති නදියා පඨවිතලං ආහච්ච ඨිතාය සාඛාය පගෙව අනාහච්ච ඨිතාය පාරොහෙපි එසෙව නයො එතෙන සභාගනදී සීමං දූසිත්වා ඨිතෙන විසභාග සීමා සම්බන්ධසාඛාදිනා උදකුක්ඛෙපසීමාසම්බන්ධො න වට්ටතීති ඤාපිතොති දට්ඨබ්බොති එතං විමතිවිනොදනීපාඨස්සෙව, සීමං වා

---

කුමක්හෙයින්ද? යත්. තස්ස සෙතුනො, ඒ හෙයනමං; අට්ටකං, අටල්ලට; අනාහච්ච, නො හැණී; ගාමසම්බන්ධෙන, ගම හා සම්බන්ධයෙන්; ඨිතත්තානි, සිටිය හෙයි නැයි; අට්ඨකථායං, අටුවායෙහි; තෙන, එහෙයින්; වුත්තං, කියන ලදී. සචෙ පන, ඉදින් වනාහි; සෙතු වා, හෙය හෝ; සෙතුපාද වා, හේදඬුකණු හෝ; බහිතීරෙ, පිටඉවුරෙහි; පතිට්ඨිතා, පිහිටියාහු ද; කම්මං කාතුං, (ඒ හෙයෙහි) කම්ම කරන්ට; න වට්ටති, නො වටියි. කරොන්තෙහි, කරන්නන් විසින්; සීමං සොධෙත්වා, සීමාව ශුද්ධ කොට; කාතබ්බන්ති, කට යුතුය කියායි; අනෙන, මේ කියමනෙන්; සට්ඨමයසෙතුනො, දඬුමුවාහෙයගේ; ගාමභාවො එව, ග්‍රාමක්ෂෙත්‍රභාව යම; පසිද්ධතරො, ඉතා ප්‍රකට යි. අපි ච, වැලි දු; එසො, මෙතෙම, ගාමො න භවෙය්‍ය, ගම නු වූයේ නම්; තත්ථ, එහි, කම්මකරණම්පි, කම්ම කිරීම ද; න පටික්ඛිපෙය්‍යාති, ප්‍රතික්ෂෙප නො කරන්නේය යනුයි.

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; එකාදසමො දුබ්බිතක්කො, එකාදශමදුර්විතර්කායයි.

පුන, නැවතද; අනොතා නදිං පවිට්ඨසාඛායාති "අනොතා නදිං පවිට්ඨසාඛාය" යනු; නදියා, නදියෙහි; පඨවිතලං, පෘථිවිතලයට; ආහච්ච, හැණී; ඨිතාය, සිටියා වූ; සාඛාය, ශාඛායෙහි ද; පගෙව, එසේ ම, අනාහච්ච, නො හැණී; ඨිතාය, සිටියා වූ; පාරොහෙපි, අරළුවෙහි ද; එසෙව නයො, මේ ක්‍රමය මැ යි; සභාගනදීසීමං දූසිත්වා, සභාගනදීසීමාව ස්පර්ශ කොට; ඨිතෙන, සිටියා වූ; එතෙන විසභාගසීමාසම්බන්ධසාඛාදිනා, මේ විසභාගසීමාසම්බන්ධශාඛාදියෙන්; උදකුක්ඛෙපසීමාසම්බන්ධො, උදකුක්ඛෙපසීමාසම්බන්ධය තෙම; න වට්ටතීති, නො වටීය යි; ඤාපිතොති, අඟවනලදූයි; දට්ඨබ්බොති, දතයුතුය යන; එතං විමතිවිනොදනීපාඨස්සෙව, මේ

සොධෙත්වා කම්මං කාතබ්බන්ති මහාසීමතො හත්ථපාසං වා ආනෙතබ්බො සීමතො වා බහි කාතබ්බොති අධිප්පායො, ගණ්ඨිපදෙසු පන මහාසීමාගතෙහි භික්ඛූහි තං සාඛං වා පාරොහං වා අනාමසිත්වා ඨාතබ්බන්ති අධිප්පායොති වුත්තං තං න ගහෙතබ්බන්ති එතං සාරත්ථදීපනීපාඨඤ්ච දසෙසන්තා, ඉදං හි කිඤ්චාපි ද්වින්නං බද්ධසීමානං සඞ්කරට්ඨානෙ යෙව ආගතං, තථාපි විසභාගසීමාවසෙන එකලක්ඛණත්තා ද්වින්නං උදකුක්ඛෙපසීමානඤ්ච උදකුක්ඛෙපගාමසීමාදීනඤ්ච සඞ්කරභාවෙපි නයො නෙතබ්බො, තස්මා ඉමිනාපි අන්තොනදියං යථාවුත්තමාළකෙ කම්මං කරොන්තෙහි යථාවුත්තසෙතුසම්බන්ධගාමට්ඨභික්ඛූ මාළකං ආනෙත්වා වා ගාමතො බහි කත්වා වා කම්මං කාතබ්බන්ති අත්ථො සිජ්ඣතෙ

---

විමතිවිනොදනීපාඨය ද, සීමං වා සොධෙත්වා කම්මං කාතබ්බන්ති, සීමං වා සොධෙත්වා කම්මං "කාතබ්බං" යනු, මහාසීමතො, මහාසීමාවෙන්; (ඒ මහණ තෙම) හත්ථපාසං වා, අත්පසට හෝ; ආනෙතබ්බො, ගතයුතුය; සීමතො වා, සිමින් හෝ; බහි කාතබ්බොති, බැහැර කටයුතුය යන; අධිප්පායො, අභිප්‍රාය යි; ගණ්ඨිපදෙසු පන, ගණ්ඨිපදයන්හි වනාහි; මහාසීමාගතෙහි, මහාසීමාවට පැමිණියා වූ; භික්ඛූහි, භික්ෂූන් විසින්; තං සාඛං වා, ඒ අත්ත හෝ; පාරොහං වා, අරළුව හෝ; අනාමසිත්වා, නො අල්වා; ඨාතබ්බන්ති, සිටියයුතුය යන; අධිප්පායො ති, අභිප්‍රාය යි; වුත්තං, කියන ලදී. තං, ඒ කීම, න ගහෙතබ්බන්ති, නො ගතයුතුය යන; එතං සාරත්ථදීපනීපාඨඤ්ච, මේ සාරාර්ථදීපනීපාඨය ද; දසෙසන්තා, දක්වන්නාහු.

ඉදං හි, මේ වනාහි; කිඤ්චාපි, කිසි විධියකින්; ද්වින්නං බද්ධසීමානං හි, බද්ධසීමාදෙදෙනාගේ ම; සඞ්කරට්ඨානෙ යෙව, සඞ්කරස්ථානයෙහි ම; ආගතං, ආයේයි, තථා පි, එසේ ම; විසභාගසීමාවසෙන, විසභාගසීමාවශයෙන්; එකලක්ඛණත්තා, අසහාය ලක්ෂණ බැවින්; ද්වින්නං උදකුක්ඛෙපසීමානඤ්ච, උදකුක්ඛෙපසීමාදෙදෙනාගේ ම ද; උදකුක්ඛෙපගාමසීමාදීනඤ්ච, උදකුක්ඛෙපගාමසීමාදීන්ගේ ද; සඞ්කරභාවෙපි, සඞ්කරවීමෙහි ද, නයො, ක්‍රමයතෙම; නෙතබ්බො, දතයුතුයි ("අනෙකත්ථා හි ධාතවො" යි විශ්‍රුබැවින් මෙහි නී, ධාතු බොධනාර්ථයෙහි වැටේ.) තස්මා, එහෙයින්; ඉමිනාපි, මෙයින් ද; අන්තොනදියං, නදිය තුළ; යථාවුත්තමාළකෙ, යථොක්තමාළකයෙහි; කම්මං කරොන්තෙහි, කර්ම කරන්නන් විසින්; යථාවුත්ත, යථොක්ත වූ; සෙතුසම්බන්ධ, හෙය සම්බන්ධි වූ; ගාමට්ඨභික්ඛූ, ගමෙහි සිටි භික්ෂූන්; මාළකං, සීමාමාළකයට; ආනෙත්වා වා, පමුණුවා හෝ; ගාමතො, ගමින්; බහි කත්වා වා, බැහැර කොට හෝ; කම්මං කාතබ්බන්ති, කර්ම කට යුතුය යන; අත්ථො, අදහස; සිජ්ඣතෙවාති, සිද්ධවේ මැ යි;

වාති වදන්ති, ඉදම්පි නිදස්සනං විසභාගසීමාදීනං සම්බන්ධෙ සති යුජ්ජති නාසති, එත්ථ පන ගාමසීමා ච උදකුක්ඛෙපසීමා ච යෙන කෙනචි අසඞ්කරාව හුත්වා සකෙ සකෙ ඛෙත්තෙ පතිට්ඨිතා හොන්ති, කාරණං චෙත්ථ පුබ්බෙ වුත්තනයෙන දට්ඨබ්බං.

අයං තෙසං වාදසමො දුබ්බිතක්කො.

පුන, ගණ්ඨිපදෙ නිස්සාය නිරත්ථකං අභියුඤ්ජන්තා පපඤ්චෙත්වා, උභතොභාගෙන ගාමසීමං ඵුසිත්වා ඨිතසෙතු ඛණ්ඩසීමා මහාසීමායො ඵුසිත්වා ඨිතරුක්ඛෙන උපමෙතබ්බාති ච ලිඛිතන්ති ඉමං වජිරබුද්ධිටීකාපාඨං නිදස්සෙන්තා, එත්ථ හි අන්තොනදියං නදිං විනිවිජ්ඣිත්වා උභතොභාගෙන උභොසු තීරෙසු ගාමසීමං ඵුසිත්වා ඨිතසෙතු ඛණ්ඩසීමාමහාසීමායො ඵුසිත්වා ඨිත

---

වදන්ති, කියත්; ඉදම්පි නිදස්සනං, මේ නිදර්ශනය ද; විසභාගසීමාදීනං, විසභාගසීමාදීන්ගේ; සම්බන්ධෙ සති, සම්බන්ධය ඇති කල්හි; යුජ්ජති, යෙදෙයි. නාසති, නැති කල්හි නො යෙදෙයි; එත්ථ පන, මෙහි වනාහි; ගාමසීමා ච, ගාමසීමාතොමෝ ද; උදකුක්ඛෙපසීමා ච, උදකුක්ඛෙපසීමාතොමෝ ද; යෙන කෙනචි, යම් කිසිවක් හා; අසඞ්කරාව හුත්වා, මිශ්‍ර නු වූවාහු ම; සකෙ සකෙ ඛෙත්තෙ, තම තමන්ගේ ක්ෂෙත්‍රයෙහි; පතිට්ඨිතා හොන්ති, පිහිටියාහු වෙත්; එත්ථ, මෙහි; කාරණඤ්ච, කාරණය ද; පුබ්බෙ, පෙර; වුත්තනයෙන, කියන ලද ක්‍රමයෙන්; දට්ඨබ්බං, දතයුතුයි.

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; වාදසමො දුබ්බිතක්කො, වාදසමදුර්විතර්කයයි.

පුන, යලි ද; ගණ්ඨිපදෙ නිස්සාය, ගණ්ඨිපදයන් ඇසුරු කොට; නිරත්ථකං, නිරර්ථක වූ වාදයක්; පපඤ්චෙත්වා, දීර්ඝ කොට; අභියුඤ්ජන්තා, විවාදකරන්නාහු; උභතොභාගෙන, විපාර්ශ්වයෙන්; ගාමසීමං ඵුසිත්වා, ගාමසීමාව ස්පර්ශ කොට; ඨිතසෙතු, සිටි හෙය; ඛණ්ඩසීමාමහාසීමායො ඵුසිත්වා, ඛණ්ඩසීමාමහාසීමාවන් ස්පර්ශ කොට; ඨිතරුක්ඛෙන, සිටිරුක හා; උපමෙතබ්බාතිච, උපමා කටයුතුය යි ද; ලිඛිතන්ති, ලියන ලදැ යි යන; ඉමං වජිරබුද්ධිටීකාපාඨං, මේ වජිරබුද්ධිටීකාපාඨය; නිදස්සෙන්තා, නිදසුන් කරන්නාහු; එත්ථ හි, මෙහි වනාහි; අන්තොනදියං නදියතුළ, උභතොභාගෙන, දෙපාර්ශ්වයෙන්; නදිං විනිවිජ්ඣිත්වා, නදිය විනිවිද ගොස්; උභොසු තීරෙසු, දෙතීරයන්හි; ගාමසීමං ඵුසිත්වා, ගාමසීමාව ස්පර්ශ කොට; ඨිතසෙතු, සිටිහෙය, ඛණ්ඩසීමාමහාසීමායො, ඛණ්ඩසීමාමහාසීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට; ඨිත

රුක්ඛෙන උපමෙතබ්බොති අත්ථොති වත්වා අනභිමතම්පි අත්ථං පපඤ්චෙන්ති — එත්ථ පන සෙතුනො උභතොභාගෙන ගාමසීමං ඵුසිත්වා ඨානාභාවතො නිදස්සනං පනෙතං සාධකත්තං නො පෙති, අපි ච උභතොභාගෙන ගාමසීමං ඵුසිත්වා ඨිතසෙතු ඛණ්ඩසීමා මහාසීමායො ඵුසිත්වා ඨිතරුක්ඛෙන කථං උපමෙතබ්බා ඛණ්ඩසීමාමහාසීමානං විසභාගත්තා ති, වීමංසිතබ්බං — ගාමගාමන්තරසම්බන්ධෙ ච ගාමනදීසම්බන්ධෙ ච සඞ්කරාභාවො හෙට්ඨා වුත්තනයෙන ගහෙතබ්බො ලොකවොහාරසිද්ධානං ගාමනදීආදීනං ලොකවොහාරතො සම්බන්ධාසම්බන්ධස්ස ගහෙතබ්බත්තා, යදෙත්ථ උදකු

---

රුක්ඛෙන, සිටිරුක හා; උපමෙතබ්බොති, උපමාකටයුතුය යන; අත්ථොති, අදහසක් යයි; වත්වා; කියා; අනභිමතම්පි, අනිෂ්ටවූ ද; අත්ථං, අදහසක්; පපඤ්චෙන්ති, විස්තර කරත් — එත්ථ පන, මෙහි වනාහි; සෙතුනො, හෙයගේ; උභතොභාගෙන, දෙපාර්ශ්වයෙන්; ගාමසීමං ඵුසිත්වා, ගාමසීමාව ස්පර්ශ කොට; ඨානාභාවතො, සිටීමක් නො වන හෙයින්; එතං නිදස්සනං පන, මේ නිදර්ශනය වනාහි; සාධකත්තං, සාධක බවට; නොපෙති, නො පැමිණෙයි; අපි ච, වැලි දු; උභතොභාගෙන, දෙපාර්ශ්වයෙන්; ගාමසීමං ඵුසිත්වා, ගාම සීමාව ස්පර්ශකොට; ඨිතසෙතු, සිටි හෙය; ඛණ්ඩසීමා මහාසීමායො, ඛණ්ඩසිමා මහාසීමාවන්; ඵුසිත්වා, ස්පර්ශ කොට; ඨිතරුක්ඛෙන, සිටි රුක හා; කථං, කෙසේ; උපමෙතබ්බා, උපමා කටහැකිද?; ඛණ්ඩ සීමා මහාසීමානං, ඛණ්ඩසීමා–මහා සීමාවන්; විසභාගත්තාති, විස භාග බැවින් (උපමා කට හැක්කේය යි කියා යි;) වීමංසිතබ්බං, මෙය විමසිය යුතුයි — ගාමගාමන්තර සම්බන්ධෙ ච, ගාමගාමාන්තරයන් හා සම්බන්ධයෙහි ද; ගාමනදී සම්බන්ධෙ ච, ගාමනදී සම්බන්ධයෙහි ද; සඞ්කරාභාවො, සඞ්කර නො වී ම; (සඞ්කරණං=සඞ්කරො, භවනං භාවො, න භාවො අභාවො, සඞ්කරස්ස සඞ්කරෙ වා අභාවො= සඞ්කරාභාවො, සඞ්කරෙ අභාවො යන දෙතන්හි "අ" ප්‍රත්‍යයෙන් හා "ණ" ප්‍රත්‍යයෙන් ද භාවය සිද්ධයි.) හෙට්ඨා වුත්තනයෙන, යට කියනලද ක්‍රමයෙන්; ගහෙතබ්බො, ගතයුතුයි; (ගාම සීමාවක් අමුතු ගමක් හා සම්බන්ධවීමෙන් ද ගාම සීමාවක් නදී සීමාව හා සම්බන්ධ වීමෙන් ද සඞ්කර නො වේ යනු මෙහි අභිප්‍රාය යි) ලොක වොහාර සිද්ධානං, ලොක ව්‍යවහාර සිද්ධ වූ; ගාමනදී ආදීනං, ගාමනදී ආදි සීමාවන්ගේ; ලොක වොහාරතො, ලෝවහරින්; සම්බන්ධා සම්බන්ධස්ස, සම්බන්ධා සම්බන්ධය නමා; ගහෙතබ්බත්තා, ගතයුතු හෙයින් (සඞ්කරය නො වේ යන අදහස යි.) එත්ථ, මෙහි; යං, යම්බඳු වූ; උද කුක්ඛෙප සීමම්පි, උදකුක්ඛෙපසීමාවක්; සඞ්ඛාය, සඳහා; ලිඛිතං, ලියන ලද්දේ නම්; ගාමසම්බන්ධෙ සති, ගම හා සම්බන්ධයක් ඇති

කෙඛපසීමමපි සඞ්ඛාය ලිඛිතං, ගාමසම්බන්ධෙ සති උදකුක්ඛෙප සීමාය අසම්භවතො නිරත්ථකං හොති.

අයං තෙසං තෙරසමො දුබ්බිතකෙකා.

පුන, තත්‍ථ පුරිමනයෙ තාව ඉදං විචාරෙතබ්බං, තාදිසෙ ඨානෙ කතං කම්මං කතරාය කතකම්මසඞ්ඛ්‍යං ගච්ඡති, කිං නදියං කතං උදාහු ගාමසීමායං අථ උභයත්‍ථා ති, කිඤ්චෙත්‍ථ තඤ්චෙ නදියං කතසඞ්ඛ්‍යං ගච්ඡති උදකුක්ඛෙපසීමා ච සොධෙතබ්බා න ඉතරා, අථ ගාමසීමායං කතසඞ්ඛ්‍යං ගච්ඡති උදකුක්ඛෙප සීමා න සොධෙතබ්බා, යදි උභයත්‍ථ කතසඞ්ඛ්‍යං ගච්ඡති විසු සීමාසු එකකම්මං කාතුං වට්ටතී ති අනිට්ඨප්පසඞ්ගං ආපජ්ජති තතො අඤ්ඤිස්සා

---

කාල්හි; උදකුක්ඛෙපසීමාය, උදකුක්ඛෙපසීමාවගේ; අසම්භවතො, හට නො ගැන්ම වන හෙයින්; නිරත්ථකං හොති, ඒ ලිපිය නිරර්ථක වෙයි.

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; තෙරසමො දුබ්බිත කෙකා, තෙරසමදූෂිතකාකීය යි.

පුන, යලිත්; තත්‍ථ, එහි; පුරිමනයෙ, මුල්ක්‍රමයෙහි; තාව, පළමු කොට; ඉදං, මෙය; විචාරෙතබ්බං, විචාරණය කටයුතුයි; තාදිසෙ ඨානෙ, එබඳු ස්ථානයෙහි; කතං කම්මං, කරණ ලද කර්මය; කතරාය, කවරසීමාවෙක්හි; කතකම්මසඞ්ඛ්‍යං, කරණ ලද කර්මසඞ්ඛ්‍යාවට; ගච්ඡති, පැමිණේ ද?; කිං, කිමෙක් ද?; නදියං, නදීසීමාවෙහි; කතං, කරණලද කර්ම සඞ්ඛ්‍යාවට යේද?; උදාහු, නැත හොත්; ගාම සීමායං, ගාම සීමාවෙහි කරණලද කර්ම සඞ්ඛ්‍යාවට යේ ද?; අථ, එසේ නැත්නම්; උභයත්‍ථා ති, ගාමසීමා නදීසීමා යන දෙසීමා වන්හි කරණලද කර්ම සඞ්ඛ්‍යාවට යේ ද?; එත්‍ථ, මෙහි ලා; කිඤ්ච, කිනම් සීමාවෙක්හි කරණ ලද කර්මසඞ්ඛ්‍යාවට යේද; චෙ, ඉදින්; තං, ඒ කර්මය; නදියං, නදී සීමාවෙහි; කතසඞ්ඛ්‍යං, කරණ ලද සඞ්ඛ්‍යාවට; ගච්ඡති, යේ නම්; උදකුක්ඛෙපසීමා, උදකුක්ඛෙප සීමාව; සොධෙතබ්බා එව, ශුද්ධ කටයුත්තී ම ය; ඉතරා න, අනික් ගාමසීමාව ශුද්ධ නො කට යුත්තීය; අථ, එසේ නැතු ව; ගාමසීමායං, ගාමසීමායෙහි; කතසඞ්ඛ්‍යං, කරණ ලද කර්මසඞ්ඛ්‍යාවට; ගච්ඡති, යේ නම්; උදකුක්ඛෙපසීමා, උදකුක්ඛෙපසීමාතොමෝ; න සොධෙ තබ්බා, ශුද්ධ නො කට යුත්තීය; යදි, ඉදින්; උභයත්‍ථ, ගාමසීමා උදකුක්ඛෙපසීමා යන දෙසීමාවන්හි; කතසඞ්ඛ්‍යං, කරණ ලද කර්ම සඞ්ඛ්‍යාවට; ගච්ඡති, යේ නම්; විසු සීමාසු, දෙසීමාවන්හි; එක කම්මං, එක ම කර්මය; කාතුං, කරන්ට; වට්ටති, වටනේ ද?; ඉති, මෙසේ කිරීමෙන්; අනිට්ඨප්පසඞ්ගං, අනිෂ්ට වූ අයතන ක්‍රියාවට; ආපජ්ජතී, පැමිණේ ද?; තතො, එහෙයින්; අඤ්ඤිස්සා සීමාය,

සීමාය ඤත්ති අඤ්ඤිස්සා අනුසාවණා හොතීති ඛණ්ඩසීමාමහාසීමට්ඨානං කායසාමග්ගියා කම්මං කාතුං වට්ටතීති ඉදං වා අනිට්ඨං ආපජ්ජතීති, එත්ථ වුච්චතෙ, යථාවුත්තං කම්මං උභයත්ථ කතසඞ්ඛ්‍යං ගච්ඡතීති න ච යථාවුත්ත අනිට්ඨං ආපජ්ජති, කස්මා, ඤත්ති අනුසාවණානං එකෙකසීමාය පවත්තත්තා කාරකභික්ඛූනං වා එකෙක සීමාය ඨිතත්තා, උභයත්ථාපි ඨාතුං සක්කුණෙය්‍යතාය, පන තං අකාරණං, එකීභාවං උපගතසීමට්ඨානෙ කතත්තාති ඉදං අචලකාරණන්ති ඉමඤ්ච වජිරබුද්ධිටීකාපාඨං නිස්සාය, එත්ථ හි ගාමසම්බන්ධසෙතු න ගාමට්ඨභාවෙනෙව වුත්තො අථ ඛො උභයට්ඨභාවෙන, තස්මා යථාවුත්තගාමසම්බන්ධසෙතුනො ගාමභාවං

---

අන්සීමාවෙක්හි; ඤත්ති, ඤත්තියද; අඤ්ඤිස්සා සීමාය, අන් සීමාවෙක්හි; අනුසාවණා හොතී ති, අනුසාවණාව ද වේ යයි කියායි; ඛණ්ඩසීමා මහා සීමට්ඨානං, ඛණ්ඩසීමාමහාසීමස්ථයන්ගේ; කායසාමග්ගියා, කාය සාමග්‍රියෙන්; කම්මං කාතුං, කර්‍ම කරන්ට; වට්ටතීති, වටිය යන; ඉදං වා, මේ කාරණය හෝ; අනිට්ඨං ආපජ්ජතීති, අනිෂ්ට ක්‍රියාවට පැමිණේද යනු; එත්ථ, මෙහි; වුච්චතෙ, කියනු ලැබේ; යථාවුත්තං, යථොක්ත වූ; කම්මං, කර්‍මය; උභයත්ථ, දෙසීමාවන්හි; කතසඞ්ඛ්‍යං, කරණ ලද කර්‍මසඞ්ඛ්‍යාවට; ගච්ඡතීති, යේ නු යි? යථාවුත්ත, යථොක්ත වූ; අනිට්ඨං, අනිෂ්ටක්‍රියාවට; න ච ආපජ්ජති, නො ම පැමිණෙයි; කස්මා, කුමක් හෙයින්ද? යත්; ඤත්ති අනුසාවණානං, ඤත්ති අනුසාවණාවන්; එකෙක සීමාය, එක එක සීමාවෙහි; පවත්තත්තා, පවත්නා හෙයින් ද; කාරක භික්ඛූනං වා, කාරක භික්ෂූන් ද; එකෙක සීමාය, එක එක සීමාවෙහි; ඨිතත්තා, සිටි බැවින් ද; උභයත්ථාපි, දෙසීමාවෙහි ම; ඨාතුං, සිටින්ට; සක්කුණෙය්‍යතාය පන, හැකිවන බැවින් ද; තං, ඒ කර්‍මය; අකාරණං, කාරණයක් නො වන්නේද? (වරදක් නොවන්නේද) (එහෙයිනි), එකීභාවං, සම බවට; උපගත සීමට්ඨානෙ, පැමිණියාවූ සීමස්ථානයෙහි; කතත්තා ති, කරණ ලද හෙයින්ය කියා; ඉදං අචලකාරණන්ති, මේ වෙනස්කිරීමට නොහැකි කාරණයකැයි යන; ඉමඤ්ච වජිරබුද්ධිටීකාපාඨං, මේ වජිරබුද්ධිටීකාපාඨය ද; නිස්සාය, ඇසුරු කොට; එත්ථ හි, මෙහි වනාහි; ගාමසම්බන්ධසෙතු, ගමසම්බන්ධ හෙය; ගාමට්ඨභාවෙනෙව, ගමෙහි පිහිටි බවකින් ම; න වුත්තො, නො කියන ලද; අථ ඛො, එසේ නැත්නම් කෙබඳු තැනක පිහිටිබවකින් කියන ලද ද? යත්; උභයට්ඨභාවෙන, ග්‍රාමනදී යන උභයතන්හි පිහිටිභාවයෙන් කියන ලදී; තස්මා, එහෙයින්; යථා වුත්තගාමසම්බන්ධසෙතුනො, පෙර කියනලද ගම සම්බන්ධහෙයතමා; ගාමභාවාභාවතා, ග්‍රාමක්ෂෙත්‍රභාවයනො වන

භාවතො පසිද්ධතරාති වදන්ති~~~සචෙ පනිදං ද්වින්නං ගාමනදීනං සඞ්ඛාය වුත්තං තං යුජ්ජති තාසං අඤ්ඤමඤ්ඤසම්බන්ධෙ දෙසාභාවතො, යදි පන ද්වින්නං ගාමොදකුක්ඛෙපානං සඞ්ඛාය වුත්තං තං න යුජ්ජති, තස්මා, ගාමොදකුක්ඛෙපානං අඤ්ඤමඤ්ඤවිසභාගත්තා චෙව විසභාගසීමානඤ්ච එකීභාවතො එකස්මිං යෙව ඨානෙ අනුප්පජ්ජනතොච, තස්මා යථා වුත්තටීකාපාඨෙ නදියං ඤාතං උදාහු ගාමසීමායන්ති අනුයුඤ්ජිතත්තාච තෙසං පනෙකච්චානං ථෙරානං මතෙන සංසන්දමානෙ පාළියා විරුද්ධත්තාච ගාමොදකුක්ඛෙපානන්ති අයමත්ථො න ගහෙතබ්බො, අපි ච සො සෙතු පන උභයත්ථ ඨිතො ති අධිප්පායත්ථෙන ගාමභාවාභාවතො කථං පසිද්ධතරාති

---

බව; පසිද්ධතරාති, ඉතා ප්‍රසිද්ධය යි; වදන්ති, කියත්~~~ සචෙ පන, ඉදින් වනාහි; ද්වින්නං ගාමනදීනං, ගාමනදී සීමාවන් දෙදෙනා; සඞ්ඛාය, සඳහා; ඉදං, මෙය; වුත්තං, කියන ලද්දේනම්; තං, ඒ කිම; යුජ්ජති, යෙදේ; කුමක්හෙයින්ද? යත් තාසං, ඔවුන් දෙදෙනාගේ; අඤ්ඤමඤ්ඤසම්බන්ධෙ, අන්‍යෝන්‍යසම්බන්ධයෙහි; දෙසාභාවතො, දෝසක් නැතිබැවිනි; යදිපන, ඉදින් වනාහි; ගාමොදකුක්ඛෙපානං ද්වින්නං. ගාමඋදකුක්ඛෙප දෙසීමාවන්; සඞ්ඛාය, සඳහා; වුත්තං, කියනලද්දේනම්; තං, එය; න යුජ්ජති, නො යෙදෙයි. තස්මා, කුමක්හෙයින්ද? යත් ගාමොදකුක්ඛෙපානං, ගාම උදකුක්ඛෙප සීමාවන්; අඤ්ඤමඤ්ඤවිසභාගත්තා චෙව, ඔවුනොවුන් විසභාගබැවින්ද; විසභාගසීමානං, විසභාග සීමාවන්ගේ; එකීභාවතො ච, සමානභාවයෙන්ම; (මෙහි ච, ශබ්ද අවධාරණාර්ථයි); එකස්මිංයෙවඨානෙ, එකමතැනෙක්හි; අනුප්පජ්ජනතො ච, හටනොගැණීමේ හේතුවින්ද; (ගාමොදකුක්ඛෙප සීමාවන්ගේ සම්බන්ධය අනුචිත යි-සේයි;) තස්මා, එහෙයින්; යථා වුත්තටීකාපාඨෙ, යථොක්ත ටීකාපාඨයෙහි; නදියං; නදී සීමාවෙහි, ඤාතං, ඥප්තිය කරණ ලද ද; උදාහු, නැතහොත්; ගාමසීමායන්ති; ගාමසීමායෙහි ඥප්තිය කරණ ලදද කියා; අනුයුඤ්ජිතත්තාච, විචාදකරණ බැවින්ද; තෙසං පන එකච්චානං ථෙරානං, ඒ ඇතම් තෙරවරුන්ගේ වනාහි; මතෙන, මතය හා; සංසන්දමානෙ, සංසන්දනය කරණ කල්හි; පාළියා, පෙළට; විරුද්ධත්තා ච, විරුද්ධ බැවින් ද; ගාමොදකුක්ඛෙපානන්ති, ගාමොදකුක්ඛෙප සීමා දෙදෙනාගේ සම්බන්ධයෙහි ලා කියන ලද්දකැයි යන; අයමත්ථො, මේ අර්ථය තෙම; න ගහෙතබ්බො, නො ගතයුතුයි. අපි ච, වැලි දු; සො සෙතු පන, ඒ හෙය වනාහි; උභයත්ථ, දෙතන්හි; ඨිතොති, පිහිටි යේය යන; අධිප්පායත්ථෙන, අභිප්‍රායාර්ථයෙන්; ගාමභාවාභාවතො, ගමබවක් නො වනබව; කථං, කෙසේ; පසිද්ධතරාති, අතිප්‍රසිද්ධය යි;

වත්තබ්බා සියා, උභයත්ථා ති වත්වා තදන්තොගධගාමතො පුන ව්‍යවච්ඡෙදෙ කථං කාතබ්බො, තෙසං පන ථෙරානං වචනෙන අයං ගාමසම්බන්ධ සෙතු නෙව ගාමො න නදී සෙතු සෙතු එවා ති පකාසනං විය දිස්සති, තං පන සීමාලක්ඛණවණ්ණනං පත්වා න යුජ්ජති, යාය කායචි සීමාය සම්බන්ධං යං කිඤ්චි සවිඤ්ඤාණකාවිඤ්ඤාණකං සබ්බං තදෙව සීමාසඞ්ඛං ගච්ඡතී ති අට්ඨකථාදිසු සුත්තානුලොමනයතො වුත්තත්තා ති ගහෙතබ්බං, තථා ද්වින්නං විසභාගසීමානඤ්ච එකත්ථ අසම්භවො පාළිඅට්ඨකථාදිසු වුත්තොයෙවා ති ගහෙතබ්බො, වුත්තං හි සීමාලඞ්කාරසඞ්ගහෙ පි –

ද්වින්න මෙකත්‍ර සීමාන-මවට්ඨානං න විජ්ජති,
යදි විජ්ජති තත්‍රට්ඨා–නානා සංවාසකා සියුන්ති –

අපි ච පාළිඅට්ඨකථාසු වෙ විසභාගසීමායො එකසම්බන්ධා හුත්වා

---

වත්තබ්බා සියා, කියයුත්තී වේ ද? උභයත්ථා ති, දෙතන්හි යයි; වත්වා, කියා; තං අන්තොගධ, ඊට ඇතුල්වූ; ගාමතො, ගම කෙරෙන්; පුන, නැවත; ව්‍යවච්ඡෙදෙ, වෙන්කිරීම; කථං, කෙසේ; කාතබ්බො, කටයුතුවේද? තෙසං පන ථෙරානං, ඒ තෙරවරුන්ගේ වනාහි; වචනෙන, කීමෙන්; අයං ගාමසම්බන්ධසෙතු, මේ ගම සම්බන්ධ හෙය; නෙවගාමො, ගම නො වේ මැ යි; න නදී, නදි යත් නො වේ මැ යි; සෙතු සෙතුඑවාති, හෙය හෙය මැ යි කියා; පකාසනං විය, ප්‍රකාශකිරීමක් මෙන්; දිස්සති, දක්නා ලැබේ. තං පන, ඒ ප්‍රකාශය වනාහි; සීමාලක්ඛණවණ්ණනං, සීමාලක්‍ෂණ වර්ණනාවට; පත්වා, පැමිණ; න යුජ්ජති, නොයෙදෙයි. යායකායචි සීමාය, යම් කිසි සීමාවක් හා; සම්බන්ධං, බැඳුනාවූ; යං කිඤ්චි, යම් කිසි; සවිඤ්ඤාණකාවිඤ්ඤාණකං, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වතෙක් වේද? තං සබ්බං, ඒ සියල්ල; සීමාසඞ්ඛං එව, සීමාව්‍යවහාරයට ම; ගච්ඡතීති, යේයයි; අට්ඨකථාදිසු, අටුවාකථාදියෙහි; සුත්තානුලොම නයතො, සූත්‍රානුලොමනයින්; වුත්තත්තාති, කියන ලද හෙයිනැයි; ගහෙතබ්බං, ගතයුතුයි. තථා, එසේම; ද්වින්නං විසභාගසීමානඤ්ච, විසභාග ගාම උදකුක්ඛෙප දෙසීමාවන්ගේද; එකත්ථ, එක්තැනෙක්හි; අසම්භවො, හටනොගැන්ම; පාළිඅට්ඨකථාදිසු, පෙළඅටුවාදියෙහි; වුත්තොයෙවාති, කියනලදමැයි කියා; ගහෙතබ්බො, ගතයුතුයි. සීමාලඞ්කාරසඞ්ගහෙපි, සීමාලඞ්කාරසඞ්ග්‍රහයෙහිද – ද්වින්නමෙකත්‍රසීමානමවට්ඨානං නවිජ්ජති, යදිවිජ්ජති තත්‍රට්ඨා නානා සංවාසකා සියුන්ති – ද්වින්නමෙකත්‍රසීමාන–පෙ–සියුං යනු; වුත්තං හි, කියනලද මැයි; අපි ච, වැලි දු; පාළිඅට්ඨකථාසු, පෙළ අටුවා දෙක්හි; වෙ විසභාගසීමායො, විසභාගසීමාදෙදෙනෙක්; එක සම්බන්ධා හුත්වා, එකට සම්බන්ධවූවෝ ව; උප්පජ්ජමානා, උපදින්නාහු;

උපපජ්ජමානා එකීභාව මුපගච්ඡන්ති ති ඉදං කත්ථ චි න දිස්සතෙ තස්මා තං න ගහෙතබ්බං.

අයං තෙසං චුද්දසමො දුබ්බිතක්කො.

පොත්ථකෙසු පන කත්ථ චි කත්ථ චි ඨානෙසු අනෙකවිධානි පටිවිරුද්ධානි පි දිස්සන්ති, ඉමිස්සං යෙව සීමාකථායං අට්ඨකථාහි ගණ්ඨිපදානි, තථා ගණ්ඨිපදෙහි අට්ඨකථා, ගණ්ඨිපදානි ටීකාහි, ටීකායො පි අපරාපරා, ටීකාහි පි අපරානි පකරණානි තානි පි අඤ්ඤමඤ්ඤානි, එවං සබ්බානි තානි පච්චෙක විරුද්ධානි ...... අට්ඨකථායම්පන, සීමාමාළකෙ වටරුක්ඛො හොති තස්ස සාඛා වා තතො නිග්ගතපාරොහො වා මහාසීමාය පථවිතලං වා තත්ථ ජාතරුක්ඛාදීනි වා ආහච්ච තිට්ඨති මහාසීමං සොධෙත්වා වා කම්මං කාතබ්බං,

---

එකීභාවං, සමානබවට; උපගච්ඡන්තීති, පැමිණෙත්ය යන; ඉදං, මේ කාරණය; කත්ථචි, කිසිතැනෙක්හි; න දිස්සතෙ, නො දක්නා ලැබේ. තස්මා, එහෙයින්; තං, එය; න ගහෙතබ්බං, නො ගතයුතුයි.

තෙසං, ඒ පොරවරුන්ගේ; අයං චුද්දසමො දුබ්බිතක්කො, මේ චුද්දසමදුර්විතර්කයයි.

පොත්ථකෙසු පන, පොත්වල වනාහි; කත්ථචි කත්ථචි ඨානෙසු, කිසිත් කිසිත් තන්හි; අනෙකවිධානි, නන්වැදෑරුම් වූ; පටිවිරුද්ධානි පි, එකිනෙකටවිරුද්ධ වූද අදහස්; දිස්සන්ති, දක්නා ලැබෙත්. ඉමිස්සං යෙව සීමාකථායං, මේ සීමාකථායෙහි ම; අට්ඨකථා හි, අටුවාකථාවන් හා; ගණ්ඨිපදානි, ගැටපද (එකිනෙකටවිරුද්ධ වෙත්) තථා, එසේ ම; ගණ්ඨිපදෙහි, ගැටපදයන් හා; අට්ඨකථා, අටුවාකථා (එකිනෙකට විරුද්ධ වෙති.) ගණ්ඨිපදානි, ගැටපද; ටීකාහි, ටීකාවන් හා; (එකිනෙකට විරුද්ධවෙති.) ටීකායො පි, ටීකාද; අපරාපරා, අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධවෙත්. ටීකාහි; ටීකාවන් හා; අපරානිපි පකරණානි, අනිකුදු ප්‍රකරණ වෙද්ද; තානිපි, ඔව්හුද; අඤ්ඤමඤ්ඤානි, ඔවුනොවුන්; (පටිවිරුද්ධානි දිස්සන්ති, ප්‍රතිවිරුද්ධවූවාහු දක්නා ලැබෙත්.) එවං, මෙකීසෙයින්; තානිසබ්බානි, ඔහු සියල්ලෝ; පච්චෙකවිරුද්ධානි, අන්‍යොන්‍ය විරුද්ධවූවාහු වෙත්. ...... අට්ඨකථායම්පන, අටුවායෙහි වනාහි; සීමාමාළකෙ, සීමාමාළකයෙහි; හෙවත් මහාසීමාව තුළ පැවති ඛණ්ඩසීමාවෙහි) වටරුක්ඛො හොති, නුගගසක් වේද? තස්ස, ඒ නුගවෘක්ෂයාගේ; සාඛාවා, අත්තක් හෝ; තතො, එයින්; නිග්ගතපාරොහොවා, නික්මගිය අරළුවක් හෝ; මහාසීමාය, මහාසීමාවෙහි; පථවිතලං වා, පෘථිවිතලයෙහි හෝ; තත්ථ, එහි; ජාතරුක්ඛාදීනි වා, හටගත් ගස් ආදීන් හෝ; ආහච්ච, ඇනී; තිට්ඨති, සිටීද; මහාසීමං, මහාසීමාව; සොධෙත්වා වා, ශුද්ධ

තෙ වා සාඛාපාරොහා ඡින්දිත්වා බහිට්ඨකා කාතබ්බා, අනාගච්ච ඕතසාඛාදිසු ආරූළ්හභික්ඛු හත්ථපාසං ආනෙතබ්බො ති, බන්ධනකාලෙ පරික්ඛිත්තස්ස සම්භෙදස්ස අනුලොමත්තා කත්වා වුත්තං.–– ගණ්ඨිපදෙසු පන, මහාසීමගතෙහි භික්ඛූහි තං සාඛං වා පාරොහං වා අනාමසිත්වා ඨාතබ්බන්ති අධිප්පායොති, සුට්ඨුබද්ධානං ද්වින්නං සීමානං රුක්ඛසාඛාදීහි පච්ඡාජාතසම්භෙදෙ, පාළියා අනාගතො ති

---

කොට හෝ; කම්මං කාතබ්බං, කර්මකටයුතුයි. තෙ සාඛාපාරොහා වා, ඒ අතු අරලු හෝ; ඡින්දිත්වා, සිඳ; බහිට්ඨකා කාතබ්බා, බැහැර පිහිටියහු කටයුත්තාහ. (අතු අරලු අහක්කොට හෝ කර්ම කට යුතුය යනු අභිප්‍රායයි.); අනාගච්ච, නොඇවිත්; ඕතසාඛාදිසු, සිටි සාඛාදීන්හි; ආරූළ්හභික්ඛු, නැඟිමහණතෙම; හත්ථපාසං, අත්පසට; ආනෙතබ්බොති, ගතයුතුයයි කියනලදී. "ආරොහතීති ආරූළ්හො, ආරූළ්හො ච සො භික්ඛුචාති, ආරූළ්හභික්ඛු" (ආරූළ්හො යනු. ආපූර්වරුහ ජනනෙ යන්නහු කෙරෙන් කර්ත්‍රර්ථයෙහි අතීතෙතත වනතුතාවී සී, තා වූහැනි) බන්ධනකාලෙ, සීමාබන්ධනකාලයෙහි; පරික්ඛිත්තස්ස, පිළිකෙව් කරණලද; සම්භෙදස්ස, අන්‍යොන්‍ය ස්පර්ශයට; අනුලොමත්තා, අනුලොමයකැයි; කත්වා, ප්‍රකාශකොට; වුත්තං, කියනලදී.––(බද්ධසීමාවන් දෙදෙනාගේ බන්ධනකාලයෙහි ප්‍රතික්ෂිප්ත අන්‍යොන්‍ය ස්පර්ශයට අනුලොම්වන හෙයින් පූර්වයෙහි මනාකොට බඳනා ලද්දාහුද; පසුව යම් කිසි ලතාසාඛාදි ද්‍රව්‍යයක් මත්තෙහි දෘශ්‍යමානව ස්පර්ශකොට සිටියාහුනම් එයින්වූ සීමාසම්බන්ධයද, මේනයින් අබද්ධසීමාවන්ගේ මෙබඳු සම්බන්ධයද, අකප්පියානුලෝමයයි භගවත්හුගේ අභිප්‍රාය දත් අටුවාචාර්‍ය්‍යයන් විසින් දෙෂහෙයින් ප්‍රතික්ෂිප්තය යනුමෙහි භාවයි) ගණ්ඨිපදෙසු පන, ගණ්ඨිපදයන්හි වනාහි; මහාසීමගතෙහි, මහාසීමාවට පැමිණියාවූ; භික්ඛූහි, භික්ෂූන් විසින්; තංසාඛංවා, ඒ ශාඛාව හෝ; පාරොහංවා, අරළුව හෝ; අනාමසිත්වා, නොඅල්වා; ඨාතබ්බන්ති, සිටියයුතුය යන; අධිප්පායොති, අභිප්‍රායයි කියනලදී. (මේ කීම අටුවාවට ඉඳුරාම විරුද්ධයි. මහාසීමාඛණ්ඩසීමාදෙක ගස් අතු ආදියෙන් මිශ්‍රව තිබියදී මහාසීමාවේ මහණුන් ඇතිකල ඒ මහණුන් ඛණ්ඩසීමාවේ අත්පසට ගෙණ හෝ මහාසීමාවෙන් පිටත්කොට හෝ අතුඅරළු අහක්කොට හෝ කර්මකටයුතුය මහාසීමාවට ගොස් එහි නොවැදී සිටිඅතු ආදියෙහි නැඟීඋන් මහණතෙම අත්පසට ගතයුතුය යනු අටුවාවෙහි කීමයි. මේ අටුවාවේ කීම ගැටපදයන්හි කියමනට විරුද්ධබවයි) සුට්ඨුබද්ධානං, මොනවට බඳනාලද ද්වින්නංසීමානං, දෙසීමාවන්ගේ; රුක්ඛසාඛාදීහි, ගස්අතු ආදියෙන්; පච්ඡාජාතසම්භෙදෙ, පසුව හටගත් මිශ්‍රකදෙෂය තෙම; පාළියා, පෙළෙහි;

කත්වා වුත්තං ....සාරත්ථදීපනියම්පි, සීමං වා සොධෙත්වා කම්මං කාතබ්බන්ති මහාසීමතො හත්ථපාසං වා ආනෙතබ්බා සීමතො වා බහිකාතබ්බාති අධිප්පායො, ගණ්ඨිපදෙසු පන මහාසීමාගතෙහි භික්ඛූහි තං සාඛං වා පාරොහං වා අනාමසිත්වා ඨාතබ්බන්ති අධිප්පායොති වුත්තං තං න ගහෙතබ්බන්ති පටික්ඛිත්තං ....තථා සාරත්ථදීපනියමෙව, යම්පන වුත්තං මාතිකාට්ඨකථායං පරිච්ඡෙදබ්භන්තරෙ හත්ථපාසං විජහිත්වා ඨිතොපි පරිච්ඡෙදතො බහි අඤ්ඤං තත්තකං යෙව පරිච්ඡෙදං අනතික්කමිත්වා ඨිතො පි කම්මං කොපෙති ඉදං සබ්බඅට්ඨකථාසු සන්නිට්ඨානන්ති, තත්ථ අඤ්ඤං තත්තකං පරිච්ඡෙදං අනතික්කමිත්වා ඨිතො කම්මං කොපෙතීති ඉදං නෙව පාළියං න අට්ඨකථායං උපලබ්භතීති, සීමං අජ්ඣුසිත්වා බහිට්ඨානමෙව

---

අනාගතොති, නො ආයේය යි; කත්වා, ප්‍රකාශකොට; වුත්තං, කියන ලදී. සාරත්ථදීපනියම්පි, සාරාර්ථදීපනියෙහිද; සීමංවා සොධෙත්වා කම්මං කාතබ්බන්ති, සීමංවා...පෙ...කාතබ්බං" යනුවෙන්; මහාසීමතො, මහාසීමාවෙන්; හත්ථපාසංවා, අත්පසට හෝ; ආනෙතබ්බා, ගතයුතුය. සීමතො වා, සිමින් හෝ; බහි කාතබ්බාති, බැහැර කටයුතුය යන; අධිප්පායො, අභිප්‍රායයි. ගණ්ඨිපදෙසු පන, ගැට පදයන්හි වනාහි; මහාසීමාගතෙහි, මහාසීමාවට පැමිණියාවූ; භික්ඛූහි, භික්ෂූන් විසින්; තං සාඛං වා, ඒ ශාඛාව හෝ; පාරොහං වා, අරළුව හෝ; අනාමසිත්වා, නොඅල්වා; ඨාතබ්බන්ති, සිටියයුතුය යන; අධිප්පායොති, අභිප්‍රායයි; වුත්තං, කියනලදී. තං, එය; න ගහෙතබ්බන්ති, නෝ ගතයුතුයයි පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙපකරණලදී. (මේ කියුම්දෙක එකිනෙකට වෙනස්වූ කියුම් වෙත්) සාරත්ථදීපනියං, සාරාර්ථදීපනියෙහි; තථා එව, එසේම කියනලදී. මාතිකාට්ඨකථායං, මාතෘකා අටුවායෙහි; පරිච්ඡෙදබ්භන්තරෙ, උදකුක්ඛෙපපරිච්ඡෙදය තුළ; හත්ථපාසං, අත්පස; විජහිත්වා, හැර; ඨිතොපි, සිටිමහණද; පරිච්ඡෙදතොබහි, පරිච්ඡෙදයෙන් පිටත්හි; තත්තකං යෙව, එපමණ වූම; අඤ්ඤං පරිච්ඡෙදං, අන් පරිච්ඡෙදයක්; අනතික්කමිත්වා, නො ඉක්මවා; ඨිතොපි, සිටිමහණද; කම්මං කොපෙති, කර්මම කොප්‍ය කෙරෙයි. සබ්බඅට්ඨකථාසු. සියලු අටුවාකථාවන්හි; ඉදං සන්නිට්ඨානන්ති, මේ සනිටුහණියි. (තීන්දු නියමයය) යන. යම්පන, යම් කාරණ යක් වනාහි; වුත්තං, කියනලදද? තත්ථ, එහි; තත්තකං අඤ්ඤං පරිච්ඡෙදං, එපමණ අන් පරිච්ඡෙදයක්; අනතික්කමිත්වා, නො ඉක් මවා; ඨිතො, සිටිමහණ; කම්මංකොපෙතීති; කර්මමකොප්‍යකෙරෙයි. යන; ඉදං, මේ කාරණය; පාළියං එව, පෙළෙහි ද; න, නොලැබෙයි. අට්ඨකථායං, අටුවායෙහිද; න උපලබ්භතීති, නොලැබෙයි යනුයි.

පමාණන්ති කත්වා තත්ථකාරණංදස්සෙත්වා මාතිකාට්ඨකථාවචනං පටික්ඛිත්තං—විමතිවිනොදනියම්පි, යම්පනෙත්ථ සාරත්ථදීපනියං සීමාසඞ්කරං කරොතී ති වඩ්ඪිත්වාසීමාපදෙසං පවිට්ඨෙ ද්වින්නං සීමානං ගතට්ඨානස්ස දුවිඤ්ඤෙය්‍යත්තා වුත්තන්ති තං න යුත්තං ගාමසීමාය සීමාසඞ්කරං කරොතී ති වත්තබ්බතො ති ආදිනා පපඤ්චෙත්වා සාරත්ථදීපනීවචනං පටික්ඛිත්තං—තථා අට්ඨකථායම්පන, එවඤ්ච පන භික්ඛවෙ තිචීවරෙන අවිප්පවාසො සමූහන්තබ්බොති එත්ථ සමූහණන්තෙන භික්ඛුනා වත්තං ජානිතබ්බං — පෙ — න ච සක්කා සීමං අජානන්තෙහි කම්මවාචං කාතුං තස්මා න සමූහණිතබ්බා

---

සීමං අජ්ඣුසිත්වා, සීමාව ස්පර්ශ නොකොට; බහිට්ඨානං එව, බැහැර සිටීම ම; පමාණන්ති, ප්‍රමාණයයි, කත්වා, ප්‍රකාශකොට; තත්ථ, එහි; කාරණං දස්සෙත්වා, කරුණු දක්වා; මාතිකාට්ඨකථාවචනං, මාතෘකා අටුවා කියමන; පටික්ඛිත්තං; ප්‍රතික්ෂෙපකරණලදී.— විමතිවිනොදනියම්පි, විමතිවිනොදනියෙහිද, එත්ථ, මෙහි; සාරත්ථදීපනියං, සාරාර්ථදීපනියෙහි; සීමාසඞ්කරං කරොතීති; සීමා සඞ්කරකෙරෙයි යනු; වඩ්ඪිත්වා, ගස වැඩී; සීමාපදෙසං, සීමා ප්‍රදෙශයට; පවිට්ඨෙ, ඇතුල්වූකල; ද්වින්නං සීමානං, දෙසීමාවන්, ගතට්ඨානස්ස, ගියතැන තමා; දුවිඤ්ඤෙය්‍යත්තා, නොදතහැකි බැවින්; වුත්තන්ති, අටුවායෙහි කියනලද්දේය [illegible]යන; යම්පන, යමක් වනාහි ඇත්තේද? තං, ඒ කීම; ගාමසීමාය, ගාමසීමාව හා; සීමාසඞ්කරං කරොතීති, බද්ධසීමා සඞ්කරය කෙරේයයි; වත්තබ්බතො, කියයුතුහෙයින්; න යුත්තන්ති, යුතුනොවේය යන; ආදිනා, මේ ආදියෙන්; පපඤ්චෙත්වා, විස්තර කොට; සාරත්ථදීපනී වචනං, සාරාර්ථදීපනියෙහි කීම; පටික්ඛිත්තං, පිළිකෙව්කරණලදී.— (මෙහි අභිප්‍රායනම් එකාමගසක් බද්ධසීමාදෙකට නිමිතිකොට ගැණීම අටුවාවෙහි තහනම්කොළේ ඒ ගස වැඩී සීමාවට ඇතුල්වූකල ගාම සීමා බද්ධසීමා දෙදෙනාගේ සඞ්කරය කරණහෙයින් අටුවාවෙහි කිය නලද්දේය යනු සාරාර්ථදීපනියේ කීමයි. මේ කියුම්දෙක එකිනෙකට විරුද්ධවෙති)තථා, එසේම; අට්ඨකථායම්පන, අටුවාවෙහිවනාහි; භික්ඛවෙ, මහණෙනි; එවඤ්ච පන, මෙසේ ද වනාහි; තිචීවරෙන, තුන්සිවුරෙන්; අවිප්පවාසො, වියෝනොවීම තෙම; (වසනංවාසො, විප්පයුත්තොවාසො, විප්පවාසො. න විප්පවාසො අවිප්පවාසො), සමූහන්තබ්බොති, සමූහණනයකටයුත්තේයයනුවෙන්; එත්ථ, මෙහි; සමූහණන්තෙන, සීමාව උදුරන්නාවූ; භික්ඛුනා, මහණහු විසින්; වත්තං ජානිතබ්බං, වත දැනගතයුතුයි—පෙ—සීමං අජානන්තෙහි, සීමාව නොදන්නවුන් විසින්; කම්මවාචං කාතුං, කර්මවාක්‍ය කරන්ට; න ච සක්කා, නො ද හැක්කේය. තස්මා, එහෙයින්; න

සාධුකම්පන ඤත්වා යෙව සමූහණිතබ්බාච බන්ධිතබ්බා චා ති අනෙන සීමාපරිච්ඡෙදං සුට්ඨු ජානිත්වා යෙව සමූහණිතුං වුත්තං තථා පි විමතිවිනොදනියං සීමාපරිච්ඡෙදං අජානිත්වා පි සමූහනනෙ යුත්තිං දස්සෙත්වා න හෙත්ථ සීමාය තප්පරිච්ඡෙදස්ස ජානනං අඞ්ගං සීමාය පන අන්තො ඨානං සමූහණිස්සාමාති කම්මවාචාකරණඤ්ඤෙවෙත්ථ අඞ්ගන්ති වත්වා සමූහනනං වුත්තං ... එවං සීමාලඞ්කාරසඞ්ගහාදිසු පි දිස්සන්ති, තස්මා සුත්තමෙව පමාණං, "තෙනාවොචුම්හ ... **සීමානය පරිදීපා ... පෙ ... තස්මා සුත්තං පමාණමිහ මුනිනො ති** ... ඉදං හි කාරණමාරබ්භ කෙචි පනමෙහ පරිහීළෙතුම්පි මඤ්ඤිස්සන්ති කො පනිමෙ කථං හි නාම පොරාණිකානං කථාසු දොසං වා ආරොපෙස්සන්ති තෙසං වචනානි වා පටි බාහිස්සන්ති පොරාණිකා යෙව ආචරියා

---

සමූහණිතබ්බා, සමූහණනය නොකට යුත්තීය. සාධුකං පන, යහපත්කොට වනාහි; ඤත්වා යෙව, දැනම; සමූහණිතබ්බා ච, සමූහණනය කටයුත්තීද වෙයි. බන්ධිතබ්බාචාති, බැඳිය යුත්තීද වෙයි. යන; අනෙන, මෙයින්; සීමාපරිච්ඡෙදං, සීමාපරිච්ඡෙදය; සුට්ඨු ජානිත්වා යෙව, මොනවට දැන ගෙනම; සමූහණිතුං, සමූහණනය කරන්ට; වුත්තං, කියනලදී. තථා පි, එසේද වුවත්; විමතිවිනොදනියං, විමතිවිනොදනියෙහි; සීමාපරිච්ඡෙදං, සීමාපරිච්ඡෙදය; අජානිත්වා පි, නො[illegible] දැනද; සමූහනනෙ, අවිප්පවාසසීමාව ඉදිරීමෙහි; යුත්තිං, යුක්තිය; දස්සෙත්වා, දක්වා; එත්ථ, මෙහි; සීමාය, සීමාවගේ; තප්පරිච්ඡෙදස්ස, ඒ පරිච්ඡෙදයාගේ; ජානනං, දැනීම; අඞ්ගංනහි, අඞ්ගයක් නොවේමය; සීමාය අන්තො පන, සීමාවතුල, ඨානං, භික්ෂූන් සිටීමද; සමූහණිස්සාමා ති, සමූහණනය කරන්නෙමු යයි; කම්මවාචාකරණඤ්ඤෙව, කර්මවාක්‍ය කිරීමද; එත්ථ, මෙහි; අඞ්ගන්ති, අඞ්ගය යි; වත්වා, කියා; සමූහණනං, සීමාඉදිරීම; වුත්තං, කියනලදී... (අඞ්ගන්තිගමෙති ඤාපෙතීති අඞ්ගං) එවං, මෙසේම; සීමාලඞ්කාර සඞ්ගහාදි සු පි, සීමාලඞ්කාරසඞ්ග්‍රහාදියෙහි ද; දිස්සන්ති, දක්නා ලැබෙත්. තස්මා, එහෙයින්; සුත්තමෙ ව, සූත්‍රය ම; පමාණං, ප්‍රමාණයි; තෙන, එහෙයින්; "සීමානයපරිදීපා ... පෙ ... පමාණමිහ මුණිනොති... සීමානයපරිදීපා ... පෙ ... තස්මා සුත්තං පමාණමිහ මුනිනො" යනු; අවොචුම්හ, කීමු. ඉදං හි කාරණං, මේ කාරණය ම; ආරබ්භ, අරභයා; කෙචි පන, ඇතැම් කෙනෙක් වනාහි; අමෙහ, අපට; පරිහීළෙතුම්පි, නින්දාකරන්ට ද; මඤ්ඤිස්සන්ති, සිතන්නාහ. ඉමෙ පන, මොහු වනාහි; කො, කවරහුද? කථං හි නාම, කෙසේ නම්; පොරාණිකානං, පුරාතන ආචාර්‍ය්‍යවරයන්ගේ; කථාසු, කථාවන්හි; දොසං වා, දොස් හෝ; ආරොපෙස්සන්ති, නගන්නාහුද; තෙසං වචනානි, ඒ පුරාතන ආචාර්‍ය්‍යයන්ගේ වචන හෝ; පටිබාහිස්සන්ති, ප්‍රතිබාහුණය

භගවතො අධිප්පායං සඤ්ජානිස්සන්ති කථං දානි ආධුනිකා තෙ විය ජානිස්සන්තී ති, එවමාදිනා යුත්තිං අසල්ලක්ඛෙත්වා වදන්තානං පරිගිලිත්වා අඤ්ඤථා පසංසා වා නෙවෙත්ථ පමාණං, එතදෙව නිස්සාය "අවොචුම්හ ... **තස්මා හි සාධු චරිතං අනු සික්ඛමානො ...පෙ... කිං තෙහි ආමිසගරූහි අවිද්දසූහි ති** ... න ඛො මයං පොරාණාචරියානං සුත්තානුලොමිකාසු කථාසු දොසං ආරොපෙම න තානි තෙසං වචනානි පටිබාහම කත්ථචි කත්ථචි තෙසං වචනානි අඤ්ඤමඤ්ඤ පටිවිරුද්ධානි විය දිස්සන්තී ති වදාම න සබ්බත්ථ, අයංහි පොරාණිකපණ්ඩිතානම්පි සමානානං පුථුජ්ජනානං පකති, තෙනාහ.

**කස්සච්චයා න විජ්ජන්ති–කස්ස නත්ථි අපාගතං,**
**කො න සම්මොහමාපාදි–කො වා ධීරො සදා සතොති.**

---

කරන්නාහුද; පොරාණිකා යෙව ආචරියා, පුරාතනාචාර්‍ය්‍යයෝ ම; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; අධිප්පායං, අදහස; සඤ්ජානිස්සන්ති, දන්නාහුය. ඉදානි, දැන්; කථං, කෙසේ; ආධුනිකා, ආධුනිකාචාර්‍ය්‍යයෝ; තෙ විය, උන්වහන්සේලා මෙන්; ජානිස්සන්තීති, දන්නාහුදැයි; එවමාදිනා, මේ ආදියෙන්; යුත්තිං, යුක්තිය; අසල්ලක්ඛෙත්වා, නො සලකා; වදන්තානං, කියන්නන්ගේ; පරිගිලිත්වා වා, නිඳුව හෝ; අඤ්ඤථා අන් ප්‍රකාරයකින්; පසංසා වා, ප්‍රශංසාව හෝ; එත්ථ, මෙහි; නෙව පමාණං, නො පමණි; එතං එව නිස්සාය, මේ නිසා ම; "තස්මා හි සාධු චරිතං අනු සික්ඛමානො ...පෙ... කිං තෙහි ආමිසගරූහි අවිද්දසූහි ති ... තස්මා හි සාධු චරිතං අනුසික්ඛමානො ... පෙ ... කිං තෙහි ආමිසගරූහි අවිද්දසූහි" යනු; අවොචුම්හ, කීමු. මයං ඛො, අපි වනාහි; පොරාණාචරියානං, පුරාණාචාර්‍ය්‍යයන්ගේ; සුත්තානුලොමිකාසු, සූත්‍රයට අනුලොම්වූ (අවිරුද්ධවූ) කථාසු, කථාවන්හි; දොසං න ආරොපෙම, දොස් නොනගමු. තෙසං, ඔවුන්ගේ; තානි වචනානි, ඒ කියමන්; න පටිබාහාම, ප්‍රතිබාහණය නොකරමු. කත්ථචි කත්ථචි, කිසිත් කිසිත් තන්හි; තෙසං, ඔවුන්ගේ; වචනානි, කියුම්; අඤ්ඤමඤ්ඤපටිවිරුද්ධානි විය, අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධවූවන් මෙන්; දිස්සන්තී ති, දක්නා ලැබෙත් යයි; වදාම, කියමු. සබ්බත්ථ, හැම තන්හි; න, (ප්‍රතිවිරුද්ධවූවන් මෙනැයි) නො කියමු. අයං හි, මේ වනාහි; පොරාණිකපණ්ඩිතානම්පි, පෞරාණික පණ්ඩිතවූද; පුථුජ්ජනානං සමානානං, පෘථග්ජනයන්ගේ ම; පකති, ස්වභාවයි; (කාරණං කති පධානා කති පකරොතීති වා පකති) "කස්සච්චයා න විජ්ජන්ති කස්ස නත්ථි අපාගතං, කො න සම්මොහමාපාදි කො වා ධීරො සදා සතො" ති ... කස්සච්චයා න විජ්ජන්ති ... පෙ ... කො වා ධීරො සදා සතො යනු; තෙන, එහෙයින්; ආහ, වදාළේය. තථා පි,

තථා පි තෙ පාසංසියා ආචරියට්ඨානෙ ඨපෙත්වා ගරු කාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා, තෙසං පනාචරියානං තෙසු තෙසු ගන්ථෙසු අසන්තෙසු කථං නො භගවතො දෙසනාය අත්ථො ජානිතබ්බො යථාගතං අත්ථං ඤත්වා උග්ගණ්හිත්වා ධාරෙන්තෙහි පටිපජ්ජිතබ්බං, සො ච ඛො ආචරියපවෙණියා අවිජ්ජමානාය අඤ්ඤදත්ථු දුබ්බිජානියො හොති, තස්මා ආචරියපවෙණිං ගරුං කරොන්තෙහි පාළියා අත්ථො සුට්ඨු විඤ්ඤුතබ්බො හොතී ති නො ඛන්ති. පුන, සචෙ සෙතු නදීලක්ඛණට්ඨානං ඵුසිත්වා ඨිතො උදකුක්ඛෙපසීමා පි සොධෙතබ්බාති ඉමස්ස ටීකාපාඨං ආහරිත්වා, එත්ථ හි ගාමතො පට්ඨාය උට්ඨිතො සෙතු අන්තො නදියං නදීලක්ඛණප්පදෙසං ඵුසිත්වා ඨිතො හොති ගාමසීමායං කම්මං කරොන්තෙහි උදකුක්ඛෙපසීමං සොධෙන්තෙහි කාතබ්බන්ති අධිප්පායං දස්සෙත්වා,

---

එසේද වූවත්; තෙ, ඒ පුරාතනයෝ; පාසංසියා, ප්‍රශංසා කටයුත්තෝයි. ආචරියට්ඨානෙ, ගුරුතන්හි; ඨපෙත්වා, තබා; ගරුකාතබ්බා, ගරුකටයුත්තෝයි; මානෙතබ්බා, සිතින් ආදර කටයුත්තෝයි; පූජෙතබ්බා, පිදිය යුත්තෝයි; තෙසං ආචරියානං පන, ඒ ආචාර්‍ය්‍යයන්ගේ වනාහි; තෙසු තෙසු ගන්ථෙසු, ඒ ඒ ග්‍රන්ථයන්; අසන්තෙසු, නැතිකල්හි; නො, අපගේ; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; දෙසනාය, දෙසනාවෙහි; අත්ථො, අර්ථයතෙම; කථං, කෙසේ; ජානිතබ්බො, දැනගතහැක්කේද? යථා ගතං, ආපරිද්දෙන්; අත්ථං, අර්ථය; ඤත්වා, දැන; උග්ගණ්හිත්වා, ඉගෙණ; ධාරෙන්තෙහි, දරන්නවුන්විසින්; පටිපජ්ජිතබ්බං, පිළිපදිනුහැක්කේද? සොචඛො, ඒ අර්ථය තෙමේ ද; ආචරියපවෙණියා, ආචාර්‍ය්‍ය පරම්පරාව; අවිජ්ජමානාය, අවිද්‍යමාන කල්හි; අඤ්ඤදත්ථු, ඒකාන්තයෙන්; දුබ්බිජානියොහොති, නොදතහැක්කේවෙයි. තස්මා, එහෙයින්; ආචරියපවෙණි, ඇදුරු පරපුර; ගරුං කරොන්තෙහි, ගරුකරන්නන්විසින්; පාළියා, දෙශනාවෙහි; අත්ථො, අර්ථයතෙම; සුට්ඨුවිඤ්ඤුතබ්බොහොතීති, මොනවට දැනගතහැකිවේ යයි; නො, අපගේ; ඛන්ති, රුචියයි; පුන, ඉක්බිති; සචෙ, ඉදින්; සෙතු, හෙය; නදීලක්ඛණට්ඨානං, නදීලක්ෂණස්ථානය; ඵුසිත්වා, ස්පර්ශකොට; ඨිතො, සිටියේ වේද; උදකුක්ඛෙපසීමා පි, උදකුක්ඛෙපසීමාතොමෝ ද; සොධෙතබ්බාති, ශුද්ධ කටයුත්තීය යන; ඉමස්ස ටීකාපාඨං, මේ ටීකාපාඨය ද; ආහරිත්වා, ගෙණහැරදක්වා; එත්ථ හි, මෙහි වනාහි; ගාමතො පට්ඨාය, ගම පටන්; උට්ඨිතො, නැංගාවූ; සෙතු, හෙය; අන්තො නදියං, නදිය තුළ; නදීලක්ඛණප්පදෙසං, නදීලක්ෂණප්‍රදෙශය; ඵුසිත්වා, ස්පර්ශකොට; ඨිතො හොති, සිටියේ වේද; ගාමසීමායං, ගාමසීමායෙහි; කම්මං කරොන්තෙහි; කර්මකරන්නන්විසින්; උදකුක්ඛෙපසීමං, උදකුක්ඛෙපසීමාව; සොධෙන්තෙහි, ශුද්ධකරන්නන්විසින්; කාතබ්බ

ඉමිනා පි ච ගාමතො පට්ඨාය උට්ඨිතසෙත්වාදිකො අන්තො නදියං
පතිට්ඨිතො පි නදීලක්ඛණං භින්දිත්වා ගාමභාවං න භජතී ති අත්ථො
පසිද්ධතරො ති වදන්ති ––– සචෙ සෙතු නදීලක්ඛණට්ඨානං ඵුසිත්වා,
ඨිතො උදකුක්ඛෙපසීමා පි සොධෙතබ්බා ති ඉදං වාක්‍යං නිස්සාය
නදීලක්ඛණං ඵුසිත්වා ඨිතසෙතුතො පරතො සඤ්ජාතා උදකු
ක්ඛෙපසීමා පි ගාමසීමායං කම්මං කරොන්තෙහි සොධෙතබ්බා සියා
ති වදන්ති,තං න යුජ්ජති අඤ්ඤමඤ්ඤව්‍යවච්ඡෙදතො ඨිතත්තා, අථ
සෙතුතො පතිට්ඨානට්ඨානෙ නදීලක්ඛණස්ස විජ්ජමානත්තා යදි
උදකුක්ඛෙපසීමා පි උප්පජ්ජෙය්‍යා ති වදන්ති,තම්පි න යුජ්ජති තාසං
ගාමොදකුක්ඛෙපානං විසභාගත්තා,සීමා ච නාමෙසා සම්මන්නිතා
වා සඤ්ජාතා වා ඉතරං විසභාගසීමං ඵුසන්තී කදාචි කත්ථචි න

---

න්ති, කටයුතුය යන; අධිප්පායං, අදහසක්; දස්සෙත්වා, දක්වා; ඉමි
නා පි ච මෙයින් ද; ගාමතො පට්ඨාය, ගම්පටන්; උට්ඨිතසෙතුආ
දිකො, නැංගාවූහේදඬුආදිය තෙම; අන්තො නදියං, ඇතුළ් නදි
යෙහි; පතිට්ඨිතො පි, පිහිටියේ වේද; නදීලක්ඛණං, නදීලක්ෂණය;
භින්දිත්වා, බිඳී; ගාමභාවං, ග්‍රාමක්ෂෙත්‍රභාවය; න භජතී ති, භජනය
නොකෙරේය යන; අත්ථො, අර්ථයතෙම; පසිද්ධතරො ති, ප්‍රසිද්ධතර
යයි; වදන්ති, කියත්; ––– සචෙ, ඉදින්; සෙතු, හෙය; නදීලක්ඛණ
ට්ඨානං, නදීලක්ෂණස්ථානය; ඵුසිත්වා, ස්පර්ශකොට; ඨිතො, සිටියේ
වේද; උදකුක්ඛෙපසීමා පි, උදකුක්ඛෙපසීමාතොමෝ ද; සොධෙ
තබ්බා ති, ශුද්ධකටයුත්තීය යන; ඉදං වාක්‍යං, මේ වාක්‍යය; නිස්සාය,
ඇසුරුකොට; නදීලක්ඛණං, නදීලක්ෂණය; ඵුසිත්වා, ස්පර්ශකොට
ඨිතසෙතුතො, සිටි හෙයගේ; පරතො, ඉදිරියෙන්; සඤ්ජාතා
තෙමේ හටගත්තාවූ; උදකුක්ඛෙපසීමා පි; උදකුක්ඛෙපසීමා
තොමෝ ද; ගාමසීමායං, ගාමසීමායෙහි; කම්මං කරොන්තෙහි, කර්ම
කරන්නන් විසින්; සොධෙතබ්බා සියා ති, ශුද්ධකටයුත්තී වේයයි;
වදන්ති, කියත්ද; තං, ඒ කීම; න යුජ්ජති, නො යෙදෙයි; (කුමක්
හෙයින්ද යත්? අඤ්ඤමඤ්ඤව්‍යවච්ඡෙදතො, ඔවුනොවුන් පිරි
සිඳීම්වශයෙන්; ඨිතත්තා; සිටිහෙයිනි; අථ, වැළිදු; සෙතුතො, හෙ
යගේ; පතිට්ඨානට්ඨානෙ, පිහිටිස්ථානයෙහි; නදීලක්ඛණස්ස, නදීල
ක්ෂණය තමා; විජ්ජමානත්තා, විද්‍යමානහෙයින්; යදි, ඉදින්; උදකු
ක්ඛෙපසීමා පි, උදකුක්ඛෙපසීමාතොමෝ ද; උප්පජ්ජෙය්‍ය ඉති, උප
දින්නේ යයි; වදන්ති, කියත් නම්; තං පි, ඒ කියමනද; න යුජ්ජති,
නො යෙදෙයි; තාසං ගාමොදකුක්ඛෙපානං, ඒගාමොදකුක්ඛෙපසී
මාවන්; විසභාගත්තා, විසභාගහෙයිනි; එසාසීමාච නාම, මේ සීමා
තොමෝ නම්; සම්මන්නිතා වා, සම්මත කරණලද්දී හෝ, සඤ්ජා
තාවා සවයඤ්ජාතවූවා හෝ; ඉතරං විසභාගසීමං, අනික් විෂභාගසී
මාවක්; ඵුසන්තී, ස්පර්ශකරන්නී (හෙවත්) ස්පර්ශකරමින්; කදාචි

උප්පජ්ජතෙ ච, ඉදම්පන කාරණං පාළිඅට්ඨකථාදිසු විවටං අපටිච්ඡන්නං පාකටතරං, තෙනෙවාහ සීමාලඞ්කාරසඞ්ගහෙ—

**පඨමං සම්මතං සීමං–සම්භින්දන්තෙන සම්මතා,**
**පච්ඡා සීමා අසීමා ති–පාළියා අනුලොමතො—**

**සබ්බාසම්පි සීමානං–පච්ඡා ජාතොපි සඞ්කරො,**
**අට්ඨකථාය මක්ඛාතො–වජ්ජනබ්බො ති තඤ්ඤුහී ති—**

ඉදම්පන කිඤ්චාපි පකරණවසෙන බද්ධසීමං නිස්සාය වුත්තං, තථා පි උපලක්ඛණවසෙන අබද්ධසීමානම්පි අට්ඨකථානයතො වුත්තන්ති දට්ඨබ්බං— විමතිවිනොදනියඤ්ච.

**පාළියම්පන නිදානවසෙන යෙසං භික්ඛවෙ සීමා පච්ඡා සම්මතා තෙසං තං කම්මං අධම්මිකන්ති** ආදිනා පච්ඡා සම්මතාය අසීමත්තෙන වුත්තෙ පි වීසු ගාමසීමාසු ඨත්වා වීහිසඞ්ඝෙහි සම්භෙදං වා අජ්ඣොත්ථරණං වා කත්වා සීමන්තරිකං අප්පෙත්වා වා රුක්ඛපාරො

---

කත්වා, කිසිකලෙක; න උප්පජ්ජතෙව, නූපදීමය; ඉදං කාරණමපන, මේ කාරණය වනාහි; පාළිඅට්ඨකථාදිසු, පෙළඅටුවාදියෙහි; විවටං, විවෘතය; අපටිච්ඡන්නං, ප්‍රතිච්ඡන්නරහිතය; පාකටතරං, ප්‍රකටතරය; තෙනෙව, එහෙයින්ම; "පඨමං සම්මතං සීමං— පෙ— වජ්ජනබ්බොති තඤ්ඤුහීති— පඨමං සම්මතං සීමං— පෙ— වජ්ජනබ්බොති තඤ්ඤුහී" යනු; සීමාලඞ්කාරසඞ්ගහෙ, සීමාලඞ්කාර සඞ්ග්‍රහයෙහි; ආහ, කීය. ඉදම්පන, මෙය වනාහි; කිඤ්චාපි, කිසිවිධියකින්; පකරණවසෙන, ප්‍රකරණවශයෙන්; (ප්‍රස්තාවවශයෙන්) බද්ධසීමං නිස්සාය, බද්ධසීමාව නිසා; වුත්තං, කියනලදී. තථා පි, එතාකුදු වුවත්; උපලක්ඛණවසෙන, උපලක්ෂණවශයෙන්; අබද්ධසීමානම්පි, අබද්ධසීමාවන්ගේද සඞ්කරය; අට්ඨකථානයතො, අට්ඨකථානයින්; වුත්තන්ති, කියනලදැයි; දට්ඨබ්බං, දතයුතුයි. විමතිවිනොදනියඤ්ච, විමතිවිනොදනියෙහිද; පාළියම්පන, පෙළෙහිවනාහි; නිදානවසෙන, නිදානවශයෙන්; (යෙසං භික්ඛවෙ සීමාපච්ඡා සම්මතා තෙසං තං කම්මං අධම්මිකන්ති, යෙසං භික්ඛවෙ සීමා— පෙ— අධම්මිකං,) යන; ආදිනා, මේ ආදියෙන්; පච්ඡා සම්මතාය, පසු සම්මත සීමාවගේ; අසීමත්තෙන, අසීමාබව; වුත්තෙ පි, කියනලදකල්හිද; වීසු ගාමසීමාසු, ගාමසීමාදෙකක; (ගාමො එව, ගාමසීමා තාසු ගාමසීමාසු,) ඨත්වා, සිට; වීහි සඞ්ඝෙහි, සඟකොටස් දෙකක්විසින්; සම්භෙදං වා, සම්භෙද දෝෂය හෝ, අජ්ඣොත්ථරණංවා, අජ්ඣොත්ථරණ දෝෂය හෝ; කත්වා, කොට; සීමන්තරිකං, සීමන්තරිකාය; අප්පෙත්වා වා, නොතබා හෝ; රුක්ඛපාරොහාදිසම්බන්ධං, රුක්අරළු

හාදිසම්බන්ධං අවියොජෙත්වා වා එකස්මිං ඛණෙ කම්මවාචානිට්ඨාපනවසෙන එකතො සම්මතානං ද්වින්නං සීමානම්පි අසීමතා පකාසිතාති වෙදිතබ්බා ති ආගතො, ඉමිනාපි ද්වින්නං විසභාගසීමානං එකසම්බන්ධවසෙන අසම්භවො යෙව වුත්තො.

අයං තෙසං පණ්ණරසමො දුබ්බිතක්කො.

පුන නදියං කරොන්තානං උදකුක්ඛෙපතො බහිරුක්ඛෙහි සම්බන්ධො අප්පමාණං ගාමසීමායං කරොන්තානං නදියං සම්බන්ධරුක්ඛස්ස උදකුක්ඛෙපතො බහි ඨිතභික්ඛූ අප්පමාණං තතො ඔරං පමාණන්ති ඉමස්ස ටීකාපාඨං සංහරිත්වා, එත්ථ හි නදියං කම්මං කරොන්තානං උදකුක්ඛෙපාරහට්ඨානතො බහි ජාතරුක්ඛෙහි ගාමසීමාසම්බන්ධො අප්පමාණං, ගාමසීමායං කරොන්තානං නදියා

---

ආදීන්ගේ සම්බන්ධය; අවියොජෙත්වා වා, වියෝනොකොට හෝ; එකස්මිං ඛණෙ, එකම ඇසිල්ලෙහි; කම්මවාචානිට්ඨාපනවසෙන, කම්වදන් නිමවීම්වශයෙන්; එකතො සම්මතානං, එකට සම්මතකරණලද්දවූ; ද්වින්නං සීමානම්පි, දෙසීමාවන්ගේද; අසීමතා, අසීමාබව, පකාසිතා ති, ප්‍රකාශකරණලද්දීය යනු; ආගතො, ආයේයි. ඉමිනාපි; මෙයින්ද; ද්වින්නං විසභාගසීමානං, විසභාගසීමාදෙදෙනාගේ; එකසම්බන්ධවසෙන, එකටමිශ්‍රවීම්වශයෙන්; අසම්භවො එව, හටනොගැණීම ම; වුත්තො, කියනලදී.

තෙසං ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; පණ්ණරසමොදුබ්බිතක්කො, පණ්ණරසම දුර්විතර්කයයි.

පුන, නැවතද; නදියං, නදියෙහි; කරොන්තානං, කම්කරන්නන්ට; උදකුක්ඛෙපතො, උදකුක්ඛෙපයෙන්; බහි රුක්ඛෙහි, පිට සිටි වෘක්ෂයන් හා; සම්බන්ධො, සම්බන්ධය; අප්පමාණං ප්‍රමාණනොවෙයි. ගාමසීමායං, ගාමසීමාවෙහි; කරොන්තානං, කරන්නන්ට; නදියං, නදියෙහි; සම්බන්ධරුක්ඛස්ස, සම්බන්ධරුකගේ (පැවැත්ම පමණ නොවේ; මෙහි, සම්බන්ධරුක්ඛස්ස, යනු අවයවසම්බන්ධසාමිවචනයි.)උදකුක්ඛෙපතො, උදකුක්ඛෙපයෙන්; බහිඨිතභික්ඛූ, පිටසිටිභික්ෂූහු; අප්පමාණං, ප්‍රමාණ නොවෙත්; තතො, එයින්; ඔරං, ඇතුළත (හෙවත් උදකුක්ඛෙපය තුළම සිටිභික්ෂූහු;) පමාණන්ති, ප්‍රමාණ; වෙත් යන; ඉමස්ස ටීකාපාඨං, මේ ටීකාපාඨය ද; සංහරිත්වා, ගෙණහැර දක්වා; එත්ථ හි, මෙහි වනාහි; නදියං, නදියෙහි; කම්මං කරොන්තානං, කම්ම කරන්නන්ට; උදකුක්ඛෙපාරහට්ඨානතො, උදකුක්ඛෙපයට සුදුසුතැනින්; බහි ජාතරුක්ඛෙහි, පිටත හටගත් වෘක්ෂයන් හා; ගාමසීමාසම්බන්ධො, ගාමසීමාසම්බන්ධය තෙම; අප්පමාණං, නො පමණියි; ගාමසීමායං, ගාමසීමායෙහි; කරොන්තානං, කරන්

සම්බන්ධරුක්ඛස්ස උදකුක්ඛෙපාරහට්ඨානතො බහි උදකතලෙ වා අට්ටාදිසු වා ඨිතභික්ඛූ අප්පමාණං අනෙනා උදකුක්ඛෙපෙ යෙව පමාණන්ති අධිප්පායත්ථං පරිදීපෙන්තා, ඉමිනා යථා වුත්තසීමාමාළකෙ කම්මං කරොන්තානං තස්ස සමන්තා උදකුක්ඛෙපස්ස අබ්භන්තරෙ පතිට්ඨිතසෙතුථම්භානං පරාපරං සංඝටිතානං යාව බහිතීරං ගාමක්ඛෙත්තෙන සම්බන්ධත්තා ගාමසීමාය සඞ්කරදෙස ජනනභාවො සිද්ධො යෙ වා ති වදන්ති, එත්ථ ච තෙසං තට්ටීකාපාඨස්ස අධිප්පායත්ථගහණං අවිපරීතං, තථා පි අනන්තරං වුත්තත්ථසංසන්දනං එත්ථ නෙව යුජ්ජති, කස්මා, ගාමතො ආගතස්ස සෙතුනොච අට්ටකස්ස ච දිස්සමානසම්බන්ධං විනා අවට්ඨානතො, අපි ච තෙන ටීකාපාඨෙන උප්පන්නාය සීමාය පච්ඡා සම්බන්ධො නයතො

---

නන්ට; නදියා, නදියෙහි; සම්බන්ධ රුක්ඛස්ස, සම්බන්ධ රුකගේ; (පැවැත්ම අප්පමාණං පමණ නොවෙයි.) උදකුක්ඛෙපාරහට්ඨානතො, උදකුක්ඛෙපයට සුදුසුතැනින්; බහි උදකතලෙ වා, පිට දියතලයෙහි හෝ; අට්ටාදිසු වා, අටළුආදියෙහි හෝ; ඨිතභික්ඛූ, සිටි භික්ෂූහු; අප්පමාණං, පමණ නොවෙත්; අනෙනා උදකුක්ඛෙපෙ යෙව, උදකුක්ඛෙපය තුළම සිටියාහු; පමාණන්ති, පමණ වෙත් යන; අධිප්පායත්ථං, අභි ප්‍රායාර්ථයක්; පරිදීපෙන්තා, ප්‍රකාශකරන්නාහු; ඉමිනා, මෙයින්; යථාවුත්ත සීමාමාලකෙ, යථෝක්ත සීමාමාළකයෙහි; කම්මං කරොන්තානං, කර්ම කරන්නන්ගේ; තස්ස, ඒ සීමාමාලක යාගේ; සමන්තා, හාත්පස්හි; උදකුක්ඛෙපස්ස, උදකුක්ඛෙපයාගේ; අබ්භන්තරෙ, ඇතළත; සං ඝටිතානං, ආඝාටනය කරණලද; පරාපරං, ඉදිරිපසුව; පතිට්ඨිතසෙතුථම්භානං, පිහිටිසෙතුස්තම්භයන්; යාව බහි තීරං, පිට ඉවුර දක්වා; ගාමක්ඛෙත්තෙන, ගම් කෙත හා; සම්බන්ධත්තා, සම්බන්ධවූ බැවින්; ගාමසීමාය, ගාමසීමායෙන් (ගාම සීමාව හා; සඞ්කරදෙසජනනභාවො, සංකරදෝෂය හටගන්නා බව; සිද්ධොයෙවාති, සිද්ධවේ යයි; වදන්ති, කියත්; එත්ථ ච, මෙහි ද; තෙසං, ඔවුන්ගේ; තට්ටීකාපාඨස්ස, ඒ ටීකාපාඨය සම්බන්ධ; අධිප්පායත්ථගහණං, අභි ප්‍රායාර්ථ ග්‍රහණය; (ගාහො-ගහණං, භාවයෙහි යු, ප්‍රත්‍යවූතැනියි) අවිපරීතං, අවිපරීතවෙයි; තථා පි, එතකුදු වුවත්; අනන්තරං, අනතුරුව; වුත්තත්ථසංසන්දනං, කියනලද අර්ථ සංසන්දනය; එත්ථ, මෙහි; නෙව යුජ්ජති, නොම යෙදෙයි. කස්මා, කුමක්හෙයින්ද යත්? ගාමතො ආගතස්ස, ගමින් (ගම පටන්) ආවාවූ; සෙතුනො ච, හෙයගේ ද; අට්ටකස්ස ච, අටල්ලගේ ද; දිස්සමානසම්බන්ධං විනා, දෘශ්‍යමාන සම්බන්ධයෙන් වෙන්ව; (දෘශ්‍යමාන සම්බන්ධය හැර); අවට්ඨානතො, පිහිටීම් හෙතුවිනි; අපි ච, වැලි දු; තෙන ටීකාපාඨෙන, ඒ ටීකාපාඨයෙන්; උප්පන්නාය, හටගත්තාවූ; සීමාය, සීමාවගේ; පච්ඡා සම්බන්ධො, පශ්චාත් සම්බන්ධයතෙමේ; නය

වුත්තො, න උප්පත්තික්ඛණෙ... යදි පන උප්පත්තික්ඛණං සන්ධාය වුත්තො, පාළිඅට්ඨකථාදීහි පි විරුජ්ඣති, තස්මිං යෙව පාඨාවසානෙ බද්ධසීමාය ඨිතභික්ඛූ පමාණන්ති වෙදිතබ්බම් ති වත්වා, තෙනෙව වුත්තං මහාසීමං සොධෙත්වා කම්මං කාතබ්බන්ති, ඉදං පන අට්ඨකථාවචනං අත්තනො වාදං පතිට්ඨාපෙතුං වුත්තං, තථා පි අට්ඨකථායම්පනිදං ඛණ්ඩසීමාමහාසීමානං පච්ඡාජාතසම්බන්ධදෙසං නිස්සාය වුත්තං, න හි සීමානං උප්පත්තික්ඛණෙ, අය මෙත්ථ අට්ඨකථාපාඨො, සීමාමාළකෙ වටරුක්ඛො හොති තස්ස සාඛා වා තතො නිග්ගතපාරොහො වා මහාසීමාය පථවිතලං වා තත්ථ ජාතරුක්ඛාදීනි වා ආහච්ච තිට්ඨති මහාසීමං සොධෙත්වාව කම්මං කාතබ්බං තෙ වා සාඛාපාරොහා ඡින්දිත්වා බහිට්ඨකා කාතබ්බාති, එවං පුබ්බෙ සුට්ඨු සම්මන්නිතානං ද්වින්නං බද්ධසීමානං පච්ඡා සම්බන්ධො අට්ඨක

---

තො, නයවශයෙන්; වුත්තො, කියනලදී; උප්පත්තික්ඛණෙ, උත්පත්ති ක්ෂණයෙහි; න (වුත්තො) නො කියනලදී. යදි පන, ඉදින් වනාහි; උප්පත්තික්ඛණං සන්ධාය, උත්පත්තික්ෂණය සඳහා; වුත්තො, කියන ලද නම්; පාළිඅට්ඨකථාදීහි පි, පෙළඅටුවාදීන් සමග ද; විරුජ්ඣති, විරුද්ධවෙයි. තස්මිං යෙව පාඨාවසානෙ, එම පාඨයාගේ නිගමන යෙහි; බද්ධසීමාය, බද්සිම්හි; ඨිතභික්ඛූ, සිටිභික්ෂූහු; පමාණන්ති, ප්‍රමාණයයි; වෙදිතබ්බං ඉති, දතයුතුය යනු; වත්වා, කියා; තෙනෙව, එයින්ම; මහාසීමං සොධෙත්වා කම්මං කාතබ්බන්ති, මහාසීමං සො ධෙත්වා කම්මං කාතබ්බං, යනු" වුත්තං, කියනලදී. ඉදං අට්ඨකථා වචනං පන, මේ අටුවාවෙහි කීම නම්; අත්තනොවාදං, තමවාදය; පතිට්ඨාපෙතුං, පිහිටුවන්ට; වුත්තං, කියනලදී. තථා පි, එසේද වුවත්; අට්ඨකථායම්පන, අටුවාවෙහි වනාහි; ඛණ්ඩසීමාමහාසීමානං ඛණ්ඩසීමා මහාසීමාවන්ගේ; ඉදං පච්ඡා ජාතසම්බන්ධදෙසං, මේ පසුව හටගත් මිශ්‍රක දෙශය; නිස්සාය, නිසා; වුත්තං, කියනලදී. සීමානං, සීමාවන්ගේ; උප්පත්තික්ඛණෙ, උත්පත්තික්ෂණයෙහි; නහි (වුත්තං) නොම කියනලදී. එත්ථ, මෙහි; (සීමාමාළකෙ වටරුක්ඛො හොති තස්ස සාඛාවා තතො නිග්ගතපාරොහො වා මහාසීමාය පථවිතලං වා තත්ථ ජාතරුක්ඛාදීනි වා ආහච්ච තිට්ඨති මහාසීමං සොධෙත්වාව කම්මං කාතබ්බං තෙ වා සාඛාපාරොහා ඡින්දිත්වා බහි ට්ඨකා කාතබ්බාති, "සීමාමාළකෙ වටරුක්ඛො හොති"...පෙ..."බහි ට්ඨකා කාතබ්බා යනු" අයං අට්ඨකථාපාඨො, මේ අටුවාපාඨයයි; (අත්‍ර පෙරසේමැයි) එවං, මෙසේ; පුබ්බෙ, පෙර; සුට්ඨු සම්මන්නි තානං, මොනවට සම්මතකරණලද; ද්වින්නං බද්ධසීමානං, බද්ධසීමා දෙදෙනාගේ; පච්ඡා සම්බන්ධො පශ්චාත් සම්බන්ධය; අට්ඨකථායං,

ථායං පටික්ඛිත්තා යදි පන අත්තනො උප්පත්තිකාලෙ යො කොචි සම්බන්ධො සියා තාසං අඤ්ඤමඤ්ඤවිසභාගත්තා නෙව ජායති, එවං ඉතරාසම්පි විසභාගසීමානං අයං නයො දට්ඨබ්බො.

අයං තෙසං සොළසමො දුබ්බිතක්කො.

වජිරබුද්ධිටීකායම්පන සීමාකථායං අත්තනො මතිවසෙන තත්ථ තත්ථ වුත්තං ගහෙතබ්බම්පි පරි වජ්ජනීයම්පි දිස්සති, තෙනෙව තට්ටීකායං සීමාලක්ඛණවණ්ණනාපරියොසානෙ, ඉදං සබ්බං සුට්ඨු විචාරෙත්වා ගරුකුලෙ පයුරුපාසිත්වා ගහෙතබ්බයුත්තකං ගහෙතබ්බං ඉතරං ඡඩ්ඩෙතබ්බන්ති වුත්තං.

සමත්තා චායං එකච්චවාද නිසෙධදීපනී.

අථඤ්ඤෙ ථෙරා, එසාව සීමා නාම සභාගසීමා විසභාගසීමා චාති දුවිධාච්චාදිනා සභාගවිසභාගසීමායො ච, තාසු සභාග

---

අටුවායෙහි; පටික්ඛිත්තා, ප්‍රතික්ෂෙප කරණලදී. යදි පන, ඉදින් වනාහි; අත්තනො, තමන්ගේ; උප්පත්තිකාලෙ, උත්පත්තිකාලයෙහි; යො කො චි, යම් කිසි; සම්බන්ධො සියා, සම්බන්ධයක් වේද; තාසං, ඔවුන්; අඤ්ඤමඤ්ඤවිසභාගතො, අන්‍යොන්‍ය විසභාග බැවින්' නෙව ජායති, නොම හටගණීසි. එවං, මෙසේ ම; ඉතරාසං අපි; අනිකුදු; විසභාගසීමානං, විසභාගසීමාවන්ගේ; අයං නයො, මේ ක්‍රමයතෙම; දට්ඨබ්බො, දතයුතුයි.

තෙසං, ඒ ස්ථවිරවරුන්ගේ; අයං, මේ; සොළසමො දුබ්බිතක්කො, සොළොස්වැනි දුර්විතර්කයයි.

වජිරබුද්ධිටීකායම්පන, වජිරබුද්ධිටීකාවෙහි වනාහි; සීමාකථායං, සීමාකථාවෙහි; අත්තනො මතිවසෙන, තම අදහස්පරිද්දෙන්; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; ගහෙතබ්බම්පි, ගතයුතුවූද; පරි වජ්ජනීයම්පි, බැහැරකටයුතුවූද අර්ථය; දිස්සති, දක්නාලැබෙයි; වුත්තං, කියන ලදී. තෙනෙව, එහෙයින්ම; තට්ටීකායං, එම ටීකායෙහි; සීමාලක්ඛණවණ්ණනා පරි යොසානෙ, සීමාලක්ෂණවර්ණනා නිගමනයෙහි; ඉදං සබ්බං, මේ සියල්ල; සුට්ඨු විචාරෙත්වා, මොනවට විචාරණය කොට; ගරුකුලෙ, ගුරුකුලයන්; පයුරුපාසිත්වා, පර්‍යුපාසණය කොට; ගහෙතබ්බයුත්තකං, ගතයුත්තට සුදුසුවූ අදහස; ගහෙතබ්බං, ගතයුතුය. ඉතරං, අනික් (නුසුදුසු) අර්ථය; ඡඩ්ඩෙතබ්බන්ති, හළයුතුයයි; වුත්තං, කියනලදී.

අයං, මේ; එකච්චවාද නිසෙධ දීපනී, ඇතම් වාදනිෂෙධදීපනී තොමෝ; සමත්තා ච, සමාප්තකරණලදු.

අථ, වැලිදු; අඤ්ඤෙථෙරා, අන්‍යස්ථවිරහු; එසා සීමාව නාම, මේ සීමාතොමෝ වනාහි; සභාගසීමාවිසභාගසීමාචාති, සභාගසීමා විසභාගසීමාදැයි කියා; දුවිධාඉති, දෙපරිද්දකින් වේයයි; ආදිනා, මේ ආදියෙන්; සභාගවිසභාගසීමායොච, සභාගවිසභාගසීමාවෝද

සීමාසු රුක්ඛලතාරජ්ජුසෙතුකට්ඨාදීහි සම්බන්ධෙ සති දෙසො නත්ථීච්චාදිනා දෙසාභාවස්සෙව දෙසභාවස්ස සාමඤ්ඤතො දීපෙන්තා විසෙසතො පන ගාමොදකුක්ඛෙපසීමානං සම්භෙදං නිස්සාය අට්ඨකථාටීකාසු ආගතං තං තං වාක්‍යඤ්ච ආහරිත්වා කාරණං වදන්ති, තස්ස පන කත්ථ චි සදිසත්තම්පි දිස්සති කත්ථ චි විසදිසත්තම්පි......තෙ පන ථෙරා, ඉමස්මිං පන කාලෙ කිස්මිං චි පදෙසෙ කෙ චි ජනා භික්ඛූනං නදීජාතස්සරෙසු කම්මකරණත්ථාය අට්ටකං කරොන්ති තං අට්ටකං ගමනත්ථාය ගාමක්ඛෙත්තෙකසම්බන්ධං කට්ඨමයම්පි වෙළුමයම්පි සෙතුං කරොන්ති, සො සෙතු තස්ස අට්ටකස්ස සමන්තා උදකුක්ඛෙපාරහට්ඨානස්ස අබ්භන්තරං පවිසිත්වා අට්ටකං අනාහච්ච තිට්ඨති, තාදිසෙ අට්ටකෙ නිසීදිත්වා භික්ඛූ කම්මං කරොන්ති, කෙ චි පන භික්ඛූ ගාමක්ඛෙත්තෙන සම්බන්ධස්ස උළු

---

ප්‍රකාශකරණලදහ. තාසු සභාගසීමාසු, ඒ සභාගසීමාවන්හි; රුක්ඛලතා රජ්ජු සෙතුකට්ඨාදීහි, රුක්වැල් රැහැන් හේදූවාදීන් හා සම්බන්ධෙ සති, සම්බන්ධය ඇතිකල්හි; දෙසො නත්ථි ති, දෙසක් නැත්තේය කියා; ආදිනා, මේ ආදියෙන්; දෙසාභාවස්සෙව, දෙස් නැති බවද; දෙසභාවස්ස, දෙස් බවද; සාමඤ්ඤතො, සාමාන්‍යයෙන්; දීපෙන්තා, පැහැදිලිකරන්තාහු; විසෙසතො පන, විශෙෂයෙන් වනාහි; ගාමොදකුක්ඛෙපානං, ගාමොදකුක්ඛෙප සීමාවන්ගේ; සම්භෙදං නිස්සාය, මිශ්‍රක දෝෂය නිසා; අට්ඨකථාටීකාසු, අටුවා ටීකාවන්හි; ආගතං, ආවාවූ; තං තං වාක්‍යඤ්ච, ඒ ඒ වාක්‍යද; ආහරිත්වා, ගෙණහැරදක්වා; කාරණං වදන්ති, කරුණු කියත්. තස්ස පන, ඒ වාක්‍යසම්බන්ධ; කත්ථ චි, කිසි තැනෙක්හි; සදිසත්තම්පි, සමානබවක් ද; කත්ථ චි, කිසි තැනෙක්හි; විසදිසත්තම්පි, අසමාන බවක් ද; දිස්සති, දක්නාලැබෙයි.......තෙ පන ථෙරා, ඒ තෙරහු වනාහි; ඉමස්මිං පන කාලෙ, මේ කාලයෙහි වනාහි; කිස්මිං චි, පදෙසෙ, කිසි පෙදෙසෙක්හි; කෙ චි ජනා, කිසි ජනකෙනෙක්; භික්ඛූනං, භික්ෂූන්ට; නදීජාතස්සරෙසු, නදීජාතස්සරයන්හි; කම්මකරණත්ථාය, කම්මකිරීම පිණිස; අට්ටකං කරොන්ති, අටල්ලක් කෙරෙත් ද; තං අට්ටකං, ඒ අටල්ලට; ගමනත්ථාය, ගමණය පිණිස; ගාමක්ඛෙත්තෙකසම්බන්ධං, ගම් කෙත හා එකට සම්බන්ධවූ; කට්ඨමයම්පි, දැවමුවාවූද; වෙළුමයම්පි, හුණමුවාවූද; සෙතුං, හෙය; කරොන්ති, කරත්. සෙතු, ඒ හෙයතෙම; තස්ස අට්ටකස්ස, ඒ අටල්ලගේ සමන්තා, හාත්පස්හි; උදකුක්ඛෙපාරහට්ඨානස්ස, උදකුක්ඛෙපයට සුදුසු ස්ථානයාගේ; අබ්භන්තරං, ඇතුළට; පවිසිත්වා, ප්‍රවිෂ්ටව; අට්ටකං අනාහච්ච, අටල්ලට නොහැපී; තිට්ඨති, සිටීද; තාදිසෙ අට්ටකෙ, එබඳු අටල්ලෙහි; නිසීදිත්වා, හිඳ; භික්ඛූ, භික්ෂූහු; කම්මං කරොන්ති, කම්ම කරත්; කෙචි පන භික්ඛූ, ඇතම් භික්ෂූහු;

මපස්ස වා නාවාය වා සමීපෙ උදකුක්ඛෙපාරහට්ඨානස්ස අප්පහොණකට්ඨානෙ අරිත්තෙන නාවං ඨපෙත්වා නාවායං ඨත්වා කම්මං කරොන්ති තෙසං භික්ඛූනං කම්මං කුප්පති, කස්මා? කට්ඨමයවෙළුමයසෙතුනඤ්ච උළුම්පනාවානඤ්ච රුක්ඛසාඛා ලතාරජ්ජුපාරොහෙහි සදිසත්තාති වදන්ති …… එත්ථ පන උදකුක්ඛෙපාරහට්ඨානං නාම යං උදකුක්ඛෙපෙන පරිච්ඡින්දිතබ්බං තං අත්තනො ඛෙත්තභූතං ඨානං, න හි ගාමසම්බන්ධසෙතු උළුම්පාදයො, සෙතුනො අනාහච්ච ඨානවචනෙන අට්ටකස්ස ච සෙතුස්ස ච අන්තරා කප්පියභූමි සංවිජ්ජති, තස්මා තං සෙතුං බහි කත්වා සකෙ ඛෙත්තෙ උදකුක්ඛෙප සීමා සඤ්ජායති, තතො තස්මිං අට්ටකෙ කම්මං කරොන්තානං භික්ඛූනං කම්මකොපො න භවෙය්‍යාති ගහෙතබ්බං, සචෙ සෙතු

---

ගාමක්ඛෙත්තෙන, ගම් කෙත හා; සම්බන්ධස්ස, සම්බන්ධවූ; උළුම්පස්සවා, පසුරගේ හෝ; නාවාය වා, නැවගේ හෝ; සමීපෙ, සමීපයෙහි; උදකුක්ඛෙපාරහට්ඨානස්ස, උදකුක්ඛෙපයට සුදුසු ස්ථානයට; අප්පහොණකට්ඨානෙ, නොපොහොණා තන්හි; අරිත්තෙන, පළුපතින්; (රිටෙන්) නාවං, නැව; ඨපෙත්වා, තබත්වා; නාවායං, නැවෙහි; ඨත්වා, සිට; කම්මං කරොන්ති, කම්කරත්. තෙසං භික්ඛූනං, ඒ භික්ෂූන්ගේ; කම්මං කුප්පති, කර්මය කිපෙයි. කස්මා, කුමක්හෙයින්ද යත්? කට්ඨමය වෙළුමය සෙතුනඤ්ච, දඬුමුවා හුණමුවා සෙතුන්ගේද; උළුම්පනාවානඤ්ච, පසුරුනෞකාවන්ගේද; රුක්ඛසාඛා ලතාරජ්ජුපාරොහෙහි, රුක්අතු ලිය රැහැන් අරළු හා; සදිසත්තාති, සමානහෙයිනැයි; වදන්ති, කියත් …… එත්ථ පන, මෙහි වනාහි; උදකුක්ඛෙපාරහට්ඨානං නාම, උදකුක්ඛෙපයට සුදුසු තැන නම්; යං, යම්තැනක්; උදකුක්ඛෙපෙන, දියනගා දැමීමෙන්; පරිච්ඡින්දිතබ්බං, පිරි සිඳියයුතුද; තං, ඒ ස්ථානය; අත්තනො, තමාගේ; ඛෙත්තභූතං, ක්ෂෙත්‍රයවූ; ඨානං, තැනවේ; ගාමසම්බන්ධසෙතු උළුම්පාදයො, ගමසම්බන්ධ හේපසුරු ආදීහු; න හි, උදකුක්ඛෙපසීමාවට ක්ෂෙත්‍රය නො වේමය; (හි, යනු අවධාරණයෙහිය) සෙතුනො හෙයගේ; අනාහච්චඨානවචනෙන, නොහැණී සිටීම කීහෙයින්; අට්ටකස්සච, අටල්ලගේද; සෙතුස්ස ච, හෙයගේ ද; අන්තරා, අතර; කප්පියභූමි, කැපභූමිතොමෝ; සං විජ්ජති, පවතියි. තස්මා, එහෙසින්; තං සෙතුං, ඒ හෙය; බහි කත්වා, බැහැර කොට; සකෙ ඛෙත්තෙ, ස්වකීය ක්ෂෙත්‍රයෙහි; උදකුක්ඛෙපසීමා, උදකුක්ඛෙපසීමා තොමෝ; සඤ්ජායති, හටගණියි. තතො, එහෙයින්; තස්මිං අට්ටකෙ, ඒ අටල්ලෙහි; කම්මං කරොන්තානං, කම්කරන්නාවූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; කම්මකොපො, කර්මකොප්‍යතෙම; නභවෙය්‍ය ඉති, නොවන්නේ යයි; ගහෙතබ්බං, ගතයුතුයි. (මෙහි නභවෙය්‍ය, යනු සම්භාවනාගතාර්ථයෙහි සප්තමී ප්‍රයොගයි). සචෙ,

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු